# ස්වාධීන වාර්තාකරණ යාන්ත්‍රණය (IRM): ශ්‍රී ලංකා ප්‍රගතිවාර්තාව 2016 - 2018

අනොක් ද සොයිසා, ස්වාධීන පර්යේෂක

## අන්තර්ගතය


දළ විශ්ලේෂණය : ශ්‍රී ලංකාව 2
හැඳින්වීම Error! Bookmark not defined.
වගකීම ක්‍රියාත්මක කිරීම Error! Bookmark not defined.
I වන තේමාව 1 : සෞඛ්‍ය Error! Bookmark not defined.
1. නිදන්ගත වකුගඩු රෝගය මර්දනය කිරීමේ ක්‍රමෝපායන් සඳහා මහජන සහභාගිත්වය (Public Access to Strategies to Combat Chronic Kidney Disease) 9
2. ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ (Safe and Affordable Medicines) 13
3. ජාතික සෞඛ්‍ය කාර්ය සාධනය (National Health Performance) 17
2 වන තේමාව : අධ්‍යාපනය (EDUCATION) Error! Bookmark not defined.
4. ගුරුවරුන් බඳවා ගැනීමේ විනිවිදභාවයකින් යුත් ප්‍රතිපත්තිය (Transparent Teacher Recruitment Policy) 21
3 වන තේමාව : තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (Information and Coomunication Techknowlogy ) 24
5. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (Government Information Centre) 24
6. විවෘත දත්ත ප්‍රවර්ධනය (Promote Open Data) 28
4 වන තේමාව : පරිසරය (ENVIRONMENT) Error! Bookmark not defined.
7. ජාතික පාරිසරික පනතේ සංශෝධන (National Environmental Act Amendments) 32
8. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ සංශෝධන (Coast Conservation and Coastal Resources Management Act Amendments) 37
9. වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ප්‍රඥාප්තියේ සංශෝධන (Fauna and Flora Protection Ordinance and North Western Province Environmental Statute Amendments) 41
5 වන තේමාව : පළාත් පාලනය (LOCAL GOVERNMENT ) 45
10. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (Procurement System for Local Authorities) 45
11. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම(Implementation and Monitoring of Local Authority Procurement System) 49
6 වන තේමාව : කාන්තාව (WOMEN) 52
12. පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය (Personal Law Reforms) 52
13. රාජ්‍ය ඉඩම් බෙදාදීමේ දි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව (Gender Equality in State Land Distribution) 56
14. රැකියාව තුළ වෙනස් කොට නොසැලකීම (Non-Discrimination in Employment) 60
7 වන තේමාව : දේශපාලනය තුළ කාන්තාව (WOMEN IN POLITICAL GOVERNANCE **64**
15. ප්‍රාදේශීය දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය (Women's Political Participation at the Local Level ) 64
8 වන තේමාව : දූෂණය (CORRUPTION) 69
16. දූෂණයට එරෙහි වැඩපිළිවෙල තුළ මහජන සහභාගිත්වය (Public Participation in Anti-Corruption Framework) 69
17. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ වගකීම් සහ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම (Implementation of UNCAC Obligations and Constitutional Reform) 74
18. දූෂණයට එරෙහි ආයතන අතර සම්බන්ධීකරණය (Coordination among Anti-Corruption Agencies) 77
19. දූෂණ සහ මුදල් විශුද්ධීකරණය (Corruption and Money Laundering) 80
20. දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහා මුදල් යෙදවීම නියාමනය (Regulation of Political Campaign Financing) 83
21. වත්කම් ප්‍රකාශ බෙදාහැරීම (Disseminate Asset Declarations) 86
9 වන තේමාව : තොරතුරු දැනගැනීමේ අයිතිය (RIGHT TO INFORMATION) 89
22. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම (Enactment and Implementation of the RTI Act) 89
23. ඉල්ලීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම (Proactive Disclosure) 96
ක්‍රමවේදය පිළිබඳ තොරතුරු Methodological Note 99

Open Government Partnership

# දළ විශ්ලේෂණය : ශ්‍රී ලංකාව

ස්ත්‍රී පුරුෂ සමාජභාවය, දූෂණයට එරෙහිවීම සහ තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ඇතුළු පුළුල් පරාසයක් තුළ විහිදුන විෂය පථයන් ආවරණය කරන ශ්‍රී ලංකාවේ ප්‍රථම ක්‍රියාකාරී සැලැස්ම මෙයයි. මධ්‍ය කාලසීමාවේ දී සිදුකරන ලද ඇගයීමේ දී ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් නොකළ අතර තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත නීතිගත කිරීමෙන් විවෘත පාලනය තුළ විශාල බලපෑමක් කරන්නට හැකිවිය. ක්‍රියාත්මක කරන අතරතුර බහු පාර්ශවකරුවන්වන්ගේ සංසංදය විසින් අඛණ්ඩව පවත්වන ලද රැස්වීම්, වඩාත් හොඳ ප්‍රතිඵලයක් අත්පත් කරගන්නට වන්නට ඇත:

## ස්වාධීන වාර්තාකරණ යාන්ත්‍රණය (IRM)ශ්‍රී ලංකා ප්‍රගතිවාර්තාව 2016 - 2018

විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම, පුරවැසියන් බලගැන්වීම,දූෂණයට එරෙහිව කටයුතු කිරීම, පාලනය ශක්තිමත් කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීම යන කාරණා සම්බන්ධයෙන් පුරවැසියන් කෙරේ රජයේ වගකීම සහතික කරන ජාත්‍යන්තර ස්වේච්ඡ වැඩපිළිවෙලක් ලෙස විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය හැඳින්විය හැක.ස්වාධීන වාර්තාකරණ යාන්ත්‍රණය විසින් විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයෙහි සියලුම සහභාගිත්ව සාමාජික රාජ්‍යයන් විසින් සිදුකරන ක්‍රියාකාරකම්වල ඇගයීමක් සිදුකරනු ලැබේ. 2017 ජූලි මස සිට 2018 වසරේ ජූලි මස දක්වා වූ දෙවෙනි වසරේ ක්‍රියාකාරකම්හි ප්‍රතිඵල මෙම වාර්තාව තුළ සාරාංශගත කර ඇති අතර 2018 වසරේ අගෝස්තු වනවිට සිදුවූ ඇතැම් අදාළ සංවර්ධනයන් ද එයට ඇතුළත් කර ඇත.

ආරම්භයේ දී මෙය අධිකරණ අමාත්‍යාංශය යටතේ ස්ථානගත කර තිබුණ අතර, 2016 වසරේ දී විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව ඒකකය පිහිටවීම තුළින් එහි කටයුතු මෙහෙයවීමේ සහ සම්බන්ධීකරණ කිරීමේ මූලික වගකීම විදේශ කටයුතු අමාත්‍යාංශය යටතට ගන්නා ලදි.ක්‍රියාකාරී සැලැස්ම ගොඩනගන අතරතුර එහි ඇතුළත් විය යුතු තේමාවන් කවරේ ද යන්න හඳුනාගැනීමට විදේශ කටයුතු අමාත්‍යාංශය සිවිල් සංවිධාන සමඟ එක්ව දීපව්‍යාප්ත අදහස් විමසීමේ සැසි 10 ක් පවත්වන ලදි.

විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව ක්‍රියාවලියට සම්බන්ධ රාජ්‍ය ආයතන සංඛ්‍යාව වර්ධනය කරගැනීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩලය විසින් 2016 වසරේ දි ජාතික මෙහෙයුම් කමිටුව ස්ථාපනය කොට ඒ හා අදාළ නිලධාරී මණ්ඩලය පත් කරන ලදි.ප්‍රධාන රාජ්‍ය සහ සිවිල් සංවිධාන පාර්ශකරුවන්ගෙන් එය සමන්විත වූ අතර එහි සභාපතිත්වය ශ්‍රී ලංකා ජනාධිපති විසින් දරන ලදි. ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය ජාතික මෙහෙයුම් කමිටුව වෙත පවරා තිබුණි. කෙසේ වෙතත් එවැනි ඉහළ පෙළේ නිලධාරී කණ්ඩායමක් නිරන්තරයෙන් කැඳවීම අභියෝගයක් බව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් හඳුනාගන්නා ලදි.

එමනිසා ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගත් ප්‍රධාන රාජ්‍ය ආයතන තමන්ට අදාළ වගකීම් ක්‍රියාත්මක කිරීම සහතික වීමේ මූලික වගකීම භාරගන්නා ලදි.
මෙම ආයතනවල නියෝජිතයන්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව ඒකකය සහ සිවිල් සංවිධාන හා එක්ව ක්‍රියාකාරී සැලැස්ම නියාමනය කිරීම සඳහා බහු පාර්ශවකරුවන්ගේ සංසදය පිහිටුවන ලදි.

කෙසේ නමුත් මෙම සංසදය නිති මුණගැසුණු අතර මේ තුළ පුරවැසි සහභාගිත්වයක් ද දක්නට නොවීය.සංසදයේ ක්‍රියාපටිපාටිය රහසිගත එකක් නොවන බව විදේශ කටයුතු අමාත්‍යාංශය තහවුරු කළ නමුත් රැස්වීම්හි සාකච්ඡා කරන ලද කරුණු කිසිවක ප්‍රසිද්ධියට පත් නොකරන ලදි. එමෙන්ම ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ප්‍රධාන පාර්ශවකරුවන් හැරුණු කොට පුළුල් සහභාගිත්වයක් සඳහා ද විවෘත ආරාධනාවක් සිදු නොවීය[1] විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ වැඩසටහන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය 2018 වසරේ දී ජනාධිපති ලේකම් කාර්යාලය විසින් භාරගන්නා ලදි.

සෞඛ්‍ය සහ පරිසරය යන අංශයන්ගේ සිට වංචා දූෂණ සහ තොරතුරු දැනගැනීමේ අයිතිය දක්වා වූ විවිධ පරාශයකින් යුත් ක්ෂේත්‍රවලට අයත් වගකීම් ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලදි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත රජය සම්මත කළ අතර බොහෝ ක්‍රියාකාරකම් යම් ප්‍රමාණයකට අවසන් කර තිබිණ. ක්‍රියාත්මක කිරීමේ පළමු වසර අවසානයේ දි වාර්තාව සඳහා අවශ්‍ය තොරතුරු එකතු කර ඇති බව විදේශ කටයුතු අමාත්‍යාංශය තහවුරු කළ නමුත් 2018 සැප්තැම්බර් වනවිටත් රජය මධ්‍යකාලීන හෝ අවසන් ස්වයං ඇගයුම් වාර්තාව ප්‍රකාශයට පත්කර නොතිබුණ. කෙසේ නමුත් ඒ වනවිටත් විදේශ කටයුතු අමාත්‍යංශය විසින් මේ වාර්තාව සඳහා අදාළ සියලු තොරතුරු එකතු කර තිබුණි.

මෙම වාර්තාව පිළියෙල කරන අතරතුරත් 2018 - 2020 දක්වා වූ කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ නව ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත්කර හෝ ප්‍රකාශයට පත්කර නොතිබුණි. කෙසේ නමුත් ජනාධිපති ලේකම් කාර්යාලය,සිවිල් සංවිධාන හා සහයෝගිත්වයෙන් ඊළඟ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම සඳහා ගැටළු හඳුනාගැනීමට මහජන අදහස් විමසීම් 9 ක් සහ ඉන්පසු බහුපාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ වැඩමුළු කිහිපයක් පවත්වා ඇත.මෙම අදහස් විමසීම් පළාත් 9 තුළම සිදුකර ඇත.

| 1 වන වගුව : සංක්ෂිප්තය | | |
|---|---|---|
| | *මධ්‍ය කාලසීමාව* | *කාලය අවසන් වූ පසු* |
| වගකීම් සංඛ්‍යාව | 23 | |
| ***අවසන් කිරීමේ මට්ටම*** | | |
| සම්පූර්ණ කර ඇත | 0 | 0 |
| සැලකිය යුතු | 1 | 2 |
| සීමාසහිත | 18 | 17 |
| ආරම්භ කර නැති | 4 | 4 |
| ***පහත සඳහන් කාර්යන් හා අදාළ වගකීම් සංඛ්‍යාව*** | | |
| විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන් හා පැහැදිලිවම අදාළ වූ | 22 | 22 |
| පරිවර්තනීය බලපෑම | 1 | 1 |
| සැලකිය යුතු හෝ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ | 1 | 2 |
| ***කරුණු තුනටම අයත් (✪)*** | 0 | 1 |
| ***එය විවෘත රාජ්‍යයක්ද ?*** | | |
| *විශාල* | 1 | |
| | | |
| | | |
| | | |
| *කැපී පෙනෙන* | 0 | |
| ***ඉදිරියට ගමන් කිරීම*** | | |
| ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන ගිය වගකීම් සංඛ්‍යාව | නැත | |

**ක්‍රියාත්මක කරන අතරතුර සිවිල් සංවිධාන සමඟ අදහස් විමසීම්**

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ සමාජික රටවල් තමන්ගේ රට සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේදි සහ ක්‍රියාත්මක කරන අතරතුර අදහස් විමසීම සඳහා ක්‍රියාවලියක් අනුගමනය කරයි. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරන අතරතුර සිවිල් සංවිධාන සමඟ සිදුකරන ලද අදහස් විමසීම් වාර්තාවේ පහත සඳහන් අංශ තුළින් සාකච්ඡා කළ අතර එය ගොඩනගන අවස්ථාවේ දි සිදුකරන ලද සාකච්ඡා 2016 - 2017 IRM ප්‍රගති වාර්තාවේ වඩාත් සවිස්තරව ඇතුලත් කොට ඇත.

ක්‍රියාත්මක කරන අතරතුර සිදුකරන ලද අදහස් විමසීම් බෙහෝවිට විදේශ කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ සිදුවන කේන්ද්‍රීය ක්‍රියාවලියක් විය. 2017 වසර ආරම්භයේ දි ක්‍රියාකාරී සැලැස්මේ කාර්යන් නියාමනය කිරීම සඳහා විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් බහුපාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවන ලදි.

ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරණ රාජ්‍ය ආයතන, සිවිල් සංවිධාන සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය සඳහා ස්ථාපිත කර ඇති ඒකකයේ නියෝජිතයන් මෙම ක්‍රියාකාරී කණ්ඩායමට ඇතුළත් විය. ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සෘජුවම සම්බන්ධවන පාර්ශවකරුවන් පමණක් ක්‍රියාකාරී කණ්ඩායමට ඇතුළත් විය. කණ්ඩායම වසරකට දෙවතාවක් එනම් 2017 වසරේ අප්‍රේල් සහ අගෝස්තු යන මාසවලදි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දි මුණගැසී ඇත. මුණුගැසීමේ වාර ගණනනේ අඩුවක් පෙනෙන්ට ඇති අතර අවම වශයෙන් එම කණ්ඩායම කාර්තුමය වශයෙන් රැස්විය යුතුව තිබුණි.

මෙම සෑම අදහස් විමසීමකදීම ප්‍රධාන රාජ්‍ය ආයතන විසින් කෙටි ඉදිරිපත් කිරීමක් තුළින් සෑම වගකීමකම ප්‍රගතිය වාර්තා කර ඇත. ඉන්පසු,වාර්තා කරන ලද ප්‍රගතිය සම්බන්ධයෙන් අදාළ ප්‍රතිචාර දැක්වීමට සහ ඒ සම්බන්ධයෙන් පවතින ප්‍රශ්න සහ ගැටළු පිළිබඳ විමසීමට සිවිල් සංවිධාන නියෝජිතයන්ට අවස්ථාව ලබා දි ඇත. මෙම නිළ ක්‍රියාපටිපාටිය හැරුණ කොට ක්‍රියාකාරිත්වය හෝ සහභාගිත්වය සම්බන්ධයෙන් වෙනත් විධිමත් නීතිරීති සංසදය සතුව නොවීය. ක්‍රියාපටිපාටිය තුල රහස්‍යභාවයක් නොමැති බව විදේශ කටයුතු අමාත්‍යාංශය සනාථ කර ඇති නමුත් සාකච්ඡා කරන ලද කරුණු ප්‍රසිද්ධියට පත් කිරීමක් හෝ පුළුල් මහජන සහභාගිත්වයක් සඳහා විවෘත ආරාධනාවක් ද සිදුකර නොමැත.

සිවිල් සංවිධාන නියෝජිතයකුට අනුව ක්‍රියාකාරී සංසදය වගවීම සහතිකවීම සඳහා උපකාරවන සුවිශේෂී මෙන්ම ඉතා ප්‍රයෝජනවත් වේදිකාවකි. එමෙන්ම එම සංසදය රජය සහ සිවිල් සමාජ නියෝජිතයන් අතර ඇති අදහස් සාකච්ඡා කිරීමට සහ ඒවා එකිනෙකා අතර හුවමාරු කරගැනීමට අවස්ථාව සලසා දේ. එසේ වන නමුත් මෙම සංසදය තවමත් ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා නැත. විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ වූ විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව වැඩසටහනේ නායකත්වය 2018 වසරේ දි ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවරාගෙන ඇත. මෙම පවරුම සිදුවූයේ ක්‍රියාකාරී සැලැස්මේ අවසන් අදියරේ දී බැවින් ඉන්පසු විධිමත් අදහස් විමසීමක් තවමත් සිදුවී නැත.

ක්‍රියාකාරී සැලැස්ම නිසියාකාරව ක්‍රියාත්මක කරනවා ද යන්න සොයා බැලීම සඳහා සිවිල් සංවිධාන විසින් ද අවිධිමත් සංසදයක් පිහිටුවන ලදි. 2016 ආරම්භයේ දි මෙම සංසදය ප්‍රථමයෙන් කැඳවන ලද අතර විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය සහ සිවිල් සමාජ සංවිධාන මෙහෙයුම් කමිටුවේ නියෝජිතයන්ගෙන් මෙය සමන්විතවිය. වගකීම්හි ප්‍රගතිය සාකච්ඡා කිරීමට, නව අදහස් සහ නවෝත්පාදන හුවමාරු කරගැනීමට සහ විවෘත රාජ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා අනෙකුත් සිවිල් සංවිධානවලට උපකාර කරන්නේ කෙසේ ද යන්න සොයා බැලීමට එය කාර්තුමය වශයෙන් රැස්වීය. වගකීම් ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සම්බන්ධයෙන් සමාන අයුරින් ක්‍රියාත්මක වුවත් ක්‍රියාකාරී කණ්ඩායම මෙන් නොව මෙම සංසදය තුළ රාජ්‍ය නියෝජනත්වයක් නොතිබුණි. පුළුල් පුරවැසි සහභාගිත්වය නැමැති සන්දර්භය තුළ, සංසදය ඒ සඳහා උනන්දුවක් දක්වන අනෙකුත් සිවිල් සංවිධානවල සහභාගිත්වය පිළිගත් නමුත් එහි සිටි නියෝජිතයන් එය ක්‍රියාවට නැංවීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දි නැත.

### 2 වන වගුව: ක්‍රියාත්මක කරන අතරතුර අදහස් විමසීම

| නිත්‍ය බහුපාර්ශවකරුවන්ගේ සංසදය | මධ්‍යකාලීන | කාල සීමාව අවසන් වූ පසු |
|---|---|---|
| 1. සංසදයක් පැවතුණි ද? | ඔව් | ඔව් |
| 2. එය නිතිපතා මුණගැසුණා ද? | නැත | නැත |

### 3 වන වගුව: ක්‍රියාත්මක කිරීම තුළ මහජන බලපෑම

ස්වාධීන වාර්තාකරණ යාන්ත්‍රණය විසින් විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය සඳහා මහජන සහභාගිත්වය පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ "පූර්ණ සහභාගිත්ව" ("Spectrum of Participation")ක්‍රමවේදය යොදා ගෙන ඇත. ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගතය සම්බන්ධයෙන් මහජනතාවට කළහැකි බලපෑමේ ප්‍රමාණය මේ තුළින් පෙන්නුම් කරයි. විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ මූලධර්මයන් තුළ බොහෝ රටවල් "සහයෝගිත්වය" යන්න අපේක්ෂා කළ යුතුය.

| ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදි මහජනතාව විසින් කරන ලද බලපෑම | | මධ්‍ය කාලසීමාව | කාලය අවසන් වූ පසු |
|---|---|---|---|
| බලගැන්වීම | තීරණ ගැනීමේ බලය රජය මහජනතාවට පවරා ඇත. | | |
| සහයෝගයෙන් ක්‍රියාකිරීම | අඛණ්ඩ සංවාදයක් පැවති අතර වැඩසටහන සකස් කිරීම සඳහා මහජනතාව සහයෝගය ලබාදෙන ලදි. | | |
| මැදිහත්වීම් | මහජනතාවගේ දායකත්වය සලකා බැලුවේ කෙසේ ද යන්න පිළිබඳ රජය ප්‍රතිචාර දක්වන ලදි. | | |
| අදහස් විමසීම් | මහජනතාවට දායක විය හැකිවිය. | ✔ | ✔ |
| දැනුම්දීම් | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් තොරතුරු රජය විසින් මහජනතාවට ලබාදෙන ලදි. | | |
| අදහස් විමසීමක් සිදුකර නොමැත | අදහස් විමසීමක් සිදුකර නොමැත | | |

## ඇගයීම හඳුන්වාදීම

IRM පර්යේෂණය තුළ භාවිතා කළ දර්ශකයන් සහ ක්‍රමවේද IRM ක්‍රියාපටිපාටිය ඇතුලත් අත්පොතෙන් ලබාගත හැක. කියවන්නාට ඒ තුළ විශේෂත්වයක් ඇති කිරීමට සහ විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ සාමාජික රටවල් අතර තරඟකාරිත්වයක් ඇති කිරීම සඳහා ධෛර්මත් කිරීමට ප්‍රයෝජනවත්වන බැවින් "විශිෂ්ට කැපවීම"(✪) යන නිර්දේශය තවදුරටත් පැහැදිලි කළයුතුය. තරු ලකුණු ලැබූ "වගකීම්" ආදර්ශ OGP "වගකීම් ලෙස සැලකේ. තරු ලකුණක් ලබා ගැනීම සඳහා වගකීම විසින් නිර්ණායක කිහිපයක් සපුරාලිය යුතුය.

- තරු ලකුණු වගකීම්වල"මධ්‍යම" හෝ " ඉහළ" විශේෂිතතාවන් තිබිය යුතුය. ඇති කළ හැකි බලපෑම ගැන විනිශ්චය කිරීම සඳහා පැහැදිලිව හඳුනාගත් ක්‍රියාකාරකම් සහ පියවර කවරේද යන්න වගකීම විසින් ඉදිරිපත් කළ යුතුය.
- විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයට වගකීම සතු අදාලත්වය පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. විශේෂයෙන් අවම වශයෙන් එය තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීම, මහජන සහභාගිත්වය හෝ මහජන වගවීම යන OGP අගයන් හා අදාළ විය යුතුය.

- වගකීම මුළුමනින්ම ක්‍රියාත්මක වූවහොත් ඒ තුලින් "පරිවර්තනීය" බලපෑමක් ඇති විය යුතුය.
- "සැලකිය යුතු ප්‍රමාණයක් හෝ "සම්පූර්ණයෙන්ම" ක්‍රියාත්මක කළ බවට ඇගයීම් වාර්තාවක් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරන අතරතුර ලබා ගැනීමෙන් රජය විසින් මෙම වගකීම සම්බන්ධයෙන් විශාල ප්‍රගතියක් පෙන්නුම් කළ යුතුය.

ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලය අවසන්වන විට, සැලකිය යුතු හෝ සම්පූර්ණ නිමාවක් සිදුකිරීමට අපොහොසත් වූ විට තරු ලකුණු වගකීම්වලට එහි තරු ලකුණු තත්ත්වයන් අහිමිවනු ඇත.මධ්‍යකාලීන වාර්තාවේ,ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සැලැස්මේ එක් තරු ලකුණු වගකීමක් ඇතුළත් විය. කාලසීමාව අවසන් වූ පසු සම්පූර්ණ කර ඇති ප්‍රමාණයේ වෙනස්කම් පාදක කරගෙන ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සැලැස්මේ එක් තරු ලකුණු වගකීමක් ඇතුළත්ව ඇත.
ස්වාධීන වාර්තාකරණ යාන්ත්‍රණය විසින් වාර්තාකරණ ක්‍රියාවලිය තුළ එකතු කරගත් විශාල දත්ත ප්‍රමාණයකින් උපුටාගත් සාරය මෙම කොටසේ ඇතුළත් වගු තුළින් ඉදිරිපත් කෙරේ.

www.opengovpartnership.org/explorer යන වෙබ් අඩවියට පිවිසීමෙන් ශ්‍රී ලංකාවේ සම්පූර්ණ දත්ත කට්ටලය දැක බලා ගත හැක.

### "එය විවෘත රාජ්‍යයක් ද?" යන්නේ අදහස් කරන්නේ කුමක් ද?

රාජ්‍ය භාවිතයන්හි වෙනස්කම් කවරේ ද යන්න ග්‍රහණය කරගැනීම සඳහා ස්වාධීන වාර්තාකරණ යාන්ත්‍රණය විසින් එහි කාලසීමාව අවසානයේ ඉදිරිපත් කරන වාර්තාවේ " එය විවෘත රාජ්‍යයක් ද?" යන නව විචල්‍යය හඳුන්වාදෙන ලදි. මෙම විචල්‍යය තුලින් නිමැවුම් සහ ලබා දෙන සේවාවන් මැනීම පමණක් නොව වගකීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජයේ භාවිතයන් වෙනස්වී ඇති ආකාරය දෙස බැලීමට ද උත්සාහ ගෙන ඇත.

ලියා දක්වා ඇති පරිදි විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ ඇතැම් වගකීම් නොපැහැදිලි සහ/ හෝ විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට පැහැදිලි ලෙස අදාල නොවන නමුත් සැලකිය යුතු ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණයක් සිදුකිරීමට එය දායකවී ඇත. අනෙකුත් වගකීම් ලිඛිතව දක්වා ඇති ආකාරයට අදාල බවක් සහ අපේක්ෂා සහිත බවක් පෙන්නුම් කරන නමුත් ක්‍රියාත්මක කිරීමේ දි ඒවා අසාර්ථක බවක් පෙන්නුම් කරයි. "එය විවෘත රාජ්‍යක් ද ?" යන විචල්‍ය තුළින් මෙම සියුම් වෙනස්කම් ග්‍රහණය කිරීමට උත්සාහ ගෙන ඇත.

"එය විවෘත රාජ්‍යයක් ද?" යන විචල්‍ය පහත සඳහන් මිනුම් භාවිතා කරමින් රාජ්‍ය භාවිතයන්හි වෙනස්කම් ඇගයීමට ලක්කරයි:

- වඩාත් දුර්වල: වගකීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය විවෘතභාවය වඩාත් දුර්වල තත්ත්වයකට පත්වීම.
- වෙනසක් වී නැත : රාජ්‍ය භාවිතයන්හි කිසිදු වෙනසක් සිදුවී නැත.
- සුළු වශයෙන්: යම් වෙනසක් සිදුවී ඇති නමුත් විවෘතභාවයේ ප්‍රමානය මත කර ඇති බලපෑමට අනුව ඉතා සුළු වෙනසකි.
- විශාල: ප්‍රතිපත්තිය හා අදාළ ක්ෂේත්‍රය තුළ රාජ්‍ය විවෘතභාවයෙහි පියවරක් ඉදිරියට ගොස් ඇති නමුත් විෂය පථය සහ ප්‍රමාණය අනුව එහි අසම්පූර්ණත්වයක් ඇත.
- කැපීපෙනෙන අයුරින්:විවෘත පාලනය මගින් ප්‍රතිපත්තිය හා අදාල ක්ෂෙත්‍රය තුළ ''සෑම දෙයක්ම යහපත් අයුරින් සිදුවන" පරිවර්තනීය වෙනසක් සිදුව ඇත.

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදීම විචල්‍ය ඇගයීම සඳහා පර්යේෂකයන් විසින් තත්ත්වයන් ස්ථාපිත කරයි. ඉන්පසු ඔවුන් රාජ්‍ය විවෘතාභාවය වෙනස්කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් හි ප්‍රතිඵල ඇගයීමට ලක් කෙරේ.

කියවන්නා සීමාවන් සිහියේ තබාගත යුතුය. ක්‍රියාත්මක කිරීමේ කාලය අවසන් වි මාස කිහිපයකට පසු IRM අවසන් වාර්තාව පිළියෙල කළ යුතුය. වසර 2 ක ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව අවසන් වූ පසු රාජ්‍ය විවෘතභාවය හා අදාළ භාවිතයන්හි නිරීක්ෂණය කළ හැකි ප්‍රතිඵල පිළිබඳ විචල්‍ය අවධානය යොමුකරනු ඇත. වාර්තාවේ කාලරාමුව සහ සංකීර්ණ ක්‍රමවේදය හේතු කොටගෙන වාර්තාව සහ විචල්‍යය විසින් බලපෑම අගය කිරීමට අපේක්ෂා නොකෙරේ.

# වගකීම ක්‍රියාත්මක කිරීම

**වගකීම් පිළිබඳ දළ විශ්ලේෂණය**

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අංගයක් ලෙස වසර දෙකක ක්‍රියාකාරී සැලැස්මක් සඳහා එහි සමාජික රටවල් තමන්ගේ වගකීම් නිශ්චය කළ යුතුය. කාලය අවසන්වන විට වගකීම් හි සම්පූර්ණ කළ යුතු මට්ටම සහ "එය විවෘත රාජ්‍යයක් ද?" යන්න පිළිබඳ ප්‍රගතිය පහත සඳහන් වගුවල සාරාංශගත කර ඇත. මධ්‍යකාලීනව අවසන් කරන වගකීම් සඳහා ප්‍රගති වාර්තාවෙන් සොයාගත් තොරතුරුවල සාරාංශයක් වාර්තාව විසින් ලබාදෙන නමුත් 'එය විවෘත ආණ්ඩුවක් ද?' යන්න විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම ස්ථිරවම සිදුනොවේ. මෙම වගකීම් හි වැඩිදුර විස්තර දැනගැනීම සඳහා කරුණාකර 2016 - 2017 IRM ශ්‍රී ලංකා ප්‍රගති වාර්තාව බලන්න.

ශ්‍රී ලංකාවේ පළමුවන ක්‍රියාකාරී සැලැස්ම තේමාත්මක ක්ෂේත්‍ර 9 ක් යටතේ වර්ග කරන ලද වගකීම් 12 කින් සමන්විත වේ. මෙම ක්ෂේත්‍රවලට දූෂණය, අධ්‍යාපනය, කාන්තාව, සෞඛ්‍ය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළත්ය. IRM ප්‍රගති වාර්තාවේ මෙන් මෙම අවසන් වාර්තාවේ ද වඩාත් පැහැදිලිව හඳුනාගැනීමට සහ පහසුවෙන් ප්‍රවේශවීම සඳහා වගකීම් 12, වගකීම් 23 ක් ලෙස කුඩා කොටස් වලට බෙදා දක්වා ඇත. මෙය පහත සඳහන් 4 වන වගුවෙන් පෙන්නුම් කෙරේ.

### 4 වන වගුව: වගකීම් හි ප්‍රගතිය ඇගයීම

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිශ්චිත නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා ප්‍රවේශවීම | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගකීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 1. නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා උපායමාර්ග | | | | ✔ | ✔ | ✔ | | | | | ✓ | | | ✔<br>✔ | | | | | ✓ | | |
| 2. දැරිය හැකි මිලක් සහිත ඖෂධ | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 3.ජාතික සෞඛ්‍ය කාර්ය සාධනය | | | ✔ | | ✔ | ✔ | | ✔ | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 4. ගුරුවරු මාරු කිරීමේ ප්‍රතිපත්තිය | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 5.රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය | | | ✔ | | ✔ | | | ✔ | | ✔ | | | | ✔<br>✔ | | | | ✔ | | | |
| 6. විවෘත දත්ත | | | ✔ | | ✔ | ✔ | | ✔ | | ✔ | | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 7.ජාතික පරිසර පනත | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | ✔ | | | |

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත සහ සංශෝධන | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | ✔ | | | |
| 9. වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ප්‍රාඥාප්තිය | | | | ✔ | ✔ | ✔ | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | | |
| 10.පළාත් පාලන ප්‍රසම්පාදන | | | | ✔ | ✔ | ✔ | | ✔ | | ✔ | | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 11.ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදන | | ✔ | | | | ✔ | ✔ | ✔ | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | | |
| 12.පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | ✔ | | | | ✔ | | |
| 13. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ රාජ්‍ය ඉඩම් | | | ✔ | | | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 14. රැකියාවේ නිරත කාන්තාව | | ✔ | | | ✔ | ✔ | | | | ✔ | | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 15.ප්‍රාදේශීය දේශපාලනය තුල කාන්තාව | | ✔ | | | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| **16.** දූෂණයට එරෙහිවීම | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 17.එක්සත් ජාතීන්ගේ දූෂණ පිටුදැකීමේ සම්මුතියේ බැඳීම් | | | ✔ | | | ✔ | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | | |
| 18. ආයතන සම්බන්ධීකරණය | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | ✔<br>✔ | | | | | ✔ | | | |
| 19.මුදල් විශුද්ධිකරණය | | | ✔ | | ✔ | | | | | | ✔ | | | ✔<br>✔ | | | | ✔ | | | |
| 20.ප්‍රචාරක කටයුතු සඳහා මුදල් යෙදවීම | | | ✔ | | පැහැදිලි නැත | | | | | | ✔ | | | ✔<br>✔ | | | | ✔ | | | |
| 21.වත්කම් ප්‍රකාශන | | | | ✔ | ✔ | | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |
| 22. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත නීතිගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | | | ✔ | ✔ | | | ✔ | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | |
| 23.ඉල්ලීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම | | | | ✔ | ✔ | | | | | | ✔ | | | ✔<br>✔ | | | | ✔ | | | |

# 1 වන තේමාව : සෞඛ්‍ය

## I. නිදන්ගත වකුගඩු රෝග මර්දනය කිරීමේ උපාය මාර්ග සඳහා මහජන සහභාගිත්වය

**වගකීමේ ආදර්ශ පාඨය :**
**නිදන්ගත වකුගඩුරෝගය වැළැක්වීමේ සහ ප්‍රතිකාරක උපාය මාර්ග සඳහා මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීම**

[...]

මූලික අරමුණ :
නිදන්ගත වකුගඩු රෝග නිවාරණය, අවම කිරීම සහ ඒ සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සහ නිවාරණ උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම සඳහා සිවිල් සංවිධාන සම්බන්ධ කරගැනීම.

සන්ධිස්ථාන :

- 1.1 නිවාරණ උපායමාර්ග සැලැස්ම සකස් කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ කළ යුතු වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ සංසදයක් පිහිටුවීම.
- 1.2 ලබා දෙන වෛද්‍ය පහසුකම් සහ සේවාවන්ගේ ලැයිස්තුව, නිදන්ගත වකුගඩු රෝගය සඳහා අයවැයෙන් වෙන් කර ඇති මුදල් ප්‍රතිපාදන ඇතුළු නිදන්ගත වකුගඩු රෝගය නිවාරණය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග හා අදාළ මූලික තොරතුරු සහ ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවිය සහ මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කිරීම.
- 1.3 මූලික තොරතුරු බෙදාහැරීම සඳහා දීපව්‍යාප්ත මහජන අදහස් විමසීම් සහ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ඉහත1.2).
- 1.4 ගුණාත්මක සහ විශ්වසනීය පහසුකම් සහ සේවාවන්ට පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳ මහජන ප්‍රතිචාර ලබා ගැනීම සඳහා නිදන්ගත වකුගඩු රෝග සඳහා පිරිනමන වෛද්‍ය පහසුකම් තුළ ප්‍රතිචාර යාන්ත්‍රණයක් ආයතනගත කිරීම.
- 1.5 නිදන්ගත වකුගඩු රෝග සඳහා ලබාදෙන පහසුකම් සහ සේවා සඳහා ප්‍රවේශවීමේ හැකියාව,ගුණාත්මකබව සහ විශ්වසනීයත්වය පිළිබඳ පුරවැසි/පාරිභෝගික ප්‍රතිචාර ඇතුළත් අර්ධ වාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත්කිරීම.

**වගකිව යුතු ආයතනය :** සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
**උපකාරක ආයතන :** නිදන්ගත වකුගඩු රෝග ඒකකය : සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය: නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය

**ආරම්භක දිනය** : ජූලි 2016
**අවසන් දිනය** : ජූලි 2018

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | | | | | |
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | හළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්ථනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුරවල | වෙනස්වී නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙනන |
| 1. . නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා උපායමාර්ග | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | | | | | ✔ | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**වගකීමේ අරමුණ :**

මෙම වගකීමේ අරමුණවන්නේ නිදන්ගත වකුගඩු රෝග හා අදාළ විධිමත් නිවාරණ සහ ප්‍රතිකාරක උපාය මාර්ග සහ පහසුකම් වෙත පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව සහ ඒ පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩිදියුණු කිරීමයි. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අදාළ පාර්ශවකරුවන් මෙම වගකීම සාක්ෂාත් කර ගැනීම තුළින් පහත සඳහන් දෑ අපේක්ෂා කෙරේ.

1) නිදන්ගත වකුගඩු රෝග සමඟ කටයුතු කිරීමේ දි ව්‍යාජ සහ විද්‍යාත්මක නොවූ ක්‍රමවේදයන් භාවිතා කිරීමෙන් වැළකී සිටීම. 2) කාලෝචිත සහ යෝග්‍ය ආරක්ෂිත පියවර අනුගමනය කිරීම.

3) අඛණ්ඩ සායනික පරීක්ෂණ සඳහා තමන් විසින්ම ඉදිරිපත්වීම.

එමෙන්ම මෙය රෝගී තත්ත්වය සහ මරණ අනුපාතය අඩුකිරීමට හේතුවනු ඇතැයි ද පාර්ශවකරුවන් අපේක්ෂා කෙරේ.

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**

මධ්‍ය කාලසීමාව අවසන් වනවිට මෙම වගකීම සම්බන්ධයෙන් අවසන් කර තිබුණේ සීමිත වැඩ කොටසක් පමණි. බොහෝ පාර්ශවකරුවන් නිදන්ගත වකුගඩු රෝග මර්දනය කිරීම පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත්කිරීමට පියවර ගෙන ඇත( සන්ධිස්ථානය 1.2). නිදසුනක් ලෙස, නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකාය එහි වෙබ් අඩවිය ඔස්සේ නිදන්ගත වකුගඩු රෝග මර්දන කිරීම පිළිබඳ සීමිත තොරතුරු ප්‍රමාණයක් ප්‍රකාශයට පත්කර ඇත.
ඊට සමගාමීව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ තොරතුරු ඇතුළු මහජන සෞඛ්‍ය පණිවිඩ බෙදාහැරීම වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත(1.3 සන්ධිස්ථානය). නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ මූලික තොරතුරු බෙදා හැරීම, වසංගත රෝග පිළිබඳ වාර්තාව සඳහා නිදන්ගත වකුගඩු රෝගය නිර්දේශ කිරීම, මාධ්‍ය සම්මන්ත්‍රණ සහ වෛද්‍ය නිලධාරීන්ගේ චර්යාත්මක වෙනස්කම් සඳහා සන්නිවේදනය පිළිබඳ පුහුණු පැවැත්වීම යන ක්‍රියාමාර්ග තුළින් විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ වගකීම වඩාත් දිරිගන්වා ඇත.

කෙසේ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිදන්ගත වකුගඩු රෝග මර්දනය කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස්කිරීමට බහුපාර්ශවකරුවන්ගේ සංසදයක්(1.1සන්ධිස්ථානය) පිහිටුවා නැත. එමෙන්ම නිදන්ගත වකුගඩු රෝගය හා අදාළ සේවාවන් සහ පහසුකම් සඳහා මුදල් ප්‍රතිපාදන හෝ භාණ්ඩ ලේඛනයක් ප්‍රකාශයට පත් කර හෝ නිදන්ගත වකුගඩු රෝග සඳහා වූ වෛද්‍ය පහසුකම් පිළිබඳ මහජන ප්‍රතිචාර ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ( සන්ධිස්ථානය 1.4) ආයතනගත කර නැත.

**කාලසීමාව අවසන් වූ පසුඃ සීමාසහිත**

කාලසීමාව අවසනයේ දි වගකීම සම්පූර්කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි.

1.1 සන්ධිස්ථානය : සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව, රජය, සිවිල් සංවිධාන සහ පර්යේෂණ ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත බහුපාර්ශවකරුවන්ගේ සංසදය පිහිටුවා ඇත. සිවිල් සංවිධාන සහතික කළ ආකාරයට, නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ ගැටළු පිළිබඳ වඩාත් හොඳින් අවබෝධ කරගැනීම සඳහා ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට මෙම සංසදය මූලික වශයෙන් දෙවතාවක් මුණගැසී ඇත. නිදන්ගත වකුගඩු රෝග සඳහා ඍජු හේතුවක් හෝ වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් වෙත ළඟාවීමට නොහැකි වුවත් සිවිල් සංවිධාන මෙන්ම රජය සඳහන් කළේ ආහාර හේතු කොට ඇතිවන තත්ත්වයන් පිළිබඳ වැඩිදුර පර්යේෂණ සිදුකිරීමේ අවශ්‍යතාව සංසදයට සහභාගී වූ පාර්ශකරුවන් තහවුරු කළ බවයි. කෙසේ නමුත් උපායමාර්ගික නිවාරණ සැලැස්මක් ගොඩනැගීම කෙරෙහි සාකච්ඡාව අවධානය යොමු නොකළ බව සිවිල් සංවිධාන නිරීක්ෂණය කර ඇත.

1.2සන්ධිස්ථානයඃ කාලසීමාව අවසන් වනවිට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩිදුර තොරතුරු ප්‍රකාශයට පත්කර නොතිබුණි. කෙසේ වුවද අමාත්‍යාංශය විසින් 2018 වසරේ ජූනි මස රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගීවීම සහ නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ තොරතුරු බෙදාහැරීමේ වැඩසටහනක් පැවැත්වීම ඇතුළු ඒ හා අදාළ වැඩසටහන් කිහිපයක් සංවිධානය කර ඇත. මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාව වනවිට අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ඔස්සේ සොයා ගත හැකි වූ එකම අයවැය වාර්තාව වූයේ 2013 වසර සඳහා වූ ජාතික සෞඛ්‍ය ගිනුම් වාර්තාවයි.

1.3 සන්ධිස්ථානය : සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් කිහිපයක් සිදුකළත් නිදන්ගත් වකුගඩු රෝගය හා අදාළ මූලික තොරතුරු ප්‍රකාශයට පත්කර නැති බව නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩිදුර තොරතුරු සෙවීම වෙනුවෙන් පෙනී සිටින සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිවිල් සංවිධාන සහායකයෙකු වන සර්වෝදය සඳහන් කරන ලදි. මෙම තොරතුරුවලට, ලබා දෙන වෛද්‍ය පහසුකම් සහ සේවාවන් පිළිබඳ ලැයිස්තුවක්, එම රෝගය සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන සහ ප්‍රධාන ප්‍රතිපත්ති ඇතුළු නිදන්ගත වකුගඩු රෝගය මර්දනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග ඇතුලත්ව ඇත. කිසිම මහජන අදහස් විමසීමක් නොපැවත් වූ බව අමාත්‍යාංශය පැවසුවේ ය.

1.4 -1. 5 සන්ධිස්ථානය : සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව රෝහල් ජාලය සහ රෝහල් සංවර්ධන කමිටුව හරහා ප්‍රතිචාර ලබාගන්නා යාන්ත්‍රණ ක්‍රියාත්මක කර ඇත. කෙසේ නමුත් සර්වෝදය පවසන්නේ මෙම යාන්ත්‍රණ නිදන්ගත වකුගඩු රෝග හා පැහැදිලි ලෙස සම්බන්ධ කර නැති බවයි. සේවා ලබාගන්නන්ට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව තිබුණත් එසේ කිරීම සඳහා ඔවුන් ප්‍රමාණවත් අයුරින් බලගන්වා නැත. එමනිසා අමාත්‍යාංශය විසින් නිදන්ගත වකුගඩු රෝගය හා සම්බබන්ධ සේවාවන් සහ පහසුකම් සඳහා ප්‍රවේශ වීමේ හැකියාව, එහි ගුණාත්මකබව සහ විශ්වාසනීයත්වය පිළිබඳ සේවා පරිශීලනය කරන්නන්ගේ ප්‍රතිචාර පිළිබඳ වාර්තා ප්‍රකාශයට පත්කර නැත.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව: සුළු**
**පුරවැසි සහභාගිත්වය : සුළු**

තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව සහ සිවිල් සහභාගිත්වය සම්බන්ධයෙන් මෙම වගකීම සිදුකර ඇත්තේ සීමිත බලපෑමක් වන අතර එය විවෘත රාජ්‍ය තුළ අවම වර්ධනයක් ඇති කිරීමට හේතු වී ඇත.
ක්‍රියාකාරී සැලැස්මේ ආරම්භයේදී නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ බරපතල සෞඛ්‍ය ගැටළුවක් විය. 2010 සිට රෝගීන් සංඛ්‍යාව වර්ධනය වී ඇති අතර එයට බලපා ඇති හේතුව තවම හරියට හඳුනාගෙන නොමැත. එබැවින් නිවාරණ හෝ ප්‍රතිකාරමය ක්‍රියාමාර්ග හෝ ඉතා උසස් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳ නිශ්චිත තොරතුරු ලබා ගැනීමට මහජනතාවට අපහසුවී ඇත. පැහැදිලි තොරතුරු නොමැතිවීම හේතු කොට ගෙන තවත් පැත්තකින් බොහෝ පිරිස් අවදානම් ක්‍රියාමාර්ගවලට යොමුවී ඇත. ප්‍රමානවත් සහ ඉතා හොඳ ප්‍රතිකාර ලබාදීමට අසම සම පහසුකම් රැසක් තිබුණ ද විවිධ පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් නොමැති වීම නිසා එකී උත්සාහයන්ට දැඩි බධා එල්ලවී ඇත.

මෙම වගකීම සම්පූර්ණ වශයෙන් ඉටුකර නොමැතිබව ප්‍රධාන රාජ්‍ය ආයතන සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවෝ සඳහන් කළහ. අමාත්‍යාංශය සහ නිදන්ගත වකුගඩු රෝග සම්බන්ධ ජනාධිපති කාර්යසාධක බලකාය වැනි අදාළ පාර්ශවකරුවන් වෙබ් අඩවි, අත්පත්‍රිකා සහ පෝස්ටර් හරහා නිදන්ගත වකුගඩු රෝගය හා අදාළ රජය සතු ඇතැම් තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට සහ බෙදා හැරීමට කටයුතු කර ඇත (1.2සන්දිස්ථානය බලන්න). කෙසේ නමුත් මෙම හෙළිකිරීම් තුළ තීරණාත්මක තොරතුරු ස්වල්පයක් ඇතුළත්ව තිබුණ අතර තිරසාර විසඳුමක් ඉදිරපත්කර නැත. එබැවින් මෙම ක්‍රියාමාර්ග තොරතුරු සඳහා ප්‍රවේශවීම තුළ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට දායක වී නැත. එසේම බහුපාර්ශවකරුවන්ගේ සංසදය පිහිටවූ නමුත් බහුපාර්ශව කරුවන් අපේක්ෂා කළ නිවාරණ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධයෙන් සංසදය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැ මෙයින් අදහස් කරන්නේ බහුපාර්ශවකරුවන්ගේ සංසදයට සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ වෙනස්කම් ඇති කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවයි. කෙසේ නමුත් පෙර පරස්පර ලෙස හැසිරුන පාර්ශවයන් මෙම ගැටළුව සාකච්ඡා කිරීමට දැන් එකට එක්වෙමින් ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය හඳුනාගෙන ඇති අතර මේ තුළින් හැඟවෙන්නේ සැලකිය යුතු නමුත් සුළු වැඩිදියුණු වීමක් ඇතිව ඇති බවයි.

**ඉදිරියට රැගෙන යා යුතුද?**

මෙම වාර්තාව සකස් කරන අවස්ථාවේ ශ්‍රී ලංකාව සඳහා වූ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. කෙසේ නමුත් නිදන්ගත වකුගඩු රෝගය හා ඒ හා අදාල නිවාරණ උපායමාර්ග සහ වෛද්‍ය පහසුකම් පිළිබඳ පුරවැසියන් දැනුවත්කිරීමේ වැදගත්කම සලකාබලා IRM පර්යේෂක විසින් මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්මට රැගෙන යන ලෙස නිර්දේශ කරයි.
මෙම වගකීමේ බලපෑම තවදුරටත් ඉහළ නැංවීමට ගත හැකි අමතර ක්‍රියාමාර්ග කිහිපයක් 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක නිර්දේශ කරයි. මෙයට නිදන්ගත වකුගඩු රෝගය හා අදාළ පර්යේෂණ වැඩසටහන් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තාවක් පළ කිරීම:නිවාරණ උපායමාර්ග සඳහා මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් සම්බන්ධීකරණය කිරීමට කේන්ද්‍රීය ස්ථානයක් නියම කිරීම: නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ සත්‍ය තොරතුරු හුවමාරු කරගැනීමට විවිධ සන්නිවේදන ක්‍රමවේද භාවිතා කිරීම: සහ ගුණාත්මක සහ විශ්වසනීය පහසුකම් සහ සේවාවන් සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳ ඒවා භාවිතා කරන්නන්ගේ ප්‍රතිචාර අධංගු වාර්තා පසුවිපරම් කිරීම ඇතුළත් වේ.

## 2. ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය:**

**ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ සියලුදෙනාටම ලබා දීම සඳහා විනිවිදභාවයකින් යුත් ප්‍රතිපත්තියක්**

නිවාරණ,ප්‍රතිකාරමය සහ පුනරුත්ථාපනය යන සේවාවන් තුළ අත්‍යාවශ්‍ය ඖෂධ වැදගත් භූමිකාවක් ඉටුකරයි. ඉහළ සෞඛ්‍ය දර්ශකයන්(ආයු අපේක්ෂාව සහ සෞඛ්‍ය සේවා භාවිතය වැනි)සහිත සියලු පහසුකම්වලින් යුත් නොමිලයේ ලබාදෙන සෞඛ්‍ය සේවා පද්ධතියක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ආඩම්බර විය යුතුය. කෙසේ නමුත් මෙම සේවා පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යාමේ දී තවමත් විවිධ විෂමතාවන්ට මුහුණදීමට සිදුව ඇත. සෞඛ්‍ය සේවාවන් නොමිලයේ ලබා දුන්න ද ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ සාමාන්‍ය මහජනතාවට ලබාගැනීමට හැකියාව නැති අතර එය පුරවැසියන්ගේ සෞඛ්‍යට දැඩි ඍණාත්මක බලපෑමක් එල්ල කර ඇත.
ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල ඖෂධ නොමැතිකම සහ හිඟය හේතු කොට ගෙන අවාසනාවන්ත තත්ත්වයක්ට මුහුණදීමට සිදුව ඇත. ඖෂධවල ගුණාත්මකබව මෙන්ම මිල මිනිසුන්ට බරපතල ගැටළුකි. විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ මෙම වගකීම තුළින් ජාතික සෞඛ්‍ය ප්‍රමිතීන් ඉහළ නැංවීමට සහ ආරක්ෂිත සහ දැරිය හැකි මිලකින් යුත් ඖෂධ සියලු දෙනාටම ලබා දීම සහතික කිරීමට කටයුතු කරයි. ජාතික ඖෂධ නියාමන අධිකාරියට (National Medicinal Drug Regulatory Authority) උපදේශක මණ්ඩලයක් පත්කිරීම සහ සෞඛ්‍ය සේවා ක්‍රියාත්මක කරන ආකාරය ඇගයීමට ලක්කිරීම මේ සම්බන්ධයෙන් රජයේ වගවීම මෙන්ම විනිවිදභාවය ඉහළ නංවනු ඇත.
**සන්ධිස්ථාන** :

- 2.1 සිවිල් සංවිධාන/ සෞඛ්‍ය ක්‍රියාකරුවන්ගෙන් සමන්විත වූ උපදේශක මණ්ඩලයක් ජාතික ඖෂධ නියාමන අධිකාරියට පත් කිරීම.
- 2.2 අත්‍යාවශ්‍ය ඖෂධ ලබා ගැනීම සහතික කිරීම සඳහා (RMSD, ආයතන මට්ටමින්) මහජන ප්‍රතිචාර ලබා ගත හැකි ආකාරයේ නියාමන පද්ධතියක් ස්ථාපනය කිරීම සහ ආයතනගත කිරීම.
- 2.3 සෑම අවස්ථාවකම ගුණාත්මක අත්‍යාවශය ඖෂධ ලබාදෙන බව සියලුම රජයේ රෝහල් සහ සායන සහතික කිරීම සහ ප්‍රදර්ශන පුවරු මගින් අවශ්‍ය තොරතුරු මහජනතාව වෙත ලබා දෙන බව සහතික කිරීම.
- 2.4 දැරිය හැකි මිලක් සහිත අත්‍යාවශ්‍ය ඖෂධ ලබා ගැනීමේ හැකියාව පදනම් කරගෙන පෞද්ගලික ඔසුසැල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සහ එම තොරතුරු වෙබ් අඩවි ඔස්සේ මහජනතාවට දැක බලා ගැනීමට සැලැස්වීම.
- 2.5 අත්‍යාවශ්‍ය ඖෂධ දැරිය හැකි මිලක් සහිතව ලබා ගැනීමේ හැකියාව පදනම් කරගෙන පෞද්ගලික ඔසුසැල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාමාර්ගය පිළිබඳ මහජනතාව දැනුවත්කිරීම.

**වගකිවයුතු ආයතනය :** සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
**උපකාරක ආයතන :** ජාතික ඖෂධ නියාමන අධිකාරිය: වෛද්‍ය සැපයුම් අංශය, සර්වෝදය,රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය, මහජන සෞඛ්‍ය ව්‍යාපාරය ( සිවිල් සංවිධාන)
**ආරම්භක දිනය :** 2016 ජුලි
**අවසන් දිනය :** 2018 ජුලි

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවි ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා ප්‍රවේශවීම | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දරුණු | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 2. ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | | | | | ✔ | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**වගකීමේ අරමුණ :**

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අත්‍යාවශ්‍ය ඖෂධ පහසු මිලට ලබා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙම වගකීම තුළින් අරමුණු කෙරේ. මෙය සෞඛ්‍ය දර්ශක සහ ජාතික සෞඛ්‍ය ප්‍රමිතීන් හි වර්ධනයට බලපානු ඇතැයි සෞඛ්‍ය අමාත්‍යාංශය මෙන්ම ඒ හා සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන් අපේක්ෂා කෙරේ. ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ ලබා ගත හැකිය යන්න පිළිබඳ වඩාත් විනිවිදභාවයක් ඇති කිරීමට වගකීම කටයුතු කළයුතු බව සන්ධිස්ථානයේ සඳහන් කර ඇති නමුත් එය සහතික කිරීම සඳහා "විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක්" ස්ථාපිත කිරීමට වගකීම පැහැදිලි ලෙස යෝජනා කර නැත.

**තත්වය**

**මධ්‍ය කාලසීමාව : සීමාසහිත :**

මෙම වගකීම මධ්‍ය කාලසීමාව වනවිට සම්පූර්ණ කර තිබුණේ සීමිත වැඩ කොටසක් පමණි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් උපදේශක මණ්ඩලය සඳහා අපේක්ෂක නම් ලැයිස්තුවක් ඉදිරිපත් කළ නමුත් මෙම නාමයෝජනා නිලවශයෙන් පත් කිරීමේ වගකීම ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයට බව පවසන ලදි( 2.1සන්ධිස්ථානය).උපදේශක මණ්ඩලයේ සංයුතිය සහ නියෝජනය පිළිබඳ වූ මාර්ගෝපදේශයන්ට අනුව ඉදිරිපත් කරන ලද නම් වලට සිවිල් සංවිධාන නියෝජිතයන් ඇතුළත් විය.

අත්‍යාවශ්‍ය ඖෂධ ලබාගත හැකි බවට මහජන ප්‍රතිචාර ලබා ගැනීමේ සේවාව ද ඇතුලත් ආයතනගත කරන ලද පරිපූර්ණ නියාමන යාන්ත්‍රණයක් නොමැත (2.2 සන්ධිස්ථානය). වඩාත් හොඳ සෞඛ්‍ය සේවාවන් ලබාදීම සම්බන්ධයෙන් ක්‍රියාකරන සිවිල් සංවිධානයක් වන සර්වෝදය සංවිධානය මෙය සනාථ කළේය. කෙසේ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වන වෛද්‍ය සැපයුම් අංශය ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් ඖෂධ තොග සහ සැපයුම් අන්තර්ජාලය ඔස්සේ නිරීක්ෂණය කිරීම සඳහා මූලික කටයුතු ගොඩනගමින් සිටින බව ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහන් කළේය.

අත්‍යාවශ්‍ය ගුණාත්මක ඖෂධ ලබාගැනීම පිළිබඳ තොරතුරු මහජනතාව ගැවසෙන ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට සෞඛ්‍ය සායන සහ රෝහල් ගණනාවක් ආරම්භ කර ඇති බව සෞඛ්‍ය

අමාත්‍යාංශය සඳහන් කරයි (සන්ධිස්ථානය 2.3). කෙසේ නමුත් මෙය නිල හෝ විධිමත් ආකාරයට සිදුනොවේ. මධ්‍ය කාලසීමාව වනවිට ඖසුසැල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය ස්ථාපිත කර නොතිබුණි ( සන්ධිස්ථානය 2.4). එවැනි ශ්‍රේණිගත කිරීමකට අවශ්‍ය මාර්ගෝපදේශ ඔවුන් ගොඩනැගූ බව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නියෝජිතයකු විසින් වාර්තාකරන ලදි.මේ සම්බන්ධයෙන් සිවිල් සංවිධාන විශේෂිත ප්‍රවර්ධන කටයුත්තක් සිදුනොකළ බව සර්වෝදයේ සිවිල් සංවිධාන නියෝජිතයෙකු සඳහන් කළේය.

**කාලසීමාව අවසන් වූ පසු: සීමා සහිත**

කාලය අවසන් වනවිට මෙම වගකීම විසින් ඉටුකර තිබුණේ සීමිත වැඩ කොටසක් පමණි.

2.1 සන්ධිස්ථානය : මෙම වාර්තාව සකස්කරන අතරතුර සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ උපදේශක මණ්ඩලයට නිලධාරීන් පත්කිරීම අවසන්කර නොතිබුණි. අත්‍යාවශ්‍ය ඖෂධවල මිල අඛණ්ඩව අඩු කිරීම පිළිබඳ වගකීම ප්‍රධාන තීරණ ගන්නන් සතු බව සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමාන කර ඇත. එබැවින් උපදේශක මණ්ඩලයක් පත්කිරීම හදිසි අවශ්‍යතාවක් ලෙස ඔවුන් සලකා නැත .

2.2 සන්ධිස්ථානය: ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය තෙක් ඖෂධ ඇති බවට සහතික කිරීම සඳහා වෛද්‍ය සැපයුම් අංශය නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇත. විමධ්‍යගත කරන ලද ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශ විසින් වෛද්‍ය සැපයුම් අංශය විසින් මධ්‍යගතව මිලදී ගන්නා ඖෂධ රට පුරා පිහිටි ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන 960 කට බෙදා දෙනු ලැබේ. කෙසේ නමුත් කුඩා ලෙස විහිදී ඇති ආයතන මට්ටමින් ඖෂධ පවතින බව නියාමනය කිරීමක් සිදුනොවේ. ධනාත්මක ලෙස ආරම්භ වුවත් ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ නියාමන යාන්ත්‍රණය මේ වන විට මහජන ප්‍රතිචාර ලබා ගැනීම සඳහා තවමත් විවෘතව නැත. ඖෂධ තොග සෑම මට්ටමකින්ම කාර්යක්ෂම ලෙස නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීමට තමන් බාහිර සහාය ඉල්ලා සිටින බව අමාත්‍යාංශය තහවුරු කළේය.

2.3 සන්ධිස්ථානය : ලබාගත හැකි ඖෂධ කවරේ ද යන්න පිළිබඳ විමසීමට පෙර සෞඛ්‍ය ආයතන විසින් ඒවා ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීමට මෙම වගකීම දායක වනු ඇතැයි සිවිල් සංවිධාන අපේක්ෂා කළේය. මධ්‍ය කාලසිමාව තුල සුළු වර්ධනයක් පෙන්නුම් කරත් පූර්ණ වශයෙන් හෝ විධිමත් ලෙස ක්‍රියාත්මක නොවුවත් සෞඛ්‍ය සායන සහ රෝහල් සුළු ප්‍රමාණයක් එලෙෂස තොරතුරු ප්‍රදර්ශනය කිරීම ආරම්භ කර ඇති බව සිවිල් සංවිධාන විසින් තහවුරු කරන ලදි. කෙසේ නමුත් සිවිල් සංවිධාන හෝ රජයට නිවැරිදි ලෙෂ තහවුරු කරන සංඛ්‍යා ලබා දීමට නොහැකි වූ බැවින් මෙම වගකීම සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් කිසිදු වෙනසක් සිදුවී නැත.

රෝහල් බෙහෙත්ශාලාවල පවතින ඖෂධ පමණක් වෛද්‍යවරුන් නිර්දේශ කරන බව සෞඛ්‍ය අමාත්‍යාංශය පැහැදිලි කළේය. මෙම ඖෂධ නොමිලයේ ලබා ගත හැක. අත්‍යාවශ්‍ය ඖෂධයක් අදාල දිනයේ දී නොමැති විට වෛද්‍යවරයා විසින් ඒ සඳහා සුදුසු විකල්ප ඖෂධයක් නිර්දේශ කරයි. මෙම ක්‍රියාපිළිවෙල සහ අත්‍යාවශය ඖෂධ ලබා ගැනීමට ඇති හැකියාව සලකා බැලීමේදි ලබාගත හැකි ඖෂධ ප්‍රදර්ශනය කිරීම වැදගත් කාරණයක් නොවන බව අමාත්‍යාංශයේ අදහසයි. එමෙන්ම මෙම සන්ධිස්ථානය අත්‍යාවශය ඖෂධ ප්‍රමාණවත් ප්‍රමිතියකින් යුක්තවීම කෙරෙහි ද අවධානය යොමු කරයි. සෞඛ්‍ය සේවා පද්ධතිය හරහා හොඳ ප්‍රමිතියකින් යුත් ඖෂධ බෙදා හරින බවට සහතික වීම සඳහා අඛණ්ඩව යම් යම් ක්‍රියාමාර්ග ගත් බව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තහවුරු කළේය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ හොඳ නිෂ්පාදන භාවිතයන් යොදාගැනීම, නියාමන ආයතනවලින් විධිමත් නිර්දේශ ලබාගැනීම,ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ ලියාපදිංචිවීම, රාජ්‍ය ඖෂධ සංස්ථාව මගින් සාම්පල පරීක්ෂා කරවා ගැනීම මෙයට ඇතුළත් වේ.ගුණාත්මකබව සහතික කිරීමේ සන්දර්භය තුළ මේවා සම්මත ක්‍රියාමාර්ග බව සර්වෝදය සහතික කළේය.

2.4 -2.5 සන්ධිස්ථාන: පුද්ගලික ඖසුසැල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් සිදුනොවූ බව සියලුම පාර්ශවකරුවන් විසින් තහවුරු කරන ලදි.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : සුළු**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් සිදුවී නැත**

මෙම වගකීම සිවිල් සහභාගිත්වයේ වෙනසක් ඇති කිරීමට දායක වී නැති නමුත් තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සම්බන්ධයෙන් සීමිත වර්ධනයක් සිදුකර ඇත.සමස්තයක් ලෙස විවෘත රාජ්‍ය තුළ සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත.
ක්‍රියාකාරී සැලැස්මේ ආරම්භක අවස්ථාවේ දැරිය හැකි මිලක් සහිත අත්‍යාවශ්‍ය ඖෂධ ප්‍රමාණවත් අයුරින් නොමැතිවීම සෞඛ්‍ය අංශයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර ප්‍රධාන ගැටළුවක් විය. ඉහළ පිරිවැය, දීර්ඝකාලයක් ගතවන ඖෂධ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලී, සායනික පරීක්ෂණ සඳහා ප්‍රමාණවත් නොවූ ධාරිතාව සහ ඖෂධ පිළිබඳ දැවැන්ත ප්‍රචාරක කටයුතු යන මේ සියල්ලම දැරිය හැකි මිලකින් යුත් ආරක්ෂිත ඖෂධ ලබා ගැනීමට බධාවන් වි ඇත. මහජන සෞඛ්‍ය සේවාවන්ට තවත් පීඩනයක් ගෙන දෙමින් මෙම තත්ත්වය පෙරලා නැවතත් නිර්දේශ කරන ඖෂධවල අනුකූලතාව බිඳීමට සහ අමතර සෞඛ්‍ය ගැටළු මතු කිරීමට හේතු වි ඇත.

නිවරිදි සංඛ්‍යාව ඉදිරිපත් කිරීමට නොහැකි වුවත් අත්‍යාවශය ඖෂධ ලබාගත හැකි බවට තොරතුරු ප්‍රදර්ශනය කිරීමට මහජන සෞඛ්‍ය ආයතන කිහිපයක් ආරම්භකර ඇති බව සිවිල් සමාජ සංවිධාන විසින් තහවුරු කරන ලදි. කෙසේ නමුත් මෙය සම්පූර්ණයෙන්ම නිමා නොකළත් ඔසුසැල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය ස්ථාපිත කිරීම සම්බන්ධයෙයන් කිසිම ප්‍රගතියක් සිදුවි නැත - මෙම වගකීම තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව සුළු වශයෙන් වැඩිදියුණු කිරීමට පමණක් දායකවී ඇත.
ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය මට්ටමින් අන්තර් ජාලය ඔස්සේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම හරහා ලබාගත හැකි ඖෂධ කවරේද යන්න පිළිබඳ දැනගැනීමට පුරවැසියන්ට හැකිවී ඇත. මෙය තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් අත්පත් කරගත් සුළු ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැක. අන්තර් ජාලය ඔස්සේ මෙම තොරතුරු සඳහා කොපමණ පුරවැසියන් සංඛ්‍යාවක් ප්‍රවේශවනවාද යන්න පිළිබඳ දත්ත නොමැති වුවත් සමස්ත ජනගහනයෙන් 25% ක් 2018 වසරේ පළමු මාස 6 තුළ ඒ සඳහා ප්‍රවේශ වි ඇති බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර ඇත.
සියලු තොරතුරු සඳහා අන්තර් ජාලය ඔස්සේ පමණක් ප්‍රවේශ වීමට රජය ගන්නා උත්සාහයන් හා අදාළ සීමාවන් මෙම සංඛ්‍යාලේඛන තුළින් පෙන්වා දේ. ඊට අමතරව, අන්තර් ජාලය ඔස්සේ හඳුන්වාදුන් යාන්ත්‍රණය මහජන ප්‍රතිචාර ලබාගැනීමට අවස්ථාව සලසා නැති අතර ඒ හේතු කොට ගෙන මහජන සහභාගිත්වය වර්ධනය කිරීමට එය දායකව නැත. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ උපදේශක මණ්ඩලය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමද තවමත් සිදුවි නැත.

**ඉදිරියට රැගෙන යා යුතු ද?**
මෙම වාර්තාව පිළියෙල කරන අතරතුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත්කර නොතිබුණි. ආරක්ෂිත දැරිය හැකි මිලක් සහිත ඖෂධ ලබා ගත හැකි බව සහතික කිරීමේ වැදගත්කම සලකා බලා IRM පර්යේෂක මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන යායුතු බව නිර්දේශ කරයි.
කෙසේ නමුත්, විවෘත රාජ්‍යයේ මූලධර්ම වඩාත් වාසි ගෙන දෙන ආකාරයට භාවිතා කරමින් අපේක්ෂා කරන බලපෑම ඉහළ නැංවීම සඳහා ලබාගෙන ඇති සීමිත ප්‍රගතිය පිළිබඳ අවබෝධයෙන් IRM පර්යේෂක විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් නිර්දේශ කරයි.

- ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ පවතින බවට සහතික වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ත්‍රෛමාසික වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම.
- ආරක්ෂිත සහ දැරිය හැකි මිලක් සහිත ඖෂධ පවතින බවට සහතිකවීම සම්බන්ධයෙන් සේවා සපයන්නන් මැදිහත්කරවීමට දුක්ගැනිවිලි සඳහා සහන සලසාදීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.
- එවැනි යාන්ත්‍රණ පවතින බවට දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## 3. ජාතික සෞඛ්‍ය කාර්ය සාධනය

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**

**ජාතික සෞඛ්‍ය කාර්ය සාධනය**

[...] ප්‍රමාණවත් ධාරිතාවක් නොමැතිවීම,විශේෂඥ ප්‍රතිකාර සේවා පහසුකම් සඳහා සීමා සහිත ප්‍රවේශය සහ ස්ථිර නොවූ සේවා ප්‍රමිතීන් යන ගැටළු මහජන සෞඛ්‍ය අංශයේ දක්නට ඇත.

මෙම අභියෝගයන්ගෙන් කිහිපයක් අවම කිරීම සඳහා සෞඛ්‍ය අංශයේ කාර්යක්ෂමතාව සහ නිපුණත්වය සහ සාධාරණ ක්‍රියාකාරිත්වය හා අදාළ තොරතුරු පුරවැසියන්ට ලබාදීමට සහ ජාතික සෞඛ්‍ය සම්බන්ධයෙන් වූ මෙකී අරමුණු බිම් මට්ටමින් ඉටුවන බවට සහතික වීම සඳහා ක්‍රියාකාරී භූමිකාවක් ඉටුකිරීමට සිවිල් සමාජය බලගැන්වීමට ශ්‍රී ලංකා රජය විසින් ගොඩනගන ලද සෞඛ්‍ය පිළිබඳ ප්‍රධාන උපායමාර්ගික සැලැස්මට ජාතික සෞඛ්‍ය කාර්ය සාධන වැඩසටහන ඇතුලත් කරන ලදි.
සෞඛ්‍ය සම්බන්ධයෙන් ශක්තිමත් සංවාදයක් සහ හඬක් නැංවීම සඳහා පුරවැසියන් විසින් සෞඛ්‍ය කාර්ය සාධනය හා අදාළ තොරතුරු විවිධාකාර ලෙස භාවිතා කරයි. එමෙන්ම කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සෞඛ්‍ය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරයේ හිතකර වෙනස්කම් ඇති කිරීමට සහ අනෙකුත් අංශවල යහපත් ප්‍රතිපත්ති පිළිබඳ වඩාත් හොඳ දැනුවත්භාවයක් ඇති කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ. එවැනි තොරතුරු ලබාගැනීමට හැකිවීම මෙම සංවාදය ගොඩනැගීමට උපකාරවන ධනාත්මක සාධකයක් වනු ඇත.

සන්ධිස්ථාන :

3.1. සෞඛ්‍ය සම්බන්ධ මුදල් ප්‍රතිපාදන සහ වැය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කිරීම.

3.2.. මහජන අදහස්විමසීම් තුළින් ජාතික සෞඛ්‍ය කාර්ය සාධන වැඩපිළිවෙල පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම.

3.3. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය, පුවත්පත්, රේඩියෝ, රූපවාහිනී, මහජන ප්‍රචාරක වැඩසටහන් සහ අන්තර්ජාලය ඔස්සේ ජාතික සෞඛ්‍ය කාර්යසාධන වැඩපිලවෙල ප්‍රචලිත කිරීම.

3.4. මහජන සංසදයක් හරහා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා පුරවැසියන් කාර්තුමය වශයෙන් සක්‍රියව සම්බන්ධවීම.

3.5. පසුවිපරම් ක්‍රියාකාරකම් සිදුකළාද යන්න සහතික වීම සඳහා සංසදය විසින් සොයාගත් තොරතුරු සහ ඉෂ්ඨ කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ රජයේ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම.

**වගකිව යුතු ආයතනය : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**උපකාරක ආයතන :** සර්වෝදය, රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය, මහජන සෞඛ්‍ය ව්‍යාපාරය
**ආරම්භක දිනය : ජූලි 2016**
**අවසන් දිනය : ජූලි 2018**

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවි ඔස්සේ 2016 -2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය: කිසිවක් නැත | විශේෂත්වය: අඩු | විශේෂත්වය: මධ්‍යම | විශේෂත්වය: ඉහළ | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: (ලියා ඇති ආකාරයට): තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය | ඇති විය හැකි බලපෑම: කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | සම්පූර්ණ කිරීම (මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු): ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | විය විවෘත රාජ්‍යයක් ද?: වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3. ජාතික සෞඛ්‍ය කාර්ය සාධනය | | | ✔ | | ✔ | ✔ | | ✔ | | | ✔ | | | ✔ / ✔ | | | | | ✔ | | |

**වගකීමේ අරමුණ :**
ජාතික සෞඛ්‍ය කාර්ය සාධන වැඩසටහන ස්ථාපනය සහ ඒ තුලින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය සාධනයට අදාළ තොරතුරු ලබාගැනීමට මහජනතාවගේ ප්‍රවේශය වැඩිදියුණු කිරීම මෙම වගකීමෙ අරමුණයි. සෞඛ්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඵලදායි, සාක්ෂිමත පදනම් වූ සංවාද ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා සක්‍රිය දායකත්වයක් ලබා දීමට මහජනතාව මෙම තොරතුරු භාවිතා කරනු අතැයි සෞඛ්‍ය අමාත්‍යාංශය අපේක්ෂා කරයි. එමෙන්ම ගුණාත්මක තීරණ ගැනීම් වැඩිදියුණු කිරීමට සහ මහජන සෞඛ්‍ය අංශය මුහුණදෙන පුළුල් අභියෝග අවම කිරීමට ද මේ තුළින් අපේක්ෂා කෙරේ.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**
මධ්‍යකාලය අවසන්වනවිට මෙම වගකීම ඉටුකර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. 2013 වසර සඳහා ඒකාබද්ධ ජාතික සෞඛ්‍ය මුදල් ගිනුම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් මස අන්තර් ජාලය ඔස්සේ ප්‍රකාශයට පත්කරන ලදි (3.1 සන්ධිස්ථානය). කෙසේ නමුත් අමාත්‍යාංශය විසින් මෑතකාලයේ අයවැය වාර්තා ප්‍රකාශයට පත්කර නැත.

මධ්‍ය කාලසිමාව අවසන් වන විට ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව අවසන් කොට නොතිබූ බැවින් මහජන අදහස් විමසීම් හෝ වෙනත් ක්‍රමවේද ඔස්සේ දැනුවත්භාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් සිදුකර නැත. රාමුව ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා මහජන සංසදයක් ද ස්ථාපිත කොට නැත (3.2 - 3. 5 සන්ධිස්ථානය).

**කාල සීමාව අවසන්වීමෙන් පසු**
මෙම වගකීම ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළත් වගකීමට අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණ ලෙස නිමා කර නොතිබිණි.

සන්ධිස්ථානය 3.1: 2017 කාර්ය සාධන වාර්තාව මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අයවැය දත්ත සහ වියදම් පිළිබඳ වැඩිදුර තොරතුරු ප්‍රකාශයට පත්කර ඇත. මෙම වාර්තාව භාෂා 3 න්ම ලබාගත හැක.

3.2 -3.5 සන්ධිස්ථාන : 2018 අප්‍රේල් සෞඛ්‍ය අමාතාංශය විසින් ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව ගොඩනගන ලද අතර එය අන්තර්ජාලය ඔස්සේ ප්‍රකාශයට පත්කර ඇත. රට තුළ සෞඛ්‍ය සේවාවන් පිළිබඳ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා රාමුවට නිර්ණායක 80 ක් ඇතුළත් කර ඇත. අමාත්‍යාංශයට අනුව මෙම නිර්ණායකයන් ගෙන් 50 කට ආසන්න ප්‍රමාණයක් සඳහා එයට අදාල දත්ත ලබාගත හැක.කෙසේ නමුත් මෙම දත්ත ගබඩාවෙන් ප්‍රයෝජනවත් තොරතුරු උකහාගෙන පහසුවෙන් භාවිතා කළ හැකි ආකෘතියට ඒවා ගොනු කළ යුතුව ඇත. සිවිල් සංවිධානවලට අනුව අමාත්‍යාංශය විසින් තම කාර්ය මණ්ඩලය ඒ පිළිබඳව නිසි ආකාරයට දැනුවත්කර නැති අතර මහජනතාව දැනුවත්කිරීම සඳහා ද කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නැත. සිවිල් සංවිධාන විසින් අවධාරණය කළ ආකාරයට සහ IRM පර්යේෂක පෙන්වා දුන් ආකාරයට අමාත්‍යාංශය තවමත් ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව සිංහල සහ දෙමල භාෂාවන්ට පරිවර්තනය කොට නැත.

රාමුව ක්‍රියාත්මක කිරීමට සහ එය අධීක්ෂණය කිරීම සඳහා ඒ සඳහා කැපවුනු නිලධාරීන් පත් කිරීම ඇතුළු ආයතනගත කිරීම සඳහා තව බොහෝ දේවල් කළ යුතුව ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත කලේය.කාලසීමාව අවසන්වනවිට පුරවැසියන් සහභාගිවන නියාමන සංසදය ද පිහිටුවා නොතිබුණි.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : සුළු**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් වී නැත**

මෙම වගකීම සමස්තයක් ලෙස තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීම සහ විවෘත රාජ්‍ය යන කාරණා තුළ සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත. කෙසේ නමුත් එය පුරවැසි සහභාගිත්වයේ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට දායක වී නැත.

ක්‍රියාකාරී සැලැස්මේ ආරම්භක අවස්ථාවේ සෞඛ්‍ය සේවාවන්ගේ වැඩිදියුණු වෙමින් පැවති අභියෝගවලට පිළියම් සෙවීම සඳහා රජය සහ සිවිල් සංවිධාන ගන්නා උත්සාහයන්ට සෞඛ්‍ය පිළිබඳ ගුණාත්මක සහ ප්‍රයෝජනවත් තොරතුරු නොමැතිකම බධාවක් වී ඇත. සෞඛ්‍ය සම්බන්ධයෙන් කාර්ය සාධන රාමුවක් නොමැතිවීම තුළ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා පැහැදිලි ඉලක්ක, ප්‍රගතියේ මිනුම් ලකුණු ගොඩනගා ගැනීමට, හෝ සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති යොදා ගැනීමට පාර්ශවකරුවන්ට නොහැකි වී ඇත.

තෛභාෂික වාර්ෂික කාර්ය සාධන වාර්තාව අමාත්‍යාංශයේ වෙබ් අඩවියට ඇතුලත් කිරීම ඔස්සේ අමාත්‍යාංශය අයවැය ප්‍රතිපාදන සහ වැය ශීර්ෂ ප්‍රකාශයට පත කර ඇත. සෞඛ්‍ය පිළිබඳ මූලික තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව මේ තුළින් වර්ධනය වූ බව සිවිල් සංවිධානවල මතයයි. මෙයට පෙර, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2013 සිට ඒකාබද්ධ ජාතික සෞඛ්‍ය ගිනුම් මෙන්ම සීමිත මූල්‍ය තොරතුරු ඇතුලත් සෞඛ්‍ය පිළිබඳ වාර්ෂික නිවේදන පත්‍රිකා ප්‍රකාශයට පත්කර ඇත.එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විශේෂිත දර්ශක හරහා සෞඛ්‍ය පද්ධතියේ කාර්ය

සාධනය මැනීම සඳහා අවශ්‍ය පසුබිම සලසන ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව  නිර්මාණය කොට ප්‍රකාශයට පත්කරන ලදි. කාර්යක්ෂමව ක්‍රියාත්මකව කළා නම් සෞඛ්‍ය සේවාවේ කාර්යක්ෂමතාව,ඵලදායිත්වය සහ සාධාරණත්වය පිළිබඳ මේ දක්වා අනාවරණය නොවූ විශාල පරාසයකින් යුත්  තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට මෙම රාමුව  පහසුකම් සලසාලන බව පාර්ශවකරුවෝ පිළිගත්හ.

කෙසේ නමුත්,ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව හරහා එක්රැස් කිරීමට අපේක්ෂා කළ ඇතැම් දත්ත ලබා ගත නොහැකි හෝ පහසුවෙන් පරිශීලනය කළ  නොහැකි බව සිවිල් සංවිධාන පෙන්වා දෙන ලදි. ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව සිංහල සහ දෙමළ යන භාෂාවන්ගෙන් පළකර නැති අතර දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා එය මහජනතාවට හඳුන්වා දී නැත. එමනිසා එම වගකීම තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව සඳහා දායකවී ඇත්තේ සුළු වශයෙනි.

ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ සංසදය ස්ථාපිත කර නැති බැවින් මෙම වගකීම පුරවැසි සහභාගිත්වය වර්ධනය කිරීමට ද දායක වී නැත.

**ඉදිරියට රැගෙන යායුතුද ?**

මෙම වාර්තාව පිළියෙල කරන අතරතුර ශ්‍රී ලංකාවට අදාළ  දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. කෙසේ නමුත් මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්මට රැගෙන යන ලෙස IRM පර්යේෂක නිර්දේශ කරයි. ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම තුළින්  සෞඛ්‍ය සේවාව හා අදාළ වැදගත් තොරතුරු සඳහා ප්‍රවේශමේ හැකියාව සැලකිවයුතු ප්‍රමාණයකින් වර්ධනය කළ හැකි අතර ඒ තුළින් වැඩිදියුණු වූ සෞඛ්‍ය සේවා පහසුකම් පිලිබඳ ඵලදායී සංවාදයක් ගොඩනැගීමට හැකි වනු ඇත.

සෞඛ්‍ය සම්බන්ධ තොරතුරු නොමැතිවීම සම්බන්ධයෙන් පිළියම් සෙවීමට සහ මෙම වගකීමේ බලපෑම ඉහළ නැංවීමට  අතිරේක ක්‍රියාමාර්ග කිහිපයක් 2016 – 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක විසින් නිර්දේශ කරයි. දත්ත රැස්කිරීමට කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වාදීමට ප්‍රමුඛතාව ලබාදීම, දත්ත එක්රැස්කිරීමට අයවැය ප්‍රතිපාදන හඳුන්වාදීම, ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව තුළින්  උකහා ගන්නා මූලික සහ පහසුවෙන් ප්‍රවේශවිය හැකි තොරතුරු ප්‍රකාශයට පත්කිරීම මෙයට ඇතුළත්ය.

# 2 වන තේමාව : අධ්‍යාපනය

## 4. ගුරුවරු බඳවා ගැනීමේ විනිවිදභාවයකින් යුත් ප්‍රතිපත්තිය

**වගකීමේ ආදර්ශ පාඨය :**

4. ශ්‍රී ලංකාවේ ගුරුවරු බඳවා ගැනීමේ ප්‍රතිපත්තියේ සහ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ අපක්ෂපාතිබව සහතික කිරීම.
[…]

**මූලික අරමුණ :**
ගුරුවරු බඳවා ගැනීමේ, පත්කිරීමේ, උසස්වීම් ලබාදීමේ සහ මාරු කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහතික කිරීම.
**සන්ධිස්ථාන :**

- 4.1 අධ්‍යපන අමාත්‍යාංශය විසින් ගුරුවරුන් තෝරාගැනීම, පත්කිරීම, මාරුකිරීම සහ විෂයන් තේරීම පිළිබඳව විනිවිදභාවයකින් යුතු නිර්ණායක සකස්කිරීම සහ ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ, පුවත්පත්වල(සියලුම භාෂාවන්ගෙන්) සහ නිත්‍ය චක්‍රලේඛ මගින් ප්‍රකාශයට පත් කිරීම. දත්ත පිළිබඳ විවෘත ආකෘති පත්‍රයක සහ ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දී ඇති විවෘත දත්ත සංචිතයක දත්ත කාණ්ඩ පවත්නාගෙන යාම.

- 4.2 පත්වීම් ලබාදීමේ ක්‍රියාවලිය සහ විෂය වෙන් කිරීමේ ක්‍රියාවලිය ඇගයීමට සහ තොරතුරු හුවමාරු කරගැනීම වැඩිදියුණු කිරීම සඳහා සහ ඇගයීම් නිර්දේශ මහජන බලප්‍රදේශය තුළ ප්‍රකාශයට පත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රජයේ සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන්ගෙන් සමන්විත ස්වාධීන ඇගයීම් කමිටුවක් පත් කිරීම.

- 4.3 ස්වාධීන ඇගයීම් කමිටුවේ වාර්තාව අමාත්‍යාංශයේ වෙබ් අඩවිය, මුද්‍රිත හා දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ මහජනතාව අතර විශාල වශයෙන් බෙදා හැරීම සහ සිවිල් සංවිධාන සමඟ අදහස් විමසීම් පැවැත්වීම.

**වගකිව යුතු ආයතනය :** අධ්‍යාපන අමාත්‍යාංශය
**උපකාරක ආයතනය(ආයතන)** : නැත

**ආරම්භක දිනය :** 2016 අගෝස්තු
**අවසන් දිනය :** 2018 ජුනි

සංස්කාරක සටහන : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවි ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ**
රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ පාසල් ගුරුවරු බඳවා ගැනීම, පත් කිරීම, උසස්වීම් ලබාදීම සහ මාරු කිරීම තුළ විනිවිදභාවය ඉහළ නැංවීම මෙම වගකීමේ අරමුණයි. මෙම ක්‍රියාවලීන් තුළ වඩාත්

විනිවිදභාවයක් ඇති කිරීම තුළින් ගුරුවරු බඳවා ගැනීමේ ගුණාත්මකබව නොනැසී පවත්වාගෙන

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | සැළු පෙනෙනහි |
| 4. විනිවිද භාවයකින් යුතු ගුරු ප්‍රත්පත්තිය | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | |

යාමට, දේශපාලන බලපෑම මත හෝ ක්ෂණික අවිධිමත් පත්වීම් ලබාදීමේ අවස්ථා වලක්වාළීමට සහ ගුරුවරු මාරු කිරීම සහ උසස්වීම් ලබාදීම වඩාත් සධාරණ අයුරින් සිදුකිරීමට දායක වේ.

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව : සිමාසහිත**

මධ්‍යකාලය අවසන්වනවිට මෙම වගකීමට අයත් කාර්යයන්ගෙන් අවසන් කර තිබුනේ සීමිත වැඩ කොටසක් පමණි.ගුරුවරු බඳවා ගැනීමේ සහ මාරු කිරීම හා අදාළ නිර්ණායක සහ නිල ක්‍රියාපටිපාටි ඇතුළත් මූලික තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එහි වෙබ් අඩවියට ඇතුලත් කර ඇත (සන්ධිස්ථාන 4.1).

මෙයට ගුරු මාරු ප්‍රතිපත්තිය සහ තෛභාෂික රාජ්‍ය චක්‍රලේඛ ඇතුළත් වේ. කෙසේ නමුත් ගුරුවරු පත්කිරීම් සහ උසස්වීම් ලබාදීම හා අදාළ තොරතුරුවල පවතින හිඩැස්, පරස්පර පරිවර්තන සහ විවිධ තලයන් තුළ තොරතුරු ප්‍රචාරය කිරීමට අසමත්වීම යන කාරණා අඛණ්ඩව පැවතිණ. ප්‍රකාශයට පත්කරන ලද දත්ත විවෘත දත්ත ආකෘතියක ලබාගත නොහැකිවිය.

මධ්‍යකාලය අවසන්වනවිට ගුරුවරු මාරු කිරීම සහ පත්කිරීමේ ක්‍රියාවලිය ඇගයීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බහුපාර්ශවකරුවන්ගේ ස්වාධීන ඇගයුම් කමිටුව පත්කර නොතිබුණි (4.2 - 4.3 සන්ධිස්ථාන).

**කාලය අවසන්වීමෙන් පසු : සීමාසහිත**

ක්‍රියාකාරී සැලැස්මට අදාළ කාලසීමාව පුරාම දුරකතනය සහ විද්‍යුත් තැපෑල ඔස්සේ නැවත නැවත උත්සාහ ගනු ලැබුවද අදහසක් ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කර ගත නොහැකි විය. කෙසේ නමුත් රාජ්‍ය අධ්‍යාපනය තුළ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකරන සිවිල් සංවිධානයක් වන විලුතු හි නියෝජිතයෙකු පැවසූ ආකාරයට මෙම වගකීම සම්බන්ධයෙන් මධ්‍ය කාලසිමාවේ සිට කිසිදු ප්‍රගතියක් සිදුවී නැත.

සන්ධිස්ථානය4.1-4.3:අධ්‍යාපන අමාත්‍යාංශය ගුරුමාරු ප්‍රතිපත්තිය පරිවර්තනය කොට එහි වෙබ් අඩවියට ඇතුලත් කර ඇති නමුත් ගුරුවරු බඳවා ගැනීම, පත්කිරීම සහ උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් අදාළ ඒකාබද්ධ දත්ත සහ තොරතුරු තවමත් ලබාගත නොහැකිව ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තවමත් ස්වාධීන බහුපාර්ශවකරුවන්ගේ ඇගයුම් කමිටුව ද පත්කර නැත.

**එය විවෘත ආණ්ඩුවක්ද ?**
**තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට ඇති හැකියාව : සුළු**
**පුරවැසි සහභාගිත්වය: වෙනසක් වි නැත**

මෙම වගකීම සමස්තයක් ලෙස තොරතුරු සඳහා ප්‍රවේශවීමේ සහ විවෘත පාලනයේ සුළු වර්ධනයක් සිදුකර ඇත. කෙසේ නමුත් එය පුරවැසි සහභාගිත්වයේ කිසිදු සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කිරීමට දායක වි නැත.

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේ සිටම ගුරුවරු බඳවා ගැනීම, පත්කිරීම, සහ මාරු කිරීම පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ නොමැතිවීම හෝ ඒවා සඳහා ප්‍රවේශවීමට නොහැකි වීම තුළින් අදහස්වන්නේ අදාළ තීරණ අවිධිමත්, කලාතුරකින් පක්ෂපාති වූ සහ/ හෝ බොහෝවිට දේශපාලන බලපෑම මත සිදුවූ ඒවා බවයි. මෙය ගුරුවරුන්ගේ ගුණාත්මක භාවය දුර්වලවීමට සහ එහි ප්‍රතිඵලයක් ලෙස රටේ අධ්‍යාපනය දුර්වලවීමට බලපානබව පාර්ශවකරුවන් ගේ මතයයි. අධ්‍යාපනය යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බලය බෙදා හැර ඇති විෂයකි.එබැවින් රටේ පළාත් නවය විසින් ඔවුන්ගේ පළාත් සභාව හරහා එකිනෙකට වෙනස් වූ ප්‍රතිපත්ති නිර්මාණය කළ හැක. ඒකාබද්ධ වූ ස්ථිර ප්‍රතිපත්තියක් නොමැතිකම පටහැනි ප්‍රමිතීන් සහ ගුරුවරු අතර ව්‍යාකූලත්වයක් නිර්මාණය කිරීමට දායක වි ඇත.

කෙසේ නමුත් වගකීම සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නංවා නැති බැවින් තොරතුරු සඳහා ප්‍රවේශ වීම සම්බන්ධයෙන් සුළු වර්ධනයක් ඇති වි ඇති බව විලුතු තහවුරු කළේය. අධ්‍යාපන අමාත්‍යාංශය ගුරු මාරු ප්‍රත්පත්තිය එහි වෙබ් අඩවියේ භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත් කර ඇති නමුත් බඳවා ගැනීම්, පත්කිරීම් සහ උසස්වීම් හා අදාළ දත්ත හා නිර්ණායක සඳහා තවමත් මහජනතාවට ප්‍රවේශ විය නොහැක.අමාත්‍යාංශය විසින් තොරතුරු විවිධ මාධ්‍යයන් අතර හුවමාරු කරගෙන හෝ විවෘත දත්ත ආකෘතියක තොරතුරු ලබා ගත හැකි සේ ඉදිරිපත් කර නැත.

පුරවැසි සහභාගිත්වය සම්බන්ධයෙන් කිසිදු වෙනසක් ඇති කිරීමට වගකීම දායකවී නැත.අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරුවරු කළමනාකරණය හා අදාළ ක්‍රියාවලි ඇගයීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ සංසදය පත් කර නැති බැවින් තීරණ ගැනීම් සම්බන්ධයෙන් මහජනතාවට දැනුම් දීමට අවස්ථාවක් සලසා නොමැත.

**ඉදිරියට රැගෙන යා යුතු ද ?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. කාලසීමාව අවසන්වන විට මෙම වගකීම පූර්ණ ලෙස නිමා කිරීමට නොහැකි වූ බැවින් මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන යායුතු බව IRM පර්යේෂක නිර්දේශ කරයි.

විශේෂයෙන්ම, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරුවරු බඳවා ගැනීම, පත්කිරීම සහ උසස් වීම් ලබා දීම පිළිබඳ නිර්ණායක සහ දත්ත ප්‍රකාශයට පත් කිරීම කඩිනම කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම. නිර්ණායක සහ දත්ත විවිධ තලයන් තුළ විවෘත ආකෘතියක ප්‍රකාශයට පත් කිරීම, එයට සමගාමීව අමාත්‍යාංශය විසින් ගුරුවරු කළමනාකරණයට අදාළ ක්‍රියාවලී ඇගයීම සඳහා සිවිල් සංවිධාන නියෝජිතයන් සහ පළාත් සභා නියෝජිතයන් ඇතුළු අදාළ සියලුම බහුපාර්ශවකරුවන් සමඟ අදහස් විමසීම් පැවැත්වීම මෙයට ඇතුලත් ය.

මෙම වගකීම ඉදිරියට ගෙන යාම සඳහා, IRM පර්යේෂක විසින් 2016 - 2017 IRM ප්‍රගති වාර්තාවේ ඇතුලත් පුළුල් නිර්දේශ නැවත නැවත සිහිපත් කරයි. මෙයට පාසල් ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා විමධ්‍යගත යාන්ත්‍රණයක් ගොඩනැගීම, සහ රජයේ පාසල් ගුරුවරුන් බඳවා ගැනීම, මාරු කිරීම ,පත්කිරීම, උසස්වීම් ලබාදීම හා අදාල පැමිණිලි භාරගැනීම සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා දුක්ගැනිවිලි සඳහා සහන සලසා දීමේ යාන්ත්‍රණයක් පළාත් සහ මධ්‍යම මට්ටමින් ගොඩනැගීම ඇතුළත්ය.

# 3 වන තේමාව : තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

## 5. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**
**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් පරිපූර්ණ, විනිවිදභාවයකින් යුත්, වගකිව යුතු කාර්යක්ෂම පාලනයක් සඳහා රජයේ තොරතුරු මධ්‍යස්ථානයේ සේවාවන් ඉහළ නැංවීම**(GIC-1919)**.**

ප්‍රධාන අරමුණ :
රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ සේවාවන් වැඩිදියුණු කිරීම සහ ඒ පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සහ රජයේ තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීමේ ප්‍රධාන ක්‍රියාකරු ලෙස සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය බලගැන්වීම.

සන්ධිස්ථාන :

- 5.1 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය විසින් ලබා දෙන සේවාවන් පිළිබඳ පුරවැසියන් දැනුවත් කිරීමට සහ ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතාවන් තක්සේරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, නැණසැල/ටෙලි මධ්‍යස්ථාන ජාලය සම්බන්ධ කරගැනීම (උදාහරණ සර්වෝදය ෆියුෂන් හි “IT යහමග” සහ “ICTA ස්මාර්ට් සමාජ කවයන් ”). සෑම මාස 6 කට වරක් එක් සමීක්ෂණ වාර්තාවක් පිළියෙල කිරීම සහ එය ප්‍රසිද්ධියට පත් කිරීම.
- 5.2 අදාළ මහජන සේවාවන් පදනම් කරගෙන ආයතනික දැනුම වර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතනවල ප්‍රධාන නවෝත්පාදක නිලධාරීන් පුහුණුකිරීම. සැසි 5 ක් - මෙහිදී සියලුම ප්‍රධාන රාජ්‍ය ආයතන(අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු,දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා සහ ප්‍රධාන ව්‍යවස්ථාපිත ආයතන ) ආවරණය කරමින් ප්‍රධාන නවෝත්පාදක නිලධාරීන් 50 ක් එක් සැසියකදී පුහුණු කරනු ලැබේ. අවශ්‍ය නම් පුහුණුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන දක්වා ව්‍යාප්ත කළ හැක.
- 5.3 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය යටතේ ආවරණය කරන ආයතන සංඛ්‍යාව වර්ධන කිරීම (GIC - 1919), ඇමතුම් මධ්‍යස්ථාන පහසුකම් 194 සිට 250 දක්වා වර්ධනය කිරීම, මෙම සේවාව හරහා ලබාදෙන පහසුකම් විවිධාංගිකරණය කිරීම- උදා - අවශ්‍යතාවේ ස්වභාවය පිළිබඳ සොයා බැලීම, විද්‍යුත් තැපෑල ඔස්සේ පුද්ගලිකව ප්‍රතිචාර දැක්වීම, කෙටි පණිවිඩ සහ සමාජ මාධ්‍යයන් මත දායකත්ව ලබා දීම ( 2017 වන විට ICTA සභාය ඇතිව අවම වශයෙන් සේවාවන් 2 ක් එක් ආයතනයකට හඳුන්වාදීම)
- 5.4 ප්‍රධාන සේවා 10 ක් (රාජ්‍ය තොරතුරු ඇමතුම් රෙජිස්ටරය භාවිතා කරමින් ICTA හඳුනාගත්) සහ පුරවැසියන් සඳහා කෙටි ඇමතුම් පහසුකම් සඳහා පුරවැසි සේවා ප්‍රඥාප්තිය (සේවාවන්හි ප්‍රමිතියේ වෙනස පෙන්නුම් කිරීම සඳහා සෑම සංවිධානයක් විසින්ම තමන්ගේ අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන්ගේ අදහස්විමසීම තුළින් පිළියෙල කරන ලද) තොරතුරු යාවත්කාලීන කිරීම සමඟ රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ සේවා තලයන් ඉහළ නැංවීම.
- 5.5 රජයේ ප්‍රධාන හවුල්කරුවන් (MTDI/ICTA/SLT), වෘත්තීය සමිති නියෝජිතයන් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ වැඩිදියුණු කරන ලද ව්‍යාපෘතිවල තොග ගණන් ගැනීම.

**වගකිව යුතු ආයතනය** : විදුලි සන්දේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය (Ministry of Telecommunication and Digital Infrastructure (MTDI)

**උපකාරක ආයතන** : ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායත (Information and Telecommunication Agency of Sri Lanka(ICTA) : සර්වෝදය ෆියුෂන්

**ආරම්භක දිනය** : 2016 ජුලි
**අවසන් දිනය** : 2017 දෙසැම්බර්

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම (මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු) | | | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විවෘතභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 5. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය | | | ✔ | | ✔ | | | ✔ | | ✔ | | | | ✔ | | | | ✔ | | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**වගකීමේ අරමුණ :** රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය විසින් ස්ථාපනය කර ඇති ඇමතුම් මධ්‍යස්ථානයේ සේවාවන් වැඩිදියුණු කිරීම සහ වෙබ් අඩවිය පිළිබඳ මහජන දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ශක්තිමත් කිරීම මෙම වගකීමේ අරමුණයි. වැඩි පුරවැසියන් ප්‍රමාණයක් පුළුල් පරාසයක විහිදී ඇති රජයේ ක්‍රියාකාරකම් සහ සේවාවන් පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශ වනු ඇතැයි මෙම වගකීම හරහා ප්‍රධාන පාර්ශවකරුවන් අපේක්ෂා කෙරේ.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**
මධ්‍යකාලය වනවිට වගකීමට නිමා කිරීමට හැකිවූයේ සීමිත ක්‍රියාකාරකම් කිහිපයක් පමණි. මූලික වශයෙන් විදුලි සන්දේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලැබූ අතර මධ්‍යකාලයේ දී කැපීපෙනෙන ජයග්‍රහණ කිහිපයක් අත්පත් කරගැනීමට හැකිවිය.
එනම් :

- ප්‍රධාන රාජ්‍ය ආයතන 30 ක් සඳහා ප්‍රධාන නවෝත්පාදක නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම (5.2 සන්ධිස්ථානය)
- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය විසින් ආවරණය කරන ආයතන සංඛ්‍යාව 320 දක්වා ඉහළ නැංවීම.(5.3 සන්ධිස්ථානය)
- සමාජ මාධ්‍යයන් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම ඇතුළු රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය හරහා ලබාගත හැකි සේවා සහ පහසුකම් වැඩි දියුණු කිරීම ( 5.3 සන්ධිස්ථානය)
- රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථායේ වෙබ් අඩවිය අලුත්වැඩියා කිරීමට සහ වැඩිදියුණු කිරීමට ටෙන්ඩර් කැඳවීම(5.4 සන්ධිස්ථානය)

මෙම ජයග්‍රහණයන් අත්පත් කරගනු ලබුවත් මෙම වගකීම යටතේ වූ සියලුම සන්ධිස්ථාන සම්පූර්ණ වශයෙන් ක්‍රියාවට නංවා නැත. උදාහරණයක් ලෙස රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය විසින් ලබාදෙන සේවා සම්බන්ධයෙන් පුරවැසි අවශ්‍යතා ඇගයීම සඳහා අමාත්‍යාංශයය විසින් සමීක්ෂණයක් පවත්වා නැත(5.1 සන්ධිස්ථානය) : සේවා වැඩි දියුණු කිරීම් සම්පූර්ණ කර නැත (5.3 සන්ධිස්ථානය): සේවා තලයන් අලුත්වැඩියා කර නොමැත (5.4 සන්ධිස්ථානය) : තොරතුරු පිළිබඳ පුරවැසි ප්‍රඥාප්තිය යාවත්කාලීන කරනැත (5.4 සන්ධිස්ථානය): හොඳින් ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල තොග ගණනය සිදුකර නැත (5.5 සන්ධිස්ථානය).

වැඩිදුර විස්තර සඳහා 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න

**කාල සීමාව අවසන් වූ පසු : සීමා සහිත**

කාලසීමාව අවසන්වනවිට මෙම වගකීම සම්පූර්ණ ලෙස සාක්ෂාත් කරගත නොහැකි විය.

සන්ධිස්ථා 5.1: විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුව රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය පිළිබඳ පුරවැසියන්ට වඩාත් හොඳ අවබෝධයක් ලබා දීම සඳහා නැවත ස්ථාපිත කරන ලද ජාතික මෙහෙයුම් කමිටුව විශාල වශයෙන් දායක වී ඇත. නිශ්චිත දත්ත ඔප්පුකර පෙන්විය නොහැකි වුවත් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය හරහා ඉලෙක්ට්‍රොනික රාජ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීම පිළිබඳ පුහුණුව ග්‍රාමීය පුරවැසියන් 9000 කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගෙන ඇතිබව අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලදි.ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය එහි 'ස්මාර්ට් සමාජ ජාලා කවය' තවදුරටත් ව්‍යාප්ත කර ඇති අතර ඒ හරහා රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය පිළිබඳ දැනුවත්භාවය තවදුරටත් වැඩිදියුණු වී ඇත. අවශ්‍ය කාර්යමණ්ඩලය නොමැතිකම උපුටා දක්වමින් විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය සමීක්ෂණ වාර්තා තවම පිළියෙල කර නැත.

5.2 සන්ධිස්ථානය : සිවිල් සංවිධාන තහවුරු කරන පරිදි විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය විසින් ප්‍රධාන නවෝත්පාදක නිලධාරීන් සඳහා ජාතික මට්ටමින් අතිරේක පුහුණු වැඩසටහන් 2 ක් පවත්වා ඇත. කෙසේ නමුත් ක්‍රියාකාරී සැලැස්ම යටතේ වැඩසටහන් 5 ක් ඉලක්ක කරගෙන ඇති අතර වැඩසටහන් 2 ක අඩුවක් තවම ඇත.

5.3 සන්ධිස්ථානය : 2018 මැයි මාසයේ දී රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ආයතන 320 ක් ආවරණය කර ඇත. මෙයින් අදහස් කරන්නේ මධ්‍යකාලයේ සිට අලුත් යමක් සිදුව නැති බවයි.

5.4 සන්ධිස්ථානය: රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ සේවා තලයන් ඉහළ නැංවීම සම්බන්ධයෙන් රජය සීමිත නමුත් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ වෙබ් අඩවිය සහ මුහුණුපොත සම්බන්ධයෙන් කරන ලද මූලික වැඩි දියුණු කිරීම්වලට අමතරව වෙබ් අඩවියේ රාජ්‍ය ආයතන 290 කට වඩා වැඩි ප්‍රමාණයක තොරතුරු ඇතුළත් කර ඇති බව විදුලි සන්දේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහන් කරන ලදි - මෙයින් බෙහෝමයක් ආයතන හඳුන්වාදී ඇත්තේ මෙම වගකීම ක්‍රියාත්මක කිරීමත් සමඟය. විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල

පහසුකම් අමාත්‍යාංශයේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කළ නමුත් නිශ්චිත සංඛ්‍යාව තහවුරු කරගැනීමට නොහැකි විය. මෙවැනි වාර්තාගත අභිවෘද්ධියක් තිබියදීත් ඇතැම් අවස්ථාවල අක්‍රියවීම සහ ප්‍රවේශවීමට නොහැකි වීම තුළ වෙබ් අඩවියට පිවිසීමේ හැකියාව නිශ්චිත වශයෙන් කිව නොහැකිබව IRM පර්යේෂක නිරීක්ෂණය කොට ඇත.පුරවැසි ප්‍රඥාප්තියේ තොරතුරු අන්තර් ජාලයට ඇතුළත් නොකළ බව විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය විසින් පිළිගන්නා ලදි.

5.5 සන්ධිස්ථානය: විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය විසින් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ, ඇමතුම් කළමනාකරණ මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන නියෝජිතායතනය සමඟ ප්‍රතිචාර පිළිබඳ සැසි අඛණ්ඩව පැවැත්වුවත් දත්ත සහ තොරතුරු රැස්කිරීමේ මෙම සැසි සඳහා වෘත්තීය සමිති සහ/ හෝ සිවිල් සංවිධානවල සහභාගිත්වයක් සිදුව නැත. මෙම වගකීමේ ප්‍රගතිය සඳහා කටයුතු කරන සර්වෝදය ෆියුෂන් ආයතනය විසින් මෙය සනාථ කරන ලදි.

**එය විවෘත රාජ්‍යයක් ද?**

**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීම හැකියාව : වෙනසක් සිදුවී නැත**

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන්ව ඇති ආකාරයට විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය හෝ විවෘත පාලනයේ වටිනාකම්වලට සීමිත ලෙස අදාල වෙමින් ඉලෙක්ට්‍රොනික පාලන වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන මූලික වශයෙන් ක්‍රියාත්මකවිය.

තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට දායක වූ, මෙම වගකීමේ එකම උපාංගය වන්නේ රාජ්‍ය තොරතුරු සම්බන්ධයෙන් පුරවැසි අවශ්‍යතා පිළිබඳ වූ සමීක්ෂණයයි. කෙසේ නමුත් මෙය සිදුකර හෝ ප්‍රකාශයට පත් කර නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ වැඩිදියුණු වීමක් හෝ පොදුවේ විවෘත පාලනයේ වැඩි දියුණුවක් මෙම උපාංගය තුළින් සිදුවී නැත.

කෙසේ නමුත්, විවෘත පාලනය සඳහා සීමාසහිතව අදාළ වුවත් විශේෂයෙන්, වැඩි දියුණු කරන ලද රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය හරහා පොදුවේ පාලනය තුළ විශාල දියුණුවක් ඇති කිරීමට මෙම වගකීම පුළුල් ලෙස දායක වි ඇති බව වගකීම ක්‍රියාත්මක කිරීමේ නිරත රාජ්‍ය සහ සිවිල් සංවිධාන ප්‍රධාන පාර්ශවකරුවන් විසින් සඳහන් කරන ලදි.

**ඉදිරියට රැගෙන යා යුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අතරතුර ශ්‍රී ලංකාව සඳහා වූ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ හෝ විවෘත පාලනයේ අගයන්ට මෙම වගකීම සීමිත අදාලත්වයක් දරන බැවින් මෙය ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම සඳහා රැගෙන නොයා යුතු බව IRM පර්යේෂක නිර්දේශ කරයි.

කෙසේ නමුත් දැනට පවතින සන්ධිස්ථාන ප්‍රතිශෝධනය කළ යුතු බව 2016 - 2017 මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක විසින් යෝජනා කරයි. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ සේවාවන්ට සාපේක්ෂව පුරවැසියන්ගේ අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම සහ එම වාර්තාව ප්‍රකාශයට පත්කිරීම රජය සතු තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට ඇති හැකියාව ඉහළ නංවනු ඇත. මීට අමතරව රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ යටිතල පහසුකම් හා සම්බන්ධ සක්‍රිය මෝබයිල් යෙදවුමක් නිර්මාණය කිරීම වැනි මෙම වගකීමේ බලපෑම ධනාත්මක අයුරින් ඉහළ නැංවිය හැකි අතිරේක නිර්දේශ ද පර්යේෂක ඉදිරිපත් කරයි.

වැඩිදුර තොරතුරු සඳහා,IRM 2016 - 2017 මධ්‍යකාලීන ප්‍රගතිවාර්තාව බලන්න.

# 6. විවෘත දත්ත ප්‍රවර්ධනය

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය**

**විවෘත දත්ත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා පුරවැසියන් වෙත ප්‍රතිලාභ ලබාදීම**

රජයට මෙන්ම පුරවැසියන්ට විවෘත දත්ත වල අවශ්‍යතාව විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය යටතේ හොඳින් අර්ථ දක්වා ඇත. කෙසේ නමුත් තවමත්,පුළුල් පරාශයක පැතිර සිටින පාර්ශවකරුවන්ට විවෘත දත්ත පිළිබඳ සංකල්පය තොරතුරු තාක්ෂණ උපායමාර්ගික භාවිතයෙන් එත්තු ගැන්විය යුතුව ඇත.එමෙන්ම , රජයේ විවෘතභාවයේ සීමාමායිම් නිශ්චය කරගැනීමට ද අවශ්‍යව ඇත. ඒ සඳහා රාජ්‍ය ප්‍රත්පත්තිමය මඟපෙන්වීමකින් අනිවාර්යකරන ලද ප්‍රමිතියකින් යුතු යාන්ත්‍රණයක් දත්ත විශ්ලේෂණය සඳහා නියම කළ යුතුය.විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අනෙකුත් සමාජික රටවල් සාර්ථක ලෙස අත්පත් කරගත් ප්‍රතිලාභ නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා පෙරලා පුරවැසියන් වෙත ළඟා විය යුතුය

**ප්‍රධාන අරමුණ :**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ තලයන් භාවිතා කරමින් විවෘත දත්ත ප්‍රවර්ධනය කිරීම සහ ඒ හා සමාන තාක්ෂණයන් භාවිතා කරමින් පුරවැසියන් එහි ප්‍රතිඵල භුක්ති විඳීම.

**සන්ධිස්ථාන :**

- 6.1 විවිධ රාජ්‍ය ආයතන වල දැනට පවතින දත්ත ඇතුළත් කරමින් www.data.gov.lk වෙබ් අඩවිය සංශෝධනය කිරීම ( ICTA විසින් #24 ව්‍යාපෘතිය).
- 6.2 රජයේ දත්ත කාණ්ඩ සඳහා ඇති පුරවැසි ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයක් කිරීම( ඥානසල හරහා/ස්මාර්ට් සමාජ කව හරහා).
- 6.3 තෙරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන විසින් පිළියෙල කරන ලද සැලැස්ම පදනම් කරගෙන දත්ත සහ සේවා වර්ගීකරණය (විවෘත දත්ත/දත්ත හුවමාරු කරගැනීමේ ප්‍රත්පත්තිය සමඟ) පිළිබඳ විවෘත අදහස් විමසීමක් සිදුකිරී.
- 6.4 විවිධ රාජ්‍ය ආයතනවල 89 ක් වූ වත්මන් දත්ත කාණ්ඩ ඉහළ නැංවීම - 2016 වන විට 200 දක්වා වර්ධනය කිරීම සහ 2018 වනවිට 500 ක් දක්වා වර්ධනය කිරීම( තෙරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන විසින්) .

**වගකිව යුතු ආයතනය** : විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය

**උපකාරක ආයතනය** : ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

**ආරම්භක දිනය** : ජූලි 2016
**අවසන් දිනය** : 2018 ජූලි

**සංස්කාරක සටහන :** ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම (මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු) | | | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | [illegible] සහ වගවීම සඳහා තාක්ෂණය සහ | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 6. විවෘත දත්ත ප්‍රවර්ධනය | | | ✔ | | ✔ | ✔ | | ✔ | | ✔ | | | | ✔<br>✔ | | | | | ✔ | | |

**වගකීමේ අරමුණ :**

මහජනතාවට වැදගත්වන තේමාවන් මත දත්ත සහ දත්ත ගබඩාවන් වෙත පහසුවෙන් ප්‍රවේශවීමට හැකි ආකාරයට පහසුකම් සැලසීම තුළින් "විවෘත දත්ත"සංකල්පය ප්‍රවර්ධනය කිරීම මෙම වගකීමේ අරමුණයි. එවැනි දත්තවලට බාධාවකින් තොරව ප්‍රවේශවීමේ හැකියාව රාජ්‍ය ප්‍රතිපත්ති හා අදාළ තොරතුරු සඳහා පුරවැසියන්ට පහසුවෙන් ප්‍රවේශවීමට මෙන්ම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට උපකාරවනවා මෙන්ම ඒ සඳහා හැකියාව ඇති කරන බව පාර්ශවකරුවන් යෝජනා කරයි. එමෙන්ම මෙම ප්‍රවේශය සිවිල් ප්‍රජාව තර්කානුකූල සංවාදයකට සහ උද්දේශන ක්‍රියාවන්ට යොමු කරවා මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයින්ට සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉඩකඩ සලසාලනු ඇතැයි ඔවුන් උපකල්පනය කරයි.

මෙය කර්ය ඉටුකිරීම සඳහා වගකීම විශේෂයෙන්ම පහත කාර්යන් ආරම්භ කළයුතුය :

- විවෘත දත්ත වෙබ් අඩවි සංචිතය දැනට ලබාගත හැකි දත්ත කාණ්ඩ සමඟ ප්‍රතිසංශෝධනය කිරීම, (www.data.gov.lk)
- රාජ්‍ය දත්ත කාණ්ඩ සඳහා පුරවැසි ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයක් සිදුකිරීම,
- ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් පිළියෙල කරන ලද දත්ත භුවමාරු කරගැනීමේ සැලැස්ම පදනම් කරගෙන දත්ත සහ සේවා වර්ගීකරණය පිළිබඳ විවෘත අදහස් විමසීමක් පැවැත්වීම,
- දැනට පවතින දත්ත කාණ්ඩ 89 ය ඉහළ නැංවීම සහ 2018 ජූලි මස වනවිට එය 500 දක්වා වර්ධනය කිරීම.

වැඩිදුර විස්තර සඳහා 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න.

**තත්ත්වය :**

**මධ්‍ය කාලසීමාව: සීමාසහිත**

මධ්‍ය කාලසීමාව අවසන්වනවිට වගකීම විසින් සම්පූර්ණ කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. 80 ට වඩා වැඩි දත්ත කාණ්ඩවලින් සමන්විත අන්තර් ජාලය ඔස්සේ වූ දත්ත සංචිතය ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය විසින් 2017 මැයි මස ප්‍රතිසංශෝධනය කර ඇත.

ප්‍රතිසංශෝධනයේ කොටසක් ලෙස නව විශේෂාංග හඳුන්වා දෙන ලදි. නව දත්ත කාණ්ඩ යෝජනා කිරීමට පරිශීලකයන් සඳහා විකල්ප, පහසුවෙන් අදාළ ස්ථාන වෙත පිවිසීම සඳහා හැඳුනුම් සංකේත ආරෝපිත කිරීම සහ ෆේස් බුක්, ට්විටර් සහ ලින්ක්ඩ්ඉන් වැනි සමාජ මාධ්‍ය ජාලයන්ට වෙබ්අඩවිය ඔස්සේ සම්බන්ධ කිරීම මෙයට ඇතුලත්ය.මෙය කැපී පෙනෙන වර්ධනයක් වුවද මෙම වගකීම යටතේ පවතින අනෙකුත් සන්ධිස්ථාන තවමත් අසම්පූර්ණව පවති. විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් සමීක්ෂණය සිදුකිරීම සඳහා උපදේශකවරයෙක් ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළත් මධ්‍ය කාලසීමාව වනවිටත් පුරවැසි අවශ්‍යතා සමීක්ෂණය අවසන් කිරීමට නොහැකි වි ඇත (6.2 සන්ධිස්ථානය).

එසේම, විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් දත්ත වර්ගීකරණය පිළිබඳ අදහස් විමසීමක් තවමත් සංවිධානය කර නැති බව රාජ්‍ය සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් විසින් තහවුරුකරන ලදි (6.3 සන්ධිස්ථානය). ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් දත්ත හුවමාරු කරගැනීමේ ප්‍රතිපත්ති කෙටුම්පතක් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර අන්තර් ජාලයේ දත්ත සංචිතයට ඇතුළත් කර ඇත. 2017 දෙසැම්බර් වනවිට අන්තර් ජාලයේ දත්ත සංචිතය පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර 9 ක් යටතේ වූ බහුරූපී දත්ත කාණ්ඩ 89 කින් සමන්විත විය( සන්ධිස්ථානය 6.4). 2018 ජූලි වනවිට අවසන් කිරීමට ඉලක්ක කරගත් 500 යෙහි කිසිදු වර්ධනයක් නොමැතිව සංචිතය මත ප්‍රකාශයට පත් කිරීම සඳහා නව දත්ත කාණ්ඩ හඳුනාගත්බව අමාත්‍යාංශය සඳහන් කළේය.

**කාලසීමාව අවසන් වූ පසු** : සීමාසහිත

කාලසීමාව අවසන්වනවිට මෙම වගකීම විසින් සම්පූර්ණ කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි.

6.1 සන්ධිස්ථනය : සම්පූර්ණ කර ඇත

6.2 සන්ධිස්ථානය : විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් පුරවැසි ඉල්ලුම පිළිබඳ පුරවැසි සමීක්ෂණය කාල සීමාව අවසන් වනවිටත් අවසන්කර නොතිබුණි. ඔවුන් පැවසුවේ කාලය සහ සම්පත් සම්බන්ධයෙන් බාධා තිබුණ බවයි.

6.3 සන්ධිස්ථනය: විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ නියෝජිතායතනය විසින් කාලසීමව අවසන් වනවිටත් දත්ත සහ සේවාවන් වර්ගීකරණය පිළිබඳ විවෘත අදහස් විමසීමක් සිදුකර නොතිබුණි. ජාතික දත්ත හුවමාරු කරගැනීමේ ප්‍රතිපත්තියේ කෙටුම්පත අන්තර් ජාලයේ දත්ත සංචිතය තුළින් අඛණ්ඩවම ලබාගැනීමට හැකිව තිබුණද විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යවරයා විසින් නිල ගැසට් පත්‍රයේ එය තවම පළ කර නැත. යාවත්කාලීන කරන ලද ශ්‍රී ලංකාවේ රාජ්‍ය ඉලෙක්ට්‍රොනික ප්‍රතිපත්තියේ ඇමුණුමක් ලෙස ප්‍රතිපත්තිය කටයුතු කරන බවට සහ මහජන ඇගයීම් සඳහා එය ලබාගත හැකි බව විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය පවසන ලදි.

6.4 සන්ධිස්ථනය: විවෘත දත්ත සංචිතය මත නව දත්ත කාණ්ඩ 500 ක් හඳුන්වාදීමට රජය අපොහොසත් වී ඇත. විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුව 2018 ජූනි 12 වෙනිදා වන විට කාණ්ඩ 11 ක් යටතේ දත්ත කාණ්ඩ 118 ක් හඳුන්වාදී ඇත.තවද විවෘත දත්ත කාණ්ඩ සඳහා වගකිවයුතු රාජ්‍ය නිලධාරීන් නම්කර ඇති බව විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහන් කළේය. තහවුරු කිරීම සඳහා තවදුරටත් සාක්ෂි ඉදිරිපත් නොකලත් දැනට පවතින දත්ත කාණ්ඩවල ගුණාත්මකබව ඇගයීම සඳහා විවෘත දත්ත පිළිබඳ

කමිටුවක් අභ්‍යන්තරිකව ස්ථාපිත කළ බව විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය වාර්තා කරන ලදි.

**එය විවෘත රාජ්‍යයක් ද ?**
**තොරතුරු ලබාගැනීමට පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : සුළු**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් වී නැත**

සමස්තයන් ලෙස මෙම වගකීම තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාවේ සහ විවෘත රාජ්‍ය තුළ සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත. කෙසේ නමුත් එය පුරවැසි සහභාගිත්වයේ සැලකිය යුතු වෙනසක් ඇති කිරීමට දායකවී නැත.
ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදී විවෘත දත්ත පිළිබඳ අදහස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සතුව කිසිදු අත්දැකීමක් නොවීය. දත්ත සමඟ මහජන සම්බන්ධතාව සීමාසහිත බව සහ ඒ හේතු කොට ගෙන දත්ත සඳහා විවෘත ප්‍රවේශය තුළින් ඇති විය හැකි ප්‍රතිලාභ සැලකිය යුතු ආකාරයට අඩපණ කර ඇති බව තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ නියෝජිතායතනය ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවෝ විශේෂයෙන් පිළිගත්හ. “විවෘත දත්ත” භාවිතය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් මෙම වගකීම මේ සඳහා පිළියම් සෙවීමට උත්සාහ ගෙන ඇත.
මෙම වගකීම හරහා විදුලිසංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ නියෝජිතායතනය විසින් නව සහ වැඩිදියුණු කරන ලද දත්ත කාණ්ඩ විවෘත දත්ත සංචිතය තුළ පළ කරන ලදි. පාර්ශවකරුවන්ට අනුව මෙය දත්ත සඳහා පුරවැසි ප්‍රවේශය වර්ධනය කිරීමට පමණක් නොව ඔවුන්ට සංචිතය සමඟ සම්බන්ධවී කටයුතු කිරීමට එය අවස්ථාව සලසා ඇත. ඊට අමතරව නව විශේෂාංග රැසක් සමඟ විවෘත දත්ත සංචිතය ප්‍රතිසංශෝධනය කිරීමට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ නියෝජිතායතනය ගත් උත්සාහයන් දත්ත හිමිකරුවන් සහ දත්ත භාවිතා කරන්නන් අතර සම්බන්ධතාවය වර්ධනය කිරීමට උපකාර වූ බව සිවිල් සංවිධාන පැවසුහ.
කෙසේ නමුත් පරිහරණය කරන ලද වෙබ් අඩවි සංඛ්‍යාව පිළිබඳ සංඛ්‍යා ලේඛන රජය හෝ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් විසින් ලබා නොදුන් අතර විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් පුරවැසි ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සිදුකර නැත. සංචිතය තුළ දත්ත කාණ්ඩ 500 ක් හඳුන්වාදීමට විදුලිසංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය අපොහොසත් වී ඇත( 2018 ජුනි 12 වනවිට දත්ත කට්ටල 118 ක් පමණක් ප්‍රකාශයට පත් කර ඇත).
එහි ප්‍රතිඵලයක් ලෙස වගකීම විසින් තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳ සුළු වර්ධනයක් පෙන්නුම්කර ඇත. විවෘත දත්ත වර්ගීකරණය පිළිබඳ විවෘත අදහස් විමසීමක් සිදුකිරීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ පුරවැසියන් සහභාගිකරවීමට අවස්ථාව සලසා දීම සඳහා හොඳ අවස්ථාවක් බව සිවිල් සංවිධාන හඳුනාගෙන ඇත. කෙසේ නමුත් අමාත්‍යාංශය හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය දත්ත වර්ගීකරණය පිළිබඳ කිසිදු මහජන අදහස් විමසීමක් පවත්වා නැති බැවින් මෙම වගකීම පුරවැසි සහභාගිත්වය වර්ධනය කිරීමට දායක වි නැත.

**ඉදිරියට රැගෙන යා යුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. කෙසේ නමුත් මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්මට රැගෙන යාමට IRM පර්යේෂක නිර්දේශ කරයි. ඉක්මනින් ප්‍රවේශ විය හැකි දත්ත සංචිතයක්, පුරවැසි අවශ්‍යතාවන් ඉටුකළ හැකි දත්ත කාණ්ඩවල පුළුල් එකතුවක්, පැහැදිලි,විධිමත් වර්ගීකරණය සහ හුවමාරු කළ හැකි දත්ත රූපසටහන් මඟින් දැක්වීම යන දෑ ශක්තිමත් සහ කාර්යක්ෂම විවෘත දත්ත පද්ධතියක පදනම ස්ථාපනය කරන බව පර්යේෂක විශේෂයෙන් යෝජනා කරයි.
2016 - 2017 දක්වා වූ IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව තුළ IRM පර්යේෂක විසින් මෙම වගකීමේ බලපෑම ශක්තිමත් කිරීමට නිර්දේශ කිහිපයක් යෝජනා කරන අතර විවෘත දත්ත පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයේ දි අර්ථසම්පන්න පුරුවැසි සහභාගිත්වයක් ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම, රාජ්‍ය දත්ත සහ දත්ත සංචිතය සමඟ දැඩි මහජන සම්බන්ධතාවක් ගොඩනැංවීම සඳහා දිරිගැන්වීම මෙයට ඇතුලත් වේ.

# 4 වන තේමාව: පරිසරය

## 7. ජාතික පරිසර පනතේ සංශෝධන

**වගකීමේ ආදර්ශ පාඨය**

**විනිවිදභාවයකින් යුත් පාරිසරික තීරණ:මූලික පාරිසරික පරීක්ෂණ සහ රාජ්‍ය වගවීම පිළිබඳ මහජන අදහස් පිළිබඳ අදහස් දැක්වීමට මහජනතාවට ඇති අයිතිය නැවත ස්ථාපිත කිරීම**

[...]

**මූලික අරමුණ :**

පාරිසරික තීරණ ගැනීමේදී මහජන සහභාගිත්වය සහ විනිවිදභාවය සහ මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ මහජන අදහස් සම්බන්ධයෙන් රජයේ වගවීම සහතික කිරීම.

සන්ධිස්ථාන :

- 7.1 ජාතික පාරිසරක පනත සහ එහි රෙගුලාසි සඳහා සංශෝධනවල අවශ්‍යතාවය වෙනුවෙන් පෙනී සිටීම සඳහා මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය සමඟ රැස්වීම්/සාකච්ඡා එකක් හෝ දෙකක් පැවැත්වීම
- 7.2 මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරසරික බලපෑම ඇගයීම සම්බන්ධයෙන් ලැබුණ මහජන අදහස් පිළිබඳ රජයේ වගවීම සහතික කිරීම සඳහා සහ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලි සඳහා මහජන සහභාගිත්වය පිළිබඳ විධිධාන නැවත ස්ථාපිත කිරීම සඳහා ජාතික පාරිසරක පනතට සංශෝධන සහ එහි රෙගුලාසි කෙටුම්පත් කිරීම. ජන සුබ සදන නීති පදනමට මෙම කාර්ය සඳහා මහවැලි සංවර්ධන අධිකාරියට සහ මධ්‍යම පරිසර අධිකාරියට සහාය විය හැක.
- 7.3 පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද ඉහත සඳහන් විධිවිධාන සමඟ ජාතික පාරසරික පනතට සහ රෙගුලාසිවලට සංශෝධන එකතු කිරීම.
- 7.4 මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික පාරිසරික පනතට සහ එහි රෙගුලාසි සඳහා වූ සංශෝධන බලාත්මක කිරීම.
- 7.5 ප්‍රමාණවත් කාර්යමණ්ඩලය, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් සමඟ පාරසරික බලපෑම් ඇගයීමේ ඒකකය සහ පළාත් ශාඛා ශක්තිමත් කිරීම තුළින් මධ්‍යම පරිසර අධිකාරය විසින් ජාතික පරිසර පනතේ ඉහත සඳහන් සංශෝධන සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.
- 7.6 අදාළ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා පහත සඳහන් කාරණා පිළිබඳ ආසන්න වශයෙන් වැඩමුළු 3 ක් පැවැත්වීම:
  - (A) ජාතික පාරිසරික පනතේ සංශෝධන සහ රෙගුලාසිවලට අනුව මූලික පාරසරික පරීක්ෂණ පිළිබඳ මහජන අදහස් ලබා ගැනීමේ අවශ්‍යතාව :
  - (B) රජයේ වගවීම පිළිබඳ විධිවිධාන

- 7.7 සිවිල් සමාජය දැනුවත්කිරීමේ වැඩසටහන් සහ තොරතුරු බෙදාහැරීම :
  - A. ජාතික පරිසර පනතේ සංශෝධන සහ රෙගුලාසිවලට අනුව මූලික පාරිසරික පරීක්ෂණ සඳහා මහජන සහභාගිත්වය හා අදාළ විධිවිධාන සහ ඒ සම්බන්ධයෙන් ඵලදායි සහ වගකීම් සහිත අදහස් ඉදිරිපත් කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ

නැවත හඳුන්වාදීම සහ රජයේ වගවීම හා සම්බන්ධ විධිවිධාන පිලිබඳව සිවිල් සමාජය දැනුවත් කිරීම යන කාරණා දෙක සම්බන්ධයෙන් රජයට අයත් රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවේ වෙන් වෙන් වශයෙන් වැඩසටහන් 4 ක් ආසන්න වශයෙන් විකාශනය කිරීම.

B. මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවි ඔස්සේ ඉහත සඳහන් තොරතුරු බෙදාහැරීම.

**වගකිව යුතු ආයතනය :** මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
**උපකාරක ආයතන:** මධ්‍යම පරිසර අධිකාරිය, ජන සුබ සදන නීති පදනම

**ආරම්භක දිනය** : 2016 ජූලි
**අවසන් දිනය** : 2018 ජූලි

සංස්කාරක සටහන : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

ක්‍රියාකාරී සැලැස්ම තුළ මෙම වගකීම විවිධ පාරසරික සංශෝධන වටා ගොඩනැගුන පැහැදිලි සන්ධිස්ථාන කාණ්ඩ 3 කින් සමන්විත වේ. කියවා අවබෝධ කරගැනීමේ පහසුව තකා IRM පර්යේෂක විසින් 8 සහ 9 වගකීමේ අංගයක් ලෙස අනෙකුත් සන්ධිස්ථාන ඇගයීමට ලක්කරනු ඇත.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 7. ජාතික පරිසර පනත | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | | | | ✔ | | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**වගකීමේ අරමුණ :**
පාරසරික තීරණ තුල මහජන සහභාගිත්වය, විනිවිදභාවය සහ රජයේ වගවීම සහතිකවීම මෙම වගකීමේ අරමුණුයි. මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ මහජන අදහස් දැක්වීම නැවත ස්ථාපිත

කිරීමෙන්, මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම ඇගයීම පිළිබඳ මහජන අදහස්වලට ප්‍රතිචාර දැක්වීමේ රජයේ වගවීම සහතිකවීමෙන් මෙකී අරමුණ ඉටුකිරීමට අපේක්ෂා කෙරේ. ජාතික පරිසර පනතේ අදාළ විධිවිධාන සංශෝධන සිදුකිරීම ද මෙයට අයත් වේ.

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**

මෙම වගකීම විසින් සම්පූර්ණ කිරීමට හැකිව ඇත්තේ සීමිත වැඩකොටසක් පමණි. ජාතික පරිසර පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරිය සමඟ රැස්වීම් සහ සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත ( 7 .1 සන්ධිස්ථානය). මෙහි ප්‍රතිඵලයක් ලෙස ජාතික පරිසර පනතට අවශ්‍යවිය හැකි සංශෝධන ලැයිස්තුවකින් යුත් සවිස්තරාත්මක සංකල්ප පත්‍රිකාවක් ගොඩනැගීමට හැකිව ඇත. මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය තුළ මහජන අදහස් ප්‍රකාශ කිරීම නැවත ඇතුළත් කිරීම සහ මූලික පාරසරික පරීක්ෂණ සහ පාරසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය තුළ රජයේ වගවීම සඳහා වූ විධිවිධාන මෙකී සංශෝධනයන්ට ඇතුළත් ව ඇත.

කෙසේ නමුත් මධ්‍යකාලීන ඇගයීම සිදුකරන අවස්ථාවේ සංශෝධිත කෙටුම්පත අවසන් කර හෝ ප්‍රසිද්ධියට පත්කර නොතිබුණි (7.2 -7.7සන්ධිස්ථානය) අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පරිසර පනත සඳහා විවිධ සංශෝධන කිහිපයක් පිළිබඳ සලකා බැලීමට එකවිට අඛණ්ඩ සාකච්ඡා වල නිරත විය. අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය සංශෝධන අවසන් කර නැති බැවින් වගකීමට අදාළ අනෙකුත් ක්‍රියාකාරකම් මධ්‍යකාලය වනවිට අවසන්වී නොතිබුණි.

වැඩිදුර විස්තර සඳහා 2016 – 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න.

**කාල සීමාව අවසන් වූ පසු - සීමාසහිත**

ජන සුබ සදන නීති පදනමේ සිවිල් සංවිධාන නියෝජිතයන්ට අනුව මධ්‍යම කාලයේ සිට මෙම වගකීමේ කිසිදු ප්‍රගතියක් දක්නට තිබී නැත.

( 7.1 -7.7 සන්ධිස්ථානය) : ක්‍රියාකාරී සැලැස්මේ විස්තර කර ඇති ආකාරයට ජාතික පරිසර පනත සඳහා වූ සංශෝධනයන්හි මහජන අදහස් ඉදිරිපත් කිරීම සඳහා සහ රජයේ වගවීම සම්බන්ධ විධිවිධාන ඇතුලත් කිරීමට පරිසර අමාත්‍යාංශය මූලික වශයෙන් එකඟවී ඇත. කෙසේ නමුත් ක්‍රියාත්මක කිරීමේ දෙවන අවුරුද්දේ දි මෙම විධිවිධාන සංශෝධන කෙටුම්පතෙන් ඉවත් කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත.

එසේ කිරීමට පෙර අමාත්‍යාංශය විසින් ඒ බව සිවිල් සංවිධානවලට දන්වා හෝ ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසා හෝ නැත. හඳුන්වාදීමට ඉතිරිව ඇති සංශෝධන සඳහා රටේ පාරසරික කළමනාකරණයට අදාලව යාවත්කාලී කරන ලද විධිවිධාන කවරේ ද යන්න සොයා බැලිය යුතුය. ජාතික පරිසර පනතට අදාළ සංශෝධන මීට පෙර සිදුකර ඇත්තේ 2000 වසරේ දීය. සංශෝධන වෙනස් කිරීමට රජය දක්වන පසුගාමීත්වය සිවිල් සංවිධාන විසින් හඳුනාගෙන ඇත්තේ මෙම වගකීම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම රටේ සංවර්ධනයේ වේගයට බධාවක් වේ යැයි රජය පැත්තෙන් විශ්වාසය කරන බවයි.

අදහසක් ලබා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය සහ /හෝ මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර ගැනීමට නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට ඇති හැකියාව : වෙනසක් සිදුවී නැත**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් වී නැත**

රට පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන සංවර්ධන වැඩසටහන් එකී ප්‍රදේශවල ජීවත්වන ජනගහනයට දැඩි අහිතකර බලපෑම් ඇති කරවන අතරම රටේ භෞතික පරිසරයට තර්ජනයක් වන බව මෙම වගකීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන අවස්ථාවේ සිවිල් සංවිධාන ප්‍රකාශ කර ඇත. සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට හෝ ඒවාට විරුද්ධව කාලෝචිත සහ දැනුවත් මහජන උද්දේශන සඳහා පහසුකම් සැලසීමෙන් මෙම වගකීම එවැනි ගැටළු සමනය කර ඇති බව සිවිල් සංවිධාන පවසන ලදි.

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදි මූලික පාරිසරික පරීක්ෂණ හා සම්බන්ධ පාරිසරික තීරණ තුල මහජන අදහස් සහ රජයේ වගවීම පිළිබඳ විධි විධාන ඇතුළත් කොට නැත. මහජන අදහස් සඳහා ප්‍රමාණවත් විධිවිධාන පාරිසරික බලපෑම ඇගයීමේ ඇතුළත්ව ඇති නමුත් ඒවාට දක්වන ප්‍රතිචාර සම්බන්ධයෙන් රජයේ වගවීමේ අවශ්‍යතාව ඒ තුළ ඇතුලත්ව නැත.
තවදුරටත් කරුණු සංයුක්ත කිරීමේ දී පාරිසරික බලපෑම ඇගයීමේ සහ මූලික පාරිසරික පරීක්ෂණ අතර වෙනස පිළිබඳ දුර්වල අර්ථ දැක්වීම් තුළින් අදහස් වන්නේ මහජනතාව සමඟ සුළු හෝ කිසිදු තොරතුරක් හුවමාරු කර නොගෙනම මූලික පාරිසරික පරීක්ෂණයෙන් පසු සංවර්ධන ව්‍යාපෘති අනුමත කළ හැකි බවයි. මෙම ක්‍රියාවලිය සඳහා මහජන අදහස් ඉදිරිපත් කිරීම සහ රජයේ වගවීම අනිවාර්ය කිරීම සඳහා විධිවිධාන ජාතික පරිසර පනතට ඇතුළත් කිරීමට සංශෝධන සකස් කිරීම තුළින් මෙම හිඩැස සඳහා පිළියම් සෙවීමට මෙම වගකීම උත්සාහ ගෙන ඇත.

සංශෝධන කෙටුම්පත් කිරීමට සහ ඒවා සම්මත කර ගැනීමට පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය පියවර ගනු ලැබුවත් මහජන ප්‍රතිචාර සහ රජයේ වගවීම සඳහා වූ යෝජිත විධිවිධාන ඉවත්කිරීම තොරතුරු ලබාගැනීමට පහසුවෙන් ප්‍රවේශ වීමට ගන්නා උත්සාහයන් හි ප්‍රගතිය අවහිර කර ඇත.වගකීම හඳුන්වා දීමට පෙර සංශෝධන යෝජනා කොට නොතිබූ බැවින් වගකීමට පෙර පැවති රාජ්‍ය භාවිතයන්හි තත්ත්වයේ වෙනසක් සිදුකර නැත.
මෙම පසුබිම තුළ පුරවැසි සහභාගිත්වයේ ද වෙනස් සිදුවී නැත: ආරම්භක ධනාත්මක ප්‍රගතිය නොතකා මහජන අදහස් සහ රාජ්‍ය වගවීම සඳහා වූ යෝජිත විධිවිධාන අමාත්‍යාංශය විසින් ඉවත් කිරීමෙන් පසුව පාරිසරික තීරණ ගැනීම සම්බන්ධයෙන් අර්ථාන්විත මහජන සහභාගිත්වයක් ගොඩනැංවීම කෙරෙහි එතරම් උනන්දුවක් පෙන්නුම් කර නැත. ශ්‍රී ලංකා ජනාධිපති පරිසර අමාත්‍යාංශයේ අමාත්‍යධුරය දරන නිසා මෙම සංවර්ධනය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව සිවිල් සංවිධාන පෙන්වා දේ.

**ඉදිරියට රැගෙන යායුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. කාලසීමාව අවසන් වනවිට මෙම වගකීම විසින් නිමා කර තිබුණේ සීමිත වැඩකොටසක් බැවින් - ප්‍රධාන පාර්ශවකරුවන් අතර ඇති උනන්දුවේ සැලකිය යුතු අඩුවක් පෙන්නුම් කර ඇත - IRM පර්යේෂක මෙම වගකීම සඳහා වූ ප්‍රවේශය නැවත සලකා බලන ලෙස නිර්දේශ කරයි.
එම වගකීම වත්මන් ස්වරූපයෙන් ම ඉදිරියට රැගෙන නොයන ලෙස පර්යේෂක විශේෂයෙන්ම නිර්දේශ කරයි. කෙසේ නමුත් විෂය පිළිබඳ වැදගත්කම, විශේෂයෙන්ම ඉදිකිරීම් විසින් මෙහෙයවනු ලැබූ ආර්ථික වර්ධන උපායමාර්ගය සලකා බලා පාරිසරික තීරණ ගැනීම සම්බන්ධයෙන් මහජන අදහස්වල සහ රජයේ වගවීමේ වටිනාකම නැවත පිරික්සා බැලීම සඳහා පරිසර අමාත්‍යාංශය

සහ මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරිය විසින් බහුපාර්ශවකරුවන්ගේ අදහස් විමසීමක් පැවැත්විය යුතු බව IRM පර්යේෂක යෝජනා කරයි.
මෙම අදහස් විමසීම්වලට රාජ්‍ය පාරසරික ආයතන, සිවිල් සංවිධාන සාමාජිකයන්, පරිසරවේදීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් ඇතුලත්විය යුතුය.
ඊට අමතරව, මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම ඇගයීම අතර ඇති පැහැදිලි වෙනස හඳුනාගැනීමට සඳහා පැහැදිලි මාර්ගෝපදේශ ගොඩනැගීමට රජය සහ සිවිල් සමාජ සංවිධාන එකට එක්ව වැඩ කළ හැකි බව සම්මුඛ සාකච්ඡාවකට සම්බන්ධ වූ සිවිල් සංවිධාන නියෝජිතයෙකු යෝජනා කරන ලදි.

## 8. වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත සංශෝධන

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**

**විනිවිදභාවයකින් යුත් පාරසරික තීරණ : මූලික පාරසරික පරීක්ෂණ සහ මහජන අදහස් පිළිබඳ රාජ්‍ය වගවීම සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මහජනතාවට ඇති අයිතිය නැවත ස්ථාපිත කිරීම.**
(B) - වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත

[...]
**ප්‍රධාන අරමුණු :**
පාරිසරික තීරණ ගැනීම තුළ විනිවිදභාවය සහ මහජන සහභාගිත්වය සහ මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ මහජන අදහස් පිළිබඳ රජයේ වගවීම සහතිකවීම.

**සන්ධිස්ථාන :**

- 8.1 වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත ,වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා අදාළ සංශෝධන ඇතුලත් කිරීමේ අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සමඟ රැස්වීම්/සාකච්ඡා එකක් හෝ දෙකක් පැවැත්වීම.
- 8.2 මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරසරික බලපෑම් ඇගයීම පිළිබඳ ලැබෙන මහජන අදහස් පිළිබඳ රජයේ වගවීම සහතිකවීමට සහ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය තුළ මහජන සහභාගිත්වය පිළිබඳ විධිවිධාන ඇතුලත් කිරීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත, වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා සංශෝධන කෙටුම්පත් කිරීම. මෙම කාර්යයේදී ජන සුබ සදන නීති පදනමට වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවට සහාය විය හැක.
- 8.3 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ඉහත සඳහන් විධිවිධාන සමඟ වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත, වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා සංශෝධන සකස් කිරීම.
- 8.4 වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත, වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා සිදුකරන ලද සංශෝධන බලාත්මක කිරීම.
- 8.5 ප්‍රමාණවත් කාර්යමණ්ඩලය, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් සමඟ එහි පාරසරික බලපෑම් ඇගයීමේ ඒකකය ශක්තිමත් කරමින් වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත, වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා සිදුකරන ලද සංශෝධන බලාත්මක කිරීමට පහසුකම් සැපයීම.

8.6 අදාළ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා පහත සඳහන් විෂයන් ඔස්සේ ආසන්න වශයෙන් වැඩමුළු 3 ක් පැවැත්වීම:

(A) වෙරළ සංරක්ෂණ සහ  වෙරළ සම්පත් කළමනාකරණ පනත, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා වූ සංශෝධනවලට අනුව

මූලික පාරසරික පරීක්ෂණ මහජනතාවට ප්‍රතිචාර දැක්වීම සඳහා විවෘත කිරීමේ අවශ්‍යතාව සහ:

(B) රාජ්‍ය වගවීම පිළිබඳ විධිවිධානන

- 8.7

A. රාජ්‍ය රූපවාහිනි සහ ගුවන්විදුලි නාලිකාව ඔස්සේ වෙන් වෙන්ව පහත සඳහන් මාතෘකා පිළිබඳ සිවිල් සමාජය දැනුවත් කිරීම සඳහා,අවම වශයෙන් වැඩසටහන් 4 ක් විකාශනය කිරීම -

(1) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා වූ සංශෝධනවලට අනුව මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ මහජන සහාගිත්වය හා අදාළ විධිවිධාන සහ ඒ සඳහා එලදායී සහ වගකීම් සහිතව අදහස් ඉදිරිපත් කරන්නේ කෙසේ ද යන්න හඳුන්වාදීම සහ (2) රාජ්‍ය වගවීම පිළිබඳ විධිවිධාන.

B. මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවි ඔස්සේ ඉහත සඳහන් තොරතුරු බෙදා හැරීම.

**වගකිව යුතු ආයතනය** :මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය

**උපකාරක ආයතනය:** වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
**ආරම්භක දිනය** : 2016 ජූලි
**අවසන් දිනය** : 2018 ජූලි

සංස්කාරක සටහන : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.
ක්‍රියාකාරී සැලැස්ම තුල විවිධ පාරිසරික සංශෝධනයන් වටා පැහැදිලි සන්ධිස්ථාන කාණ්ඩ 3 කින් මෙම වගකීම ඇතුළත් කර ඇත. කියවා පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයට IRM පර්යේෂක විසින් අනෙකුත් සන්ධිස්ථාන 7 සහ 8 වන වගකීමේ කොටසක් ලෙස ඇගයීමට ලක්කෙරේ.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරීත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විවෘතභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 8. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත | | | | ✔ | ✔ | ✔ | | | | | ✔ | | | ✔ (මධ්‍ය කාලසීමාවව) | | | | ✔ | | | |
| | | | | | | | | | | | | | | ✔ (කාලය අවසන් වූ පසු) | | | | | | | |

**වගකීමේ අරමුණ :**
වෙරළ සංවර්ධන ව්‍යාපෘති තුළ මහජන සහභාගිත්වය,විනිවිදභාවය සහ රාජ්‍ය වගවීම සහතික කිරීම මෙම වගකීමේ අරමුණයි.
මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ අදහස් දැක්වීමට මහජනතාවට ඇති අයිතිය හඳුන්වාදෙමින් සහ මූලික පාරසරික පරීක්ෂණ සහ පාරසරික බලපෑම ඇගයීම පිළිබඳ මහජන අදහස්වලට ප්‍රතිචාර දැක්වීමේ රජයේ වගවීම සහතික කරමින් මෙම වගකීම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කර ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීම මෙයට මූලික වශයෙන් අයත් වේ.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**
මධ්‍යකාලය අවසන්වනවිට මෙම වගකීම විසින් සම්පූර්ණ කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. පරිසර අමාත්‍යාංශය, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ සංශෝධන සහ එහි රෙගුලාසි පිළිබඳව මූලික අභභ්‍යන්තර සාකච්ඡා ආරම්භ කොට ඇත (8.1 සන්ධිස්ථානය).
මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ මහජන අදහස් ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සහ මූලික පාරිසරික පරීක්ෂණ හෝ පාරසරික බලපෑම ඇගයීමේ ක්‍රියාවලිය හරහා ලැබෙන අදහස්වලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් රජයේ වගවීම හඳුන්වාදීම පිළිබඳ සාකච්ඡා මෙයට ඇතුළත් වේ. කෙසේ නමුත්, ජන සුබ සදන නීති පදනමට අනුව මෙම මූලික සාකච්ඡා අදාළ සංශෝධන කෙටුම්පත් කිරීම දක්වා ඉදිරියට ගෙන ගොස් නැත(සන්ධිස්ථාන8.2 -8.7).මෙය ලියන අවස්ථාවේ සාකච්ඡා කළයුතු සහ අපේක්ෂිත සංශෝධන වලට ඇතුලත් කළයුතු විවිධ ගැටළු ගණනාවක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ගොනුකරමින් ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම වගකීම යටතට අයත් අනෙකුත් සියලුම ක්‍රියාකාරකම් මධ්‍ය කාලසීමාව වනවිට අවසන්ව නොතිබිණ.

**කාලසීමාව අවසන් වූ පසු** : සීමාසහිත

7 වන වගකීම මෙන් මෙම වගකීම මධ්‍ය කාලයේ සිට කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැත.

8.1 - 8 .7 සන්ධිස්ථානඃ මහජන අදහස් ලබා ගැනීම සඳහා සහ රාජ්‍ය වගවීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීමේ මූලික සාකච්ඡා පවත්වා නැත. සිවිල් සංවිධානවලට අනුව ඒ හා අදාළ විධිවිධාන සංශෝධන කෙටුම්පතින් ඉවත් කිරීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව තීරණය කර ඇති අතර ඒ හේතු කොටගෙන එහි ප්‍රගතිය ඇණහිට ඇත. අමාත්‍යාංශය හෝ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙම විධිවිධාන ඉවත් කිරීමට පෙර සිවිල් සංවිධානවලින් අදහස් විමසා හෝ ඔවුන්ට ඒ බව දැනුම්දී හෝ නැත. මෙම සංශෝධනයන් සිදුකිරීම සම්බන්ධයෙන් රජය වැඩි උනන්දුවක් නොදක්වන්නේ එම වගකීම ක්‍රියාත්මක කිරීම කඩිනම් වෙරළ සංවර්ධන කටයුතුවලට බාධාවක් වනු ඇතැයි රජය විශ්වාස කරන නිසා යැයි සිවිල් සංවිධාන අනුමාන කරයි.
අදහසක් ලබා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය හෝ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගැනීමට නොහැකි විය.

**එය විවෘත රාජයක් ද?**
**තොරතුරු ලබාගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව - වෙනසක් වි නැත**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් වි නැත**

පාරිසරික තීරණ තුළ මහජන අදහස් සහ රජයේ වගවීම සහතික කිරීමට පහසුකම් සැලසීම සඳහා ජාතික පරිසර පනත සංශෝධනය කිරීම අරමුණු කරගත් 7 වන වගකීම, මෙම වගකීම තුලින් පිළිඹිබු කෙරේ. ශ්‍රී ලංකාවේ වෙරළ තීරුවේ හා ඒ වටා සංවර්ධන වාපෘතිවල සහ ආර්ථික කටයුතුවල සීඝ්‍ර වර්ධනය වෙරළ කලාපයේ භෞතික පරිසරය වෙනස් කිරීමට සහ ස්වාභාවික වෙරළබඩ පරිසරය ක්‍රමික පිරිහීමකට ලක්කිරීමට දායකවන බවට මෙම වගකීම ක්‍රියාත්මක කරන අවස්ථාවේ සිවිල් සංවිධාන සිය කනස්සසල්ල පළ කර ඇත. පාර්ශවකරුවන්ට අනුව වෙරළ සංවර්ධන ව්‍යාපෘතිවලට විරුද්ධව හෝ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කාලෝචිත සහ දැනුවත් මහජන උද්දේශන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම තුළින් මෙම වගකීම වඩාත් යහපත් ලෙස ක්‍රියාත්මක කළ හැක.
ක්‍රියාකාරී සැලැස්මක ආරම්භයේ දි මූලික පාරිසරික පරීක්ෂණ හා සම්බන්ධ පාරිසරික තීරණ තුළ මහජන අදහස් හෝ රාජ්‍ය වගවීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත්ව නොතිබුණි. පාරසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය තුළ මහජන අදහස් සඳහා ප්‍රමාණවත් විධිවිධාන ඇතුළත් කර තිබුණත් ඒවාට ප්‍රතිචාර දැක්වීමේ රාජ්‍ය වගවීම පිළිබඳ කිසිවක් එහි ඇතුළත්ව නොතිබුණි.ගැටළුව තවදුරටත් සංකීර්ණ කරමින්, මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම අතර වූ වෙනස දුර්වල ලෙස අර්ථ දැක්වීම තුළින් සුළු හෝ කිසිදු තොරතුරුක් මහජනතාව සමඟ හුවමාරු කර නොගෙනම මූලික පාරිසරික පරීක්ෂණයකින් පසු සංවර්ධන ව්‍යාපෘති අනුමත කළ හැක. මහජන අදහස් සහ රාජ්‍ය වගවීම අනිවාර්ය කරමින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සහ එහි රෙගුලාසි සඳහා සංශෝධන ඇතුළත් කිරීම තුළින් මෙම අඩුපාඩු සඳහා විසඳුම් සෙවීමට මෙම වගකීම උත්සාහ ගෙන ඇත.
කෙසේ නමුත් වගකීම සම්පූර්ණයෙන් ක්‍රියාවට නංවා නැති අතර තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාවේ සැලකිව යුතු වර්ධනයක් ද සිදු වි නැත. මහජන අදහස් සහ රජ්‍ය වගවීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට විධිවිධාන ඇතුළත් කිරීමට පරිසර අමාත්‍යාංශය සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මූලික සාකච්ඡාවන්හි නිරත ව ඇති බව රාජ්‍ය සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් විසින් තහවුරු කරන ලදි. කෙසේ නමුත්, පසුව මෙම මූලික විධිවිධාන, සංශෝධන කෙටුම්පත්වලින් ඉවත් කිරීම තුළින් අදහස්වන්නේ තොරතුරු ලබා ගැනීම සඳහා මහජනතාවට පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳ රාජ්‍ය භාවිතයන්හි කිසිදු වෙනසක් ඇති වි නැති බවයි.
මෙම පසුබිම තුළ පුරවැසි සහභභාගිත්වය සඳහා වු ඇති ඉඩකඩ හිදි කිසිදු වෙනසක් ඇති වි නැත: අමාත්‍යාංශය විසින් මහජන අදහස් සහ රජයේ වගවීම සඳහා වූ යෝජිත විධිවිධාන ඉවත් කිරීම පාරිසරික තීරණ ගැනීම සම්බන්ධයෙන් අර්ථාන්විත පුරවැසි සහභභාගිත්වයක් ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම දුර්වල කර ඇත.

**ඉදිරියට රැගෙන යායුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අතරතුරු දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. 7 වන සහ 8 වන වගකීම පරිදි කාලසීමාව අවසන්වනවිට ප්‍රධාන පාර්ශවකරුවන් අතර සුළු උනන්දුවක් සහිතව සීමිත වැඩකොටසක් ක්‍රියාවට නංවා තිබිණ. එමනිසා මෙම වගකීමට ප්‍රවේශ වන ආකාරය පිළිබඳ නැවත සලකා බලන ලෙස පර්යේෂක විසින් නිර්දේශ කරන අතර මෙම වගකීම එහි වත්මන් ස්වරූපයෙන්ම ඉදිරියට රැගෙන නොයන ලෙස ද යෝජනා කරයි.
කෙසේ නමුත් 7 වන වගකීම පරිදි පරිසරය හා සම්බන්ධ තීරණ ගැනීමේ දි මහජන අදහස් සහ රාජ්‍ය වගවීමේ වැදගත්කම නැවත පිරික්සීමට සහ මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරසරික බලපෑම ඇගයීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ ගොඩනැගීම සඳහා එක්ව කටයුතු කිරීමට පරිසර අමාත්‍යාංශය සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුව බහුපාර්ශවකරුවන්ගේ අදහස්විමසීමක් කැඳවිය යුතු බව පර්යේෂක යොජනා කරයි.

# 9. වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථා සංශෝධනය

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**

**විනිවිදභාවයකින් යුත් පාරිසරික තීරණ: මූලික පාරිසරික පරීක්ෂණ සහ මහජන අදහස් පිළිබඳ රජයේ වගවීම සම්බන්ධයෙන් මහජනතාවට අදහස් ඉදිරිපත් කිරීමේ අයිතිය ස්ථාපිත කිරීම.**
(C) – වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථා සංශෝධනය

[...]

ප්‍රධාන අරමුණ :

මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම් ඇගයීම පිළිබඳ මහජන අදහස් පිළිබඳ රජයේ වගවීම සහතික කිරීම.

සන්ධිස්ථාන :

- 9.1 මූලික සාකච්ඡා : වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාව සහ එහි රෙගුලාසි සඳහා අදාළ සංශෝධන ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පෙන්වාදීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වයඹ පළාත් පරිසර අධිකාරිය සමඟ වෙන් වෙන් වශයෙන් රැස්වීම්/සාකච්ඡා එකක් හෝ දෙකක් පැවැත්වීම.
- 9.2 වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාව සඳහා සංශෝධන කෙටුම්පත් කිරීම: මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම ඇගයීම සම්බන්ධයෙන් ඉදිරිපත්වන මහජන අදහස් පිළිබඳ රජයේ වගවීම සහතික කිරීම සඳහා වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනතට සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාව එහි රෙගුලාසි සඳහා අදාළ සංශෝධන සහ කෙටුම්පත් කිරීම.
- . 9.3 වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම:වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනතට සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාවට සහ එහි රෙගුලාසි සඳහා ඉහත සඳහන් විධිවිධාන සමඟ සංශෝධන පාර්ලිමේන්තුවෙන් සහ වයඹ පළාත් සභාවෙන් සම්මත කරගැනීම.
- 9.4 බලාත්මක කිරීම: වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාව සහ එහි රෙගුලාසි සඳහා සංශෝධන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සහ වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් බලාත්මක කිරීම.
- 9.5 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වයඹ පළාත් පරිසර අධිකාරිය පහසුකම් සැලසීම:ප්‍රමාණවත් කාර්යමණ්ඩලය, අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සහ අනෙකුත් පහසුකම් ලබා දීම තුළින් පාරිසරික බලපෑම ඇගයීමේ ඒකකය ශක්තිමත් කිරීම තුළින් වනසත්ව සහ වෘක්ෂලතා ආඥා පනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාවේ රෙගුලාසි සඳහා ඉහත සඳහන් සංශෝධන බලාත්මක කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් පහසුකම් සැපයීම.
- 9.6 රාජ්‍ය දැනුවත්කිරීමේ වැඩමුළු: රාජ්‍ය වගවීම පිළිබඳ විධිවිධාන පිළිබඳ අදාළ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා ආසන්න වශයෙන් වැඩමුළු 3 ක් පැවැත්වීම.

- 9.7 සිවිල් සංවිධාන දැනුවත්කිරීමේ වැඩසටහන් සහ තොරතුරු බෙදා හැරීම:
  (A) වන සත්ව සහ වෘක්ෂලතා ආඥාපනතේ සහ වයඹ පළාත් පරිසර ව්‍යාවස්ථාවේ රාජ්‍ය වගවීම හා සම්බන්ධ විධිවිධාන පිළිබඳ මහජනතාව දනුවත් කිරීම සඳහා රාජ්‍ය රූපවාහිනි සහ ගුවන්විදුලි නාලිකාවේ වෙන් වෙන්ව ආසන්න වශයෙන් වැඩසටහන් 4 ක් විකාශනය කිරීම.

  (B) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ වෙබ් අඩවිය හරහා ඉහත සඳහන් තොරතුරු බෙදා හැරීම.

**වගකිව යුතු ආයතනය** - තිරසාර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය : මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සහ වයඹ පළාත් පරිසර අධිකාරිය

**උපකාරක ආයතනය** : වනජීවී සංරක්ෂණ දෙපාර්තමෙන්තුව

ආරම්භක දිනය : 2016 ජූලි
අවසන් දිනය : 2018 ජූලි
සංස්කාරක සටහන : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවියේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.
කියවා පහසුවෙන් තේරුම් ගතහැකි වන ලෙස IRM පර්යේෂක විසින් 7 වන සහ 8 වන වගකීමේ කොටසක් ලෙස අනිකුත් සන්ධිස්ථාන ඇගයීමට ලක්කරනු ලැබේ .

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: (ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමා වව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ [illegible] | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 9. වනසත්ව සහ වෘක්ෂලතා ආඥා පනත සහ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථා සංශෝධනය | | | | ✔ | ✔ | ✔ | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | | |

**වගකීමේ අරමුණ :**

පාරිසරික තීරණ ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය වගවීම සඳහා පහසුකම් සැලසීම මෙම වගකීමේ අරමුණයි. මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම ඇගයීම සම්බන්ධයෙන් වන මහජන ප්‍රතිචාර සඳහා විධිමත් අනිවාර්ය රාජ්‍ය ප්‍රතිචාර මගින් මෙම වගකීම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කෙරේ.

මෙයට පහත සඳහන් ආයතන යටතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීම ඇතුලත් වේ. (1) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික විෂය පථය යටතේ වනසත්ව සහ වෘක්ෂතා ආඥාපනත (2) වයඹ පළාත් පරිසර අධිකාරියේ මූලික විෂය පථයට යටත්ව වයඹ පළාත් පරිසර ව්‍යවස්ථාව.

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව : ආරම්භ කර නැත**

මධ්‍ය කාලසීමාව වනවිට මෙම වගකීම ක්‍රියාවට නැංවීම ආරම්භ කර නොතිබුණ (9.1 -9.7 සන්ධිස්ථානය). වඩාත් හොඳින් බලාත්මක කිරීම සඳහා රෙගුලාසි අවශ්‍ය වන බවට පාර්ශවකරුවන් එකඟ වුවත් එයට තවදුරටත් සංශෝධන අවශ්‍ය නොවන බව ජනසුබ සාදන නීති පදනම අනුමාන කරයි. මහජන අදහස් ඉදිරිපත් කිරීම හා අදාළ විධිවිධාන පවතින නීතිවල ඇතුළත්ව ඇති බව ජනසුබ සාදන නීති පදනම හඳුනාගෙන ඇත.

**කාල සීමාව අවසන් වූ පසු : තවමත් ආරම්භකර නැත**

9.1 - 9.7 සන්ධිස්ථානය : සිවිල් සමාජ සංවිධානවලට අනුව රාජ්‍ය වගවීම සඳහා විධිවිධාන හඳුන්වාදීම සඳහා වූ නීති දෙක (වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත හෝ වයඹ පළාත් පරිසර ව්‍යවස්ථා සංශෝධනය) සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අඛණ්ඩවම කිසිදු ප්‍රගතියක් පෙන්වා නැත. අදහසක් ලබා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වයඹ පළාත් පාරිසරික අධිකාරිය සම්බන්ධ කර ගැනීමට අපහසු විය.

**එය විවෘත රාජ්‍යක් ද?**

**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : වෙනසක් වි නැත**

**පුරවැසි සහභාගිත්වය: වෙනසක් වි නැත**

ක්‍රියාකාරී සැලැස්මේ ආරම්භයේදි වනසත්ව සහ වෘක්ෂලතා ආඥා පනත සහ වයඹ පළාත් පරිසර අධිකාරිය හා අදාළ තීරණ සම්බන්ධයෙන් මහජන අදහස් සඳහා ප්‍රතිචාර දැක්වීමේ රාජ්‍ය වගවීම සම්බන්ධයෙන් විධිවිධාන පනවා නොතිබුණි. ජාතික පරිසර පනත හෝ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත මෙන් නොව මෙම නිතීවල මහජන අදහස් ඉදිරිපත් කිරීම සඳහා නීතිමය විධිවිධාන ඇතුළත්ව නැත. කෙසේ නමුත් මෙම වගකීම ක්‍රියාවට නැංවීම ආරම්භ කර නැති බැවින් එය විවෘත රාජ්‍ය යන සංකල්පය වැඩිදියුණු කළේ ද නැත. විශේෂයෙන්ම මෙම වගකීමේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව හෝ පුරවැසි සහභාගිත්වයේ ද කිසිදු වෙනසක් සිදුවි නැත.

තීරණ ගැනීම තුළ රාජ්‍ය වගවීම හඳුන්වාදීමට සහ එය බලාත්මක කිරීමට මෙම වගකීම උත්සාහ ගනු ලැබුවත් එහි අන්තර්ගතය පිළිබඳ සාකාච්ඡා කොට අවසන් තීන්දුවකට එන තෙක් එසේ කිරීමට භාවිතා කළ හැකි නිශ්චිත යාන්ත්‍රණයක් පිළිබඳ පැහැදිලි අදහසක් නැත. පාර්ශවකරුවන් අතර මූලික සාකච්ඡා පැවැත්වීම සහ අදාළ සංශෝධන කෙටුම්පත් කිරීම සහ සම්මත කිරීම, රාජ්‍ය වගකීම පිළිබඳ විධිවිධාන හඳුන්වාදීම සඳහා පහසුකම් සැලසීමේ පූර්ව අවශ්‍යතාවකි.

**ඉදිරියට රැගෙන යා යුතු ද ?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාව සඳහා වූ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කොට නොතිබුණි.7 වන සහ 8 වන වගකීමේ ඇතුළත් නීති මෙන් නොව වනසත්ව සහ වෘක්ෂලතා ආඥාපනත සහ වයඹ පළාත් පාරසරික අධිකාරිය දනටමත් මහජන අදහස් අනිවාර්ය කර ඇත.කෙසේ නමුත් සංශෝධන හරහා මහජන අදහස් පිළිබඳ රාජ්‍ය වගවීම ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් සීමිත සාර්කත්වයක් පමණක් අත්පත් කරගෙන ඇති බැවින් මෙම වගකීම සඳහා සංශෝධිත ප්‍රවේශයක් අවශ්‍ය විය හැක.
පරිසර අමාත්‍යාංශය, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වයඹ පළාත් පාරසරික අධිකාරිය සහ තිරසාර සංවර්ධනය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම පාර්ශවකරුවන් මහජන අදහස් විමසීම සම්බන්ධයෙන් නීතිමය විධිවිධාන බලාත්මක කිරීමේ බැඳීම සහ මහජන අදහස් සඳහා ප්‍රතිචාර දැක්වීමට රාජ්‍ය වගවීම සඳහා පහසුකම් සැලසීමේ වැදගත්කම. නැවත පරීක්ෂා කිරීම සඳහා අදහස්විමසීමේ හමුවක් කැඳවීය යුතු යැයි මෙයට පිළියම් ලෙස IRM පර්යේෂක යෝජනා කරයි.
පරිපූර්ණ ප්‍රවේශයක් සඳහා මෙම අදහස් විමසීමේ හමුවලට පොදු පාරිසරික ආයතන, සිවිල් සංවිධාන සමාජිකයන්, පරිසරවේදීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් ඇතුලත් කළ හැක.

## 5 වන තේමාව : පළාත් පාලනය

### 10. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන වැඩපිළිවෙල

**වගකීමේ ආදර්ශ පාඨය :**

(A) **ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සඳහා විනිවිදභාවයකින් සහ වගවීමෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රියාපිළිවෙලක් ඇති කිරීම.**

[...]
පළාත් පාලන ආයතන විසින් ලබාදෙන සේවාවන් සඳහා මධ්‍යම සහ / හෝ පළාත් ආණ්ඩුවෙන් හෝ පළාත් පාලන ආයතන විසින් උත්පාදනය කරනු ආදායමෙන් පවරනු ලැබේ.

රාජ්‍ය ආයතන සඳහා පොදුවේ බලපාන ක්‍රියාපිටිපාටියම පොදුවේ පළාත්පාලන ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය සඳහා මඟපෙන්වයි. කෙසේ නමුත් වෙනස වන්නේ පාළාත් පාලන ආයතන ස්වාධීන ඒකකයක ලෙස නීත්‍යානුකූල අනන්‍යතාවක් සහ තත්ත්වයක් සහිත සංස්ථාපිත ආයතනයක් වන බැවින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් සඳහා මඟපෙන්වීමට හෝ අධීක්ෂණය කිරීමට පමණක් හැකි අතර එය එහි අනිවාර්ය හෝ නීත්‍යානුකූල දෙයක් නොවේ.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ, XIXB පරිච්ඡේදයට අනුව "ප්‍රසම්පාදන කොමිසම " පිහිටුවා ඇති අතර අංක 156(H)වගන්තියට අනුව භාණ්ඩ සහ සේවා, ක්‍රියාකාරකම්, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති සඳහා සාධාරණ, අපක්ෂපාති, විනිවිදභාවයකින් යුත්,තරඟකාරී සහ අඩුපිරිවැයින් යුත් ප්‍රසම්පාදන සහ මාර්ගෝපදේශ ගොඩනැගීමට, රාජ්‍ය ආයතන විසින් කොමිසමට බලය පවරා ඇත.එමෙන්ම එවැනි මාර්ගෝපදේශ ගැසට් පත්‍රයක පළ කළ යුතු අතර එසේ පළ කොට මාස 3 ක් ඇතුලත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

**මූලික අරමුණු :**
පළාත් පාලන ආයතන සඳහා විනිවිදභාවයකින් සහ වගකිවයුතු ප්‍රසම්පාදන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම (ප්‍රසම්පාදන මාර්ගොපදේශ පිළියෙල කිරීම සහ ප්‍රචාරය).

**සන්ධිස්ථාන :**

- 10.1 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලය විසින් මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා පිළියෙල කරන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන කොමිසම, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලය සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සිවිලි සංවිධාන නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුව විසින් ඇගයීමට ලක් කිරීම.
- 10.2 ඇගයීමට ලක්කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා අවශ්‍ය සංශෝධන ඇතුලත් කිරීම.
- 10.3 තහවුරු කරන ලද මාර්ගෝපදේශය මත ප්‍රසම්පාදන කොමිසම සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම.
- 10.4 අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ගැසට්පත්‍රයක පළ කිරීම සහ ඒ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම.

- 10.5 ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා රජය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රචාරය කිරීම සහ ඒවායේ පිටපත් පළාත් පාලන ආයතන/පළාත් සභාවල මහජනතාවට දැකබලා ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම.
- 10.6 මුද්‍රණය කොට සභාවන් තුළ බෙදා හරීම.
- 10.7 සියලුම පළාත් පාලන ආයතන, පාලාත් පාලන කොමසාරිස් කාර්යාල, පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් දැනුවත් කිරීම ( ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය සමඟ සහයෝගයෙන්).
- 10.8 වෙබ් අඩවි සහ ප්‍රදර්ශන පුවරු ඔස්සේ සෑම පළාත් සභාවකම ප්‍රසිද්ධියේ මාර්ගෝපදේශ බෙදා හැරීම.

**වගකිවයුතු ආයතනය** - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සහ ප්‍රසම්පාදන කොමිසම

**උපකාරක ආයතනය :** පළාත් පාලන ආයතන, ශ්‍රී ලංකා පළාත් පාලන බලමණ්ඩලය

**ආරම්භක දිනය** : 2016 අගෝස්තු
**අවසන් දිනය : 2018 ජුනි**

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාවව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | ප්‍රජා සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විවෘතභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 10. පළාත්පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන වැඩපිළිවෙ | | | | ✔ | ✔ | ✔ | | ✔ | | ✔ | | | | ✔<br>✔ | | | | | ✔ | | |

**වගකීමේ අරමුණ :**
විනිවිදභාවයකින් යුත් ප්‍රසම්පාදන වැඩපිළිවෙලක් පළාත් පාලන ආයතනවලට හඳුන්වාදීම සහ ඒ තුළින් අක්‍රමිකතා සහ දූෂණ අවම කිරීම. පළාත් පාලන ආයතන සඳහා ඒකීය ප්‍රසම්පාදන වැඩපිවෙලක් සකස්කිරීම සඳහා මාර්ගෝපදේශ පිළියෙල කිරීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම සඳහා වගකීම විශේෂයෙන්ම අවධානය යොමුකෙරේ.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**

මධ්‍ය කාලසීමාව වනවිට මෙම වගකීම විසින් ඉටුකර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. 2016 සැප්තැම්බර් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනයට අදාලව දැනට පවත්නා ලිපි ලේඛන සහ නිල ක්‍රියාපටිපාටි ඇගයීම සඳහා සාමාජිකයන් 12 දෙනෙකුගෙන් යුත් කමිටුවක් කැඳවනලදි(10.1 සන්ධිස්ථානය). මෙම කමිටුවට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන කොමසාරිස්වරුන්, පළාත් පාලන ආයතන සහ ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලය ඇතුළු සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් ඇතුළත් විය. පළාත් පාලන ආයතන සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ජාතික මට්ටමේ ආයතන සමඟ ඒකාබද්ධ කිරීමට කැමති බව කෙටුම්පත් ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන කොමිසම ප්‍රකාශ කරන ලදි. කෙටුම්පත් කරන ලද මාර්ගෝපදේශ ඇගයීමේ දි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මට්ටම් දෙක අතර විෂමතා ඇති බව කමිටුව හඳුනාගත් අතර ඉදිරි ජාතික මාර්ගෝපදේශ යටතේ පළාත් පාලනය සඳහා සුවිශේෂී විධිවිධාන හඳුන්වාදීමට එකඟවිය. කෙසේ නමුත් මාර්ගෝපදේශ විධිමත්ව හඳුන්වා නොදුන් බැවින් මධ්‍ය කාලසීමාව වනවිට වඩා හොඳ ප්‍රගතියක් කරා යාමට වගකීම අපොහොසත්විය.

**කාල සීමාව අවසන් වූ පසු : සීමාසහිත**

කාල සීමාව අවසානයේ වගකීමට නිමා කරන්න හැකිවූයේ සීමිත වැඩකොටසක් පමණි.
10.1 -10.2 සන්ධිස්ථාන : ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලයේ නියෝජිතයන්ට අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මාර්ගෝපදේශ කෙටුම්පත ප්‍රසම්පාදන කොමිසමට ඉදිරිපත් කරන ලද අතර 2017 දෙසැම්බර් මස එය ඇගයීමකට ලක්කිරීමෙන් අනතුරුව සුළු වෙනස්කම් කිහිපයක් සමඟ අනුමත කරන ලදි. 2018 වසරේ මැයි මස ප්‍රසම්පාදන කොමිසම විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වෙන් වෙන් වශයෙන් නිකුත් කරන ලදි. මෙම මාර්ගෝපදේශ ප්‍රසම්පාදන කොමිසමේ වෙබ් අඩවියේ භාෂා 3 න්ම ප්‍රකාශයට පත්කර ඇත.
10.3 -10.8 සන්ධිස්ථාන: කාල සීමාව අවසන්වන විටත් පාර්ලිමේන්තුව සහ ප්‍රසම්පාදන කොමිසම පළාත් පාලන ආයතන සඳහා වූ මාර්ගෝපදේශ ගැසට් කර, අනුමතකර සහ ප්‍රකාශයට පත්කර නොතිබුණි. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලයට අනුව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීමේ මූලික වගකීම ඇත්තේ ප්‍රසම්පාදන කොමිසම වෙතය. පාර්ලිමේන්තු අනුමැතිය ලැබුණ පසු ප්‍රසම්පාදන කොමිසම මාර්ගෝපදේශ විධිමත්ව ගැසට් කළයුතුය. මෙම ක්‍රියාවලිය තවමත් සිදුවී නොමැති බැවින් වගකීම තවදුරටත් ප්‍රගතියක් ලබා නැත.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව: වෙනසක් වී නැත**
**පුරවැසි සහභාගිත්වය : සුළු**

මෙම වගකීම විසින් සීමිත ක්‍රියාකාරකම් කොටසක් ක්‍රියාත්මක කිරීම විවෘත රාජ්‍යයක් සඳහා සුළු වශයෙන් දායක වී ඇත.ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදීම සියලුම පළාත් පාලන ආයතන විසින් භාණ්ඩ සහ සේවාවන් ප්‍රසම්පාදනය කිරීම අක්‍රමත් ආකාරයට අවිධිමත් ලෙස සිදුකර ඇත. ක්‍රියාවලිය

මෙහෙයවීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ නොමැතිවිට මහජන ප්‍රසම්පාදනයේ දී අක්‍රමිකතා සහ දූෂණ සිදුවීමේ විභවය ඉතා ඉහළ විය.
සක්‍රිය ලෙස සාකච්ඡා කොට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ගොඩනැගීම සඳහා සිවිල් සංවිධාන ඇතුළු විවිධ ප්‍රධාන පාර්ශවකරුවන් කැඳවීමට මෙම වගකීම හරහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට හැකිවීය.ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා රාජ්‍ය සේවයෙන් බාහිර ක්‍රියාකරුවන්ට අර්ථසම්පන්න දායකත්වයක් ලබාදීමට හැකිවන්නේ කලාතුරකින් වන අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ පුරවැසි සහභාගිත්වයෙහි අඩු නියෝජනයක් පෙන්නුම් කර ඇත. කෙසේ නමුත් මෙය සෘජුවම වගකීමේ අරමුණුවලට සම්බන්ධ නොවේ. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් සදා නිම කර එය ප්‍රකාශයට පත්කිරීමට අදාල පාර්ශවකරුවන්ට නොහැකි වූ බැවින් තොරතුරු සඳහා වඩාත් පහසුවෙන් ප්‍රවේශවීම යන කාරණාව සම්බන්ධයෙන් විවෘත පාලනය මත කිසිදු ප්‍රතිඵලයක් ඇති කර නැති බව සැලකිය යුතුය.

ශ්‍රී ලංකා පළාත්පාලන ආයතන බලමණ්ඩලයට අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ගොඩනැගීම සඳහා වූ පුළුල් ක්‍රියාවලිය රජයේ සහ සිවිල් සංවිධානවල වල පුළුල් පරාසයක විහිදී සිටින පාර්ශවකරුවන් අතර සීමිත දැනුවත්භාවය පෝෂණය කිරීමට දායකවී ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හඳුන්වාදීමේ උත්සාහයන්ට අමතරව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලය විසින් 2018 වසරේ පෙබරවාරි උප කාර්යක් ලෙස වත්කම් කළමනාකරණය සඳහා ස්වාධීනව මාර්ගෝපදේශයක් ගොඩනගන කරන ලදි. මෙම මාර්ගෝපදේශය පිළිබඳ පළාත් පාලන ආයතන 341 ක දැනුවත්භාවය ඇති කිරීමට පළාත් පාලන ආයතනවල පළාත් කෙමසාරිස්වරුන් සම්බන්ධ වූ බව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලය සඳහන් කළේය.

**ඉදිරියට රැගෙන යායුතු ද?**

මෙම වාර්තාව සකස් කරන අතරතුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හඳුන්වාදීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් ධනාත්මක ප්‍රවණතාවක් පවත්වාගෙන යන බව 2016 - 2017 මධ්‍ය කාලසීමාව සඳහා වූ ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක විසින් නිර්දේශ කරයි. මාර්ගෝපදේශ තහවුරු කිරීම හැරුණ කොට එහි කටයුතු සාර්ථක ලෙස නිමා කිරීමට දැනුවත්භාවය ඇති කිරීම,ප්‍රචාරණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව සමීප අධීක්ෂණය සහතික කිරීම අත්‍යාවශයවේ (11 වන වගකීම බලන්න). මෙම නිර්දේශයන්ගේ අදාලත්වය කාල සීමාව අවසානයේ IRM පර්යේෂක නැවත නැවත කියා සිටී.

# 11. පළාත් පාලන ආයතන ප්‍රසම්පාදන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**

**ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සඳහා විනිවිදභාවයකින් සහ වගවීමෙන් යුත් ප්‍රසම්පාදන පද්ධතියක් ගොඩනැගීම (B)**

[...]

**ප්‍රධාන අරමුණ :**

පළාත් පාලන ආයතන සඳහා විනිවිදභාවයකින් සහ වගවීමෙන් යුත් ප්‍රසම්පාදන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම( ක්‍රියාත්මක කිරීම නියාමනය පුරවැසියන් විසින් සිදුකිරීම සහ දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම).
සන්ධිස්ථාන :

- 11.1 නව වැඩපිළිවෙල සියලුම පළාත් පාලන ආයතන විසින් (පළාත් පාලන ආයතන කොමසාරිස්/සහකාර කොමසාරිස් කාර්යාල)සහ පුරවැසි වාර්තා කාර්ඩ් පත් හරහා සිවිල් සමාජ සංවිධාන විසින් ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම

- 11.2 එකිනෙකට සමගාමීව තුන් ආකාරයෙන් ක්‍රියාත්මකවන දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමට විනිවිදභාවයකින් යුත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම - අන්තර් ජාලය, දුරකතන ක්ෂණික ඇමතුම් පහසුකම් සහ ඔබ්බුඩ්ස්මන්වරයෙකු හරහා භාෂා තුනෙන්ම

**වගකිවයුතු ආයතනය :** පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ප්‍රසම්පාදන කොමිසම

**උපකාරක ආයතන :** පළාත් පාලන ආයතන, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලය

**ආරම්භක දිනය**: 2016 අගෝස්තු
**අවසන් දිනය** : 2018 අගෝස්තු

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවි ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ:** 10 වන වගකීමේ දිගුවක් වන මෙම වගකීමේ අරමුණුවන්නේ වගවීම පිළිබඳ විධිවිධාන සමඟ භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සඳහා වූ ප්‍රසම්පාදන වැඩපිළිවෙල ශක්තිමත් කිරීම. එමෙන්ම මෙය අක්‍රමිකතා සහ දූෂණ අවම කිරීමට උපකාර වනු ඇත.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරීත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විවෘතභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 11. ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීම සහ නියාමනය | | ✔ | | | | ✔ | ✔ | ✔ | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | | |

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : ආරම්භ කර නැත**

මධ්‍ය කාලසීමාව වනවිට මෙම වගකීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත.

ධනාත්මක තත්ත්වයන් ගැන නොසලකා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,ප්‍රසම්පාදන කොමිසම සහ පාර්ලිමේන්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වල කටයුතු අවසන් කර නොතිබුණ ( 10 වන වගකීම බලන්න). එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ පාර්ශවකරුවන්ට ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම (11.1 සන්ධිස්ථානය) හෝ දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් (11.2 සන්ධිස්ථානය)ආරම්භ කිරීමට නොහැකි විය.

**කාල සීමාව අවසන් වූ පසු : ආරම්භකර නැත**
කාල සීමාව අවසන්වනවිටත් වගකීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණේ නැත. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හෝ ප්‍රසම්පාදන කොමිසම හෝ පාර්ලිමේන්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ තහවුරු කර නොතිබුණ බැවින් මෙම වගකීම සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩලයේ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයකුට අනුව මාර්ගෝපදේශ ඇතුළත් ගැසට් දැන්වීම ප්‍රකාශයට පත්කරන තෙක් 10 වන සහ 11 වන වගකම් හා අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට නොහැකි වි ඇත.

කෙසේ නමුත් මහජන දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සඳහා අදාළ නිශ්චිත විධිවිධාන මාර්ගොපදේශ කෙටුම්පතේ ඇතුළත්ව නැති බව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන බලමණ්ඩල නියෝජිතයකු ප්‍රකාශ කළේය. ප්‍රසම්පාදනයට අදාළව පළාත් පාලන ආයතන විසින්

ඉදිරිපත්කරන පැමිණිලි පළාත් මට්ටමේ පළාත් පාලන කොමසාරිස් වෙත රැගෙන යා හැකි බව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කෙටුම්පත්හි සඳහන්ව ඇත .

**එය විවෘත රාජ්‍යයක් ද?**
**පුරවැසි සහභාගිත්වය: වෙනසක් වි නැත**
**රාජ්‍ය වගවීම : වෙනසක් වී නැත**

ක්‍රියාත්මක කිරීමට දායකවන පාර්ශවකරුවන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ තහවුරු කර නැති බැවින් මෙම වගකීම පූර්ණ වශයෙන් නිමා කිරීමට නොහැකි වි ඇති අතර එය රාජ්‍ය පාලනය විවෘත කිරීමට ද දායක වි නැත.
10 වන වගකීමේ සඳහන්ව ඇති පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලියට මඟපෙන්වීමට පළාත් පාලන ආයතනවලට පැහැදිලි මාර්ගෝපදේශ නොමැති බැවින් අක්‍රමිකතා සහ දූෂණ ක්‍රියාවන් ඇතිවීමේ හැකියාව වර්ධනය වි ඇත. මෙම වගකීම මෙයට පිළියම් සෙවීමට පහත සඳහන් ක්‍රියාමාර්ග තුළින් උත්සාහ ගෙන ඇත. :
1) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම නියාමනය සඳහා යාන්ත්‍රණයක්
2)භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය පිළිබඳ පළාත් පාලන ආයතනවල වගවීම පුරවැසියන් විසින් රඳවා ගැනීම සඳහා දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දිම

ඉදිරියට රැගෙන යායුතු ද?
මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාව සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි.
මෙම වගකීම ක්‍රියාත්මක කිරීම හා අදාළ සැලැස්ම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම තුළින් එහි බලපෑම ශක්තිමත් කිරීමට 2016 - 2017 අතර කාලයට අයත් මධ්‍ය කාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක විසින් නිර්දේශ කර ඇත.
නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගතවන්නේ සහ දුක්ගැනිවිලි සඳහා සහන සලසන යාන්ත්‍රණය මෙහෙයවන්නේ කෙසේ ද යන්න පිළිබඳ පළාත් පාලන ආයතන නිලධාරීන් පුහුණු කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පුරවැසි සහභාගිත්ය ඉහළ නැංවීම මෙයට ඇතුලත්ය. පුරවැසි සහභාගිත්වය යන්නට, සමාජ විගණනය, ප්‍රසම්පාදන කමිටු පිහිටුවීම සහ ප්‍රසම්පාදන තීරණ පිළිබඳ අදහස් දැක්වීමට මහජනතාවට අවස්ථාව ලබා දීම ඇතුලත්ය.

වැඩි විස්තර සඳහා 2016 - 2017 මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න.

10 වන වගකීම සම්පූර්ණ කිරීම සඳහා (පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාශයට පත්කිරීම) එවැනි ක්‍රියාමාර්ග යොදාගැනීමේ වැදගත්කම සහ IRM පර්යේෂක නැවත නැවත තහවුරු කරන අතර මෙම වගකීම ඉදිරියට රැගෙන යායුතු බවට නිර්දේශ කරයි.

## 6 වන තේමාව : කාන්තාව

### 12. පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය

**වගකීමේ ආදර්ශ පාඨය :**
ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ තෝරාගත් අවසන් නිරක්ෂණයන් ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වාර්ෂික සැලැස්මට විනිවිදභාවයකින් සහ වගවීමෙත් යුත් ක්‍රියාවලි ඇතුළත් කිරීම (A ) පුද්ගලික නීතී ප්‍රතිසංස්කරණය ශ්‍රී ලංකාව 1981 වසරේ දි ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය අනුමත කරන ලදි.සෑම වසර 4 කට වරක්ම එයට වාර්තා කිරීමට ශ්‍රී ලංකාව බැඳී ඇත. මෙම සම්මුතිය හරහා එහි සමාජික රටවල් කලින් කලට ඇගයීමට ලක් කරන අතර ශ්‍රී ලංකාව අවසන්වරට ඇගයීමකට ලක්කර ඇත්තේ 2011 වසරේ දීය. එහිදි සම්මුතිය විසින් ශ්‍රී ලංකා රජය වෙත අවසන් නිරීක්ෂණ ගණනාවක් ඉදිරිපත් කොට ඇත. රාජ්‍ය පාර්ශවයක් ලෙස ශ්‍රී ලංකා රජය එම අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

[...]මහජනතාව සමඟ කරන අදහස් විමසීම් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මහජනතාවට ඇති වගවීම වැඩිදියුණු කරන අතර මහජන සේවා සහ මහජන විශ්වාසය වැඩිදියුණ කිරීම සඳහා කාන්තා ජාලවලට සෘජුවම සහභාගිවීමට අවස්ථාව සලසා දේ. එහි ප්‍රතිඵලයත් ලෙස අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලි සහ මහජන සහභාගිත්වය ඇතුලත් වගවීමෙන් යුතු ස්ථිර ක්‍රියාමාර්ග රජය ගත යුතුය .එවැනි ක්‍රියාත්මකවීම් තුළින් ලැබෙන ප්‍රගතිය ඊළඟ රාජ්‍ය ඇගයීමේ දි අපේ රජය විසින් ලබා ගත් ප්‍රගතියක් ලෙස වාර්තා කළහැක.

**ප්‍රධාන අරමුණ :**
**ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ අවසන් නිරීක්ෂණ පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය මත ක්‍රියාත්මක කිරීම**

සන්ධිස්ථාන :

- 12.1 අදහස් අනාවරණය කරගැනීම සඳහා මුස්ලිම් සහ දෙමළ ප්‍රජාව සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අදහස් විමසීම් පැවැත්වීම.
- 12.2 මහජනතාවට දැනුම්දීම සඳහා නීතිඥයන්, විනිසුරුවන්, ආගමික නායකයන් සමඟ ඔවුන්ගේ අදහස් අනාවරණය කරගැනීම සඳහා අදහස් වීමසීම් පැවැත්වීම
- 12.3 අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් සහතික නිකුත් කිරීම සඳහා නීති සම්මත කිරීම
- 12.4 ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීම සඳහා කැබිනට් මණ්ඩලයට වාර්තා වූ #1 සහ #2(12.1 සහ 12 .2) සම්බන්ධයෙන් සොයාගත් තොරතුරු පිළිබඳ කැබිනට් වාර්තාවක් අමාත්‍යාංශයට යැවීම .
- 12.5 ප්‍රගතිය නියාමනය කිරීම සඳහා සහ යෝජිත සංශෝධනයන්ගේ වත්මන් තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමින් අමාත්‍යාංශය විසින් අනුගමනය කරන ක්‍රියාවලියේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශයේ සහ සිවිල් සංවිධාන නියොජිතයන්ගෙන් කමිටුවේ කාර්තුමය රැස්වීම් පැවැත්වීම.

- 12.6 පාර්ලිමේන්තුව සඳහා වූ පුද්ගලික නීති සංශෝධන

**වගකිව යුතු ආයතනය: කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**
**උපකාරක ආයතන** :ජාතික කාන්තා කමිටුව, සමානාත්මතාව සහ සාධරණත්වය සඳහා වූ කේන්ද්‍රය( මෙය කලින් හඳින්වූයේ ෆෝකස් වුමන් ලෙසින)

**ආරම්භක දිනය** : 2016 ජූලි .....
**අවසන් දිනය** :2018 අගෝස්තු

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | ප්‍රජා සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 12. පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | ✔ | | | | ✔ | | |

**වගකීමේ අරමුණ:** විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවන ක්‍රියාකාරකම් තුළින් ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය පිළිබඳ කමිටුවේ අවසන් නිරීක්ෂණ ක්‍රියාවට නැංවීමට උපකාර කිරීම මෙම වගකීමේ අරමුණයි. ශ්‍රී ලංකාවේ "පුද්ගලික නීති''ප්‍රතිසංස්කරණය නිරීක්ෂණ සඳහා ද මෙම වගකීම සහයෝගය දක්වා ඇත.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**
මධ්‍ය කාලසීමාව වනවිට මෙම වගකීම විසින් සම්පූර්ණ කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. ජාතික කාන්තා කමිටුව කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ විශේෂඥයින් සමඟ අදහස්විමසීම් පවත්වා ඇත( 12.2 සන්ධිස්ථානය).මෙම සාකච්ඡාවට ප්‍රධාන රාජ්‍ය නිලධාරීන්, සිවිල් සංවිධාන නියෝජිතයන්, විශ්වවිද්‍යාල ජ්‍යේෂ්ඨ

කථිකාචාර්යවරුන් සහ නීතිඥයන් ඇතුළු පුළුල් පරාසයක විහිදී සිටින පාර්ශවකරුවන් ඇතුලත් විය.
කෙසේ නමුත් , මධ්‍ය කාලය සඳහා පැවැත්වූ ඇගයීමෙන් පසු 2017 වසරේ අවසන් කාර්තුව සඳහා සැලසුම් කර ඇති නමුත් ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ප්‍රජා අදහස් විමසීම් පවත්වා නැත ( 12 ’. 1 සන්ධිස්ථානය).

අදහස්විමසීම අවසන් නොවූ බැවින් ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය අදාළ වාර්තා කිසිවක් පිළියෙල කර හෝ ප්‍රකාශයට පත්කර නැත. එහි ප්‍රතිඵලයක් ලෙස සොයාගත් තොරතුරු මත සිදුකරන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නොහැකි විය ( 12.4 - 12.5 සන්ධිස්ථාන).

කිසිම පුද්ගලික නීතියක් පිළිබඳ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැත(12.6 සන්ධිස්ථානය). මේ හා අදාළ සංවේදීතාව සැලකිල්ලට ගෙන මෙම තීරණාත්මක අරමුණ වසර දෙකක කාලයක් තුළ සැබෑ ලෙසම සාක්ෂාත් කරගත හැකිද යන්න සිවිල් සමාජ සංවිධාන සැක පහළ කර ඇත. කෙසේ නමුත් සංශෝධනයක් ලෙස අතුරුදහන් වූ පුද්ගලයන් සඳහා මරණ සහතික නිකුත් කිරීම මරණ ලියාපදිංචි කිරීමේ පනතට 2016 සැප්තැම්බර් එකතු කොට ඇත(12.3 සන්ධිස්ථානය).

**කාල සීමාව අවසන් වූ පසු** : සැලකියයුතු

12.1-12.5 යන සන්ධිස්ථාන විශාල වශයෙන් නිමා කොට ඇති බැවින් කාලය අවසන්වන විට වගකීම විසින් සැලකිය යුතු වැඩකොටසක් සම්පූර්ණ කර තිබුණි.

12.1-12.2 සන්ධිස්ථාන: ජාතික කාන්තා කමිටුවේ සභාපතිට අනුව 2017 නොවැම්බර් මස අමාත්‍යාංශය විසින් ප්‍රජා අදහස් විමසීම් 3 ක් කොළඹ, යාපනය සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි පවත්වන ලදි. සිවිල් සංවිධාන එය සිදුකළ බවට තහවුරු කළ අතර ජාතික කාන්තා කමිටුව ඒ සම්බන්ධයෙන් වූ පැමිණීමේ නාමලේඛනය ලබා දුනි. මෙම අදහස් විමසීමේ අරමුණ වූයේ තේසවලමේ සහ මුස්ලිම් පුද්ගලික නීති පිළිබඳ අදහස් අනාවරණය කර ගැනීමයි. එමෙන්ම ජාතික කාන්තා කමිටුව 2017 දෙසැම්බර් මස විශේෂඥ අදහස් විමසීම් පැවැත්වීමට පහසුකම් සපයා ඇත. මේ සඳහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන පෙලේ විශේෂඥයින් ඇතුළු අනෙකුත් සිවිල් සංවිධාන නියෝජිතයෝ සහභාගි වූහ.
12.3 සන්ධිස්ථානය: සම්පූර්ණ කර ඇත
12.4 සන්ධිස්ථානය: ජාතික කාන්තා කමිටුව / කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ප්‍රජාව සහ විශේෂඥයින් සමඟ සිදුකළ අදහස්විමසීම් සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කොට තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇත. අමාත්‍යාංශය වාර්තාව ප්‍රකාශයට පත්කර නැතත් සමානාත්මතාව සහ සාධරණත්වය සඳහා වූ කේන්ද්‍රය අදහස්විමසීම තහවුරු කොට ඇත.
12.5 සන්ධිස්ථානය:ජාතික කාන්තා කමිටුව විසින් රාජ්‍ය නිලධාරීන්, නීති විශාරදයින් සහ අනෙකුත් සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සමන්විත සමාජිකයන් 14 දෙනෙකුගෙන් යුත් බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් කැඳවා ඇත. සමානාත්මතාව සහ සධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය මෙම සංසදය නියෝජන කළ අතර කමිටුව මාසිකව රැස්ව ඇත. සොයා ගත් තොරතුරු පදනම් කරගෙන ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ඇතිව ඇති ප්‍රගතිය විධිමත්ව නියාමනය කිරීමට කමිටුවට අපහසු වුවත් පුද්ගලික නීති සංශෝධනයට අදාළව සිදුව ඇති වර්ධනයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ශවකරුවන්ට මෙය හොඳ වේදිකාවක් විය.
12.6 සන්ධිස්ථානය: මෙම වගකීම ඉදිරියට ගෙනයාමේ වගකීම ඇත්තේ අධිකරණ අමාත්‍යාංශයට බව ජාතික කාන්තා කමිටුව සඳහන් කරයි. වාර්තා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම, කැබිනට් පත්‍රයක්

පිළියෙල කිරීම සහ පුද්ගලික නීති සංශෝධනය කිරීම සඳහා සොයාගත් තොරතුරු අනුව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම යනාදිය මෙම වගකීමට අයත් වේ. එවැනි ක්‍රියාමාර්ග තවමත් ගෙන නැති බැවින් මෙම වගකීම අසම්පූර්ණව පවතී.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව :සුළු**
**පුරවැසි සහභාගිත්වය: සුළු**

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදීම ශ්‍රී ලංකාවේ පුද්ගලික නීති නූතන සංස්කෘතියෙන් බොහෝ දුරට ඈත් වූ යල් පැන ගිය විධිවිධාන වලින් සමන්විත විය. විශේෂයෙන්ම මෙම නීති යටතේ කාන්තාව සැලකීමට ලක්වන්නේ වඩාත් සාම්ප්‍රදායික ලෙසට වන අතර ඔවුන් බොහෝවිට වෙනස් කොට සැලකීම්වලට ලක් වේ. නීති ප්‍රතිසංස්කරණය සහ පුද්ගලික නීතිවල ඇතුලත් වෙනස් කොට සැලකීම් හා අදාළ විධිවිධාන සංශෝධනය කිරීම වේගවත් කිරීමට ශ්‍රී ලංකා රජය නොනැවත ක්‍රියා කළයුතු බව ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය එහි අවසන් නිරීක්ෂණ වල නිර්දේශ කර ඇත. නීති ප්‍රතිසංස්කරණයේ සහ පුද්ගලික නීති සංශෝධනය කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වගවීම හඳුන්වාදීමට මෙම වගකීමේ අරමුණයි.

කාල සීමාව අවසන්වනවිට මෙම වගකීම සැලකිය යුතු ප්‍රමාණයකින් අවසන් කර තිබුණ නමුත් රාජ්‍ය පාලනය විවෘත කිරීම සම්බන්ධයෙන් මෙම වගකීම දායකවී ඇත්තෙත් සුළු වශයෙනි. පාර්ශවකරුවන් පුළුල් කණ්ඩායමකගේ අදහස් අනාවරණය කරගැනීම සඳහා ජාතික කාන්තා කමිටුව සහ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ප්‍රජා සහ විශේෂඥ අදහස්විමසීම් පවත්වා ඇත. මීට පෙර සිදුකරන ලද සීමිත ක්‍රියාකාරකම් සලකා බැලීමේ දි තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සිවිල් සහභාගිත්ව ප්‍රවර්ධනය කිරීමට ගත් ප්‍රයත්නයන්හි මෙය සාධනීය ජයග්‍රහණයක් බව සිවිල් සංවිධාන විශේෂඥයින් පෙන්වා දේ.

කෙසේ නමුත් මෙම අදහස් විමසීම් පුළුල් වුවත් අදාළ ප්‍රතිපත්ති ක්ෂේත්‍රය තුළ විශාල ඉදිරි පියවරක් නියෝජනය කර නැත. වැඩි විනිවිදභාවය සහ වගවීම ශ්‍රී ලංකාවේ පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය සඳහා දායක විය හැකි බව පෙන්වා දෙන සමානාත්මතාව සහ සාධාරණත්වය සඳහා වූ කේන්ද්‍රය මෙය තහවුරු කරයි. එමෙන්ම අදහස් විමසීම් වලින් ලබාගත් තොරතුරු ජාතික කාන්තා කමිටුව ප්‍රකාශයට පත්කර නැත. තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය කිරීමට සෘජුවම දායකවිය හැකි එකම ක්‍රියාකාරකම වූයේ මෙම තොරතුරු ප්‍රකාශයට පත් කිරීමයි. එබැවින් මෙම වගකීම හරහා තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාවේ වෙනසක් ඇති කිරීමට නොහැකි විය.

**ඉදිරියට රැගෙන යා යුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අතරතුර ශ්‍රී ලංකාව සඳහා දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි.
අභියෝගාත්මක ව්‍යවස්ථාමය සංශෝධන සම්මත කරගැනීම සඳහා විවෘත රාජ්‍ය මූලධර්මයන්ට බලපෑම් කිරීමේ වටිනාකම සහ වැදගත්කම 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක පෙන්වා දේ. මෙම පසුබිම තුල මෙම වගකීම ඉදිරියට රැගෙන යායුතු බව IRM පර්යේෂක දිගින් දිගටම කියා සිටි.මෙම වගකීම අනෙකුත් විශේෂිත මැදිහත්වීම් සමඟ අනුකලනය කළ හැක. මෙයට : අදහස්විමසීමේ වාර්තා පදනම් ව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රචාරක වැඩසටහන් පැවැත්වීම: පුද්ගල නීතිය තුළ වෙනස්කොට සැලකීමේ විධිවිධාන ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ප්‍රබල විරුද්ධ කතිකාවන් ගොඩනගා ගැනීමට සහ ඒවා අන් අය හා බෙදා ගැනීමට ප්‍රගතිශීලි ආගමික නායකයින් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඇතුලත් වේ.

# 13. රාජ්‍ය ඉඩම් බෙදාදීමේ දි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව

**වගකීමේ ආදර්ශ පාඨය :**

**ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය සඳහා වූ තෝරාගත් අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වාර්ෂික සැලැස්මට විනිවිදභාවයකින් සහ වගවීමෙත් යුතු ක්‍රියාවලි ඇතුළත් කිරීම (B) රාජ්‍ය ඉඩම් බෙදාදීමේ දි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ඇති කිරීම.**

1981 වසරේ දි ශ්‍රී ලංකාව විසින් ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය අනුමත කරන ලදි.සෑම වසර 4 කට වරක්ම එයට වාර්තා කිරීමට ශ්‍රී ලංකාව බැඳී ඇත. මෙම සම්මුතිය හරහා එහි සාමාජික රටවල් කලින් කලට ඇගයීමට ලක් කරන අතර ශ්‍රී ලංකාව අවසන්වරට ඇගයීමකට ලක්කර ඇත්තේ 2011 වසරේ දීය. එහිදි සම්මුතිය විසින් ශ්‍රී ලංකා රජය වෙත අවසන් නිරීක්ෂණ ගණනාවක් ඉදිරිපත් කොට ඇත. රාජ්‍ය පාර්ශවයක් ලෙස ශ්‍රී ලංකා රජය අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

[...] මහජනතාව සමඟ කරන අදහස් විමසීම් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මහජනතාවට ඇති වගවීම වැඩිදියුණු කරන අතර මහජන සේවා සහ මහජන විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා කාන්තා ජාලවලට සෘජුවම සහභාගිවීමට අවස්ථාව සලසා දේ. එහි ප්‍රතිඵලයත් ලෙස අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලි සහ මහජන සහභාගිත්වය ඇතුලත් වගවීමෙන් යුතු ස්ථිර ක්‍රියාමාර්ග රජය ගනු ඇත .එවැනි ක්‍රියාත්මකවීම් තුළින් ලැබෙන ප්‍රගතිය ඊළඟ රාජ්‍ය ඇගයීමේ දි අපේ රජය විසින් ලබා ගත් ප්‍රගතියක් ලෙස වාර්තා කළහැක.

**අරමුණ :**
ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ අවසන් නිරීක්ෂණ,රාජ්‍ය ඉඩම් බෙදා දීම පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාව තුළ ක්‍රියාවට නැංවීම.

**සන්ධිස්ථාන :**

- 13.1 ඉඩම් සංවර්ධන ආඥාපනත සඳහා කෙටුම්පත්කරන ලද සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- 13.2 රාජ්‍ය ඉඩම් බෙදාදීමේ ඒකාබද්ධ හිමිකාරිත්වය සම්බනන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සිවිල් සංවිධාන සමඟ සහභාගිත්වයෙන් අන්තර් අමාත්‍යාංශ රැස්වීමක් පැවැත්වීම.
- 13.3 #1 සහ #2 (13.1 සහ 13.2) පිළිබඳ ප්‍රගතිය නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශ සහ සිවිල් සංවිධාන නියෝජිත කමිටුවේ කාර්තුමය රැස්වීම්

**වගකිව යුතු ආයතනය:** ඉඩම් සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
**උපකාරක ආයතන :** කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික කාන්තා කමිටුව, සමානාත්මතාව සහ සාධරණත්වය සඳහා වූ කේන්ද්‍රය ( මීට පෙර මෙය හැඳින්වූයේ ෆෝකස් වුමන් ලෙසය)

**ආරම්භක දිනය** : 2017 මාර්තු
**අවසන් දිනය** : 2018 අගෝස්තු

සංස්කාරක සටහන : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

<table>
<tr><td rowspan="3">වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය</td><td colspan="4" rowspan="2">විශේෂත්වය</td><td colspan="4" rowspan="2">විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට)</td><td colspan="4" rowspan="2">ඇති විය හැකි බලපෑම</td><td colspan="2" rowspan="2">සම්පූර්ණ කිරීම</td><td colspan="2">මධ්‍ය කාලසීමාව</td><td colspan="5" rowspan="2">එය විවෘත රාජ්‍යයයක් ද?</td></tr>
<tr><td colspan="2">කාලය අවසන් වූ පසු</td></tr>
<tr><td>කිසිවක් නැත</td><td>අඩු</td><td>මධ්‍යම</td><td>ඉහළ</td><td>තොරතුරු සඳහා</td><td>පුරවැසි සහභාගිත්වය</td><td>රාජ්‍ය වගවීම</td><td>විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ</td><td>කිසිවක් නැත</td><td>සුළු</td><td>තරමක්</td><td>පරිවර්තනීය</td><td>ආරම්භකර නැත</td><td>සීමා සහිත</td><td>සැලකිය යුතු</td><td>සම්පූර්ණ කර ඇත</td><td>වඩාත් දුර්වල</td><td>වෙනසක් නැත</td><td>සුළු</td><td>ඉතා විශාල</td><td>කැපී පෙනෙන</td></tr>
<tr><td rowspan="2">13. රාජ්‍ය ඉඩම් බෙදාදීම තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාව</td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2">✔</td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2">✔</td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2">✔</td><td rowspan="2"></td><td></td><td>✔</td><td></td><td></td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2">✔</td><td rowspan="2"></td><td rowspan="2"></td></tr>
<tr><td></td><td>✔</td><td></td><td></td></tr>
</table>

**වගකීමේ අරමුණ:**

විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවන ක්‍රියාකාරකම් තුළින් ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය පිළිබඳ අවසන් නිරීක්ෂණ ක්‍රියාවට නැංවීමට උපකාර කිරීම මෙම වගකීමේ අරමුණයි. රාජ්‍ය ඉඩම් බෙදාදීම තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවට අදාල නිරීක්ෂණ සඳහා මෙම වගකීම විශේෂයෙන්ම සහයෝගය දක්වා ඇත.

රාජ්‍ය ඉඩම් පැවරීමේ දි අනුප්‍රාප්තිකයා ලෙස පිරිමින්ට වැඩි සැලකිල්ලක් දක්වන ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන උපලේඛනය සංශෝධනය කිරීමට මෙම වගකීම උත්සාහ කළේය. එමෙන්ම ඉඩම් ආඥාපනත යටතේ හවුල් හිමිකාරත්වය හඳුනාගැනීමට රජය උනන්දු කිරීමේ ප්‍රයත්නයන්ට සහයෝගය දැක්වීමට මෙම වගකීම උත්සාහ ගෙන ඇත.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**
මධ්‍ය කාලසීමාව වනවිට වගකීමට සාක්ෂාත් කරගත හැකිවූයේ සීමිත අරමුණු කිහිපයක් පමණි. ජාතික කාන්තා කමිටුව, කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සහ ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංය යටතේ ඉඩම් ආඥාපනතේ 3 වන උපලේඛණයට සංශෝධන කෙටුම්පත්

ඇතුලත් කොට අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත (13.1 සන්ධිස්ථානය). නීතිමය ක්‍රියාපටිපාටියට අනුව ඉන්පසු කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසන් අනුවාදය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර නීති කෙටුම්පත් නිලධාරී කාර්යාලය සමඟ හුවමාරු කරගත යුතුය.

2016 වසරේ අවසාන භාගයේදී හවුල් හිමිකාරිත්වය(13.2 සන්ධිස්ථානය) පිළිබඳ විධිවිධාන ප්‍රතිසංස්කරණය සඳහා සිවිල් සංවිධාන බහුපාර්ශවකරුවන්ගේ රැස්වීමක් කැඳවන ලදි. ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුවේ පාර්ශවකරුවන් මෙම රැස්වීමට සහභාගිවී ඇත. මේ එකඳු ක්‍රියාවලියක් අධීක්ෂණය සහ/හෝ නියාමනය කිරීමට බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් ස්ථාපිත නොකළ බව ඉඩම් අමාත්‍යාංශය තහවුරු කරන ලදි(13.4 සන්ධිස්ථානය) .

**කාල සීමාව අවසන් වූ පසු** : සීමාසහිත
කාල සීමාව අවසන් වන විට මෙම වගකීමට ක්‍රියාත්මක කිරීමට හැකිවූයේ සීමිත වැඩකොටසක් පමණි.

13.1 සන්ධිස්ථානය : ඉඩම් සංවර්ධන ආඥාපනතේ සංශෝධිත කෙටුම්පත් තවමත් නීති කෙටුම්පත් කාර්යාලයේ පවතින බව ජාතික කාන්තා කමිටුව/කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය තහවුරු කරන ලදි. කඩිනමින් සංශෝධන සම්මත කර ගැනීම සඳහා ජාතික කාන්තා කමිටුව ඉඩම් අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් සමඟ අඛණ්ඩව සාකච්ඡා පවත්වා ඇත. කෙසේ නමුත් ඉඩම් ආඥාපනත සඳහා සම්පූර්ණයෙන්ම අලුත් නීති ප්‍රතිස්ථාපනය කිරීමට ඇති කැමැත්ත හේතු කොටගෙන ඉඩම් අමාත්‍යාංශය ඉඩම් ආඥාපනත සංශෝධන කිරීම සඳහා වූ සිය අවධානය ක්‍රමිකව ඉවතට ගත් බව ජාතික කාන්තා කමිටුව ප්‍රකාශ කරයි. මෙය, මෙම සන්ධිස්ථානයේ කටයුතු සම්පූර්ණ කිරීම ප්‍රමාද කිරීමට හෝ කල්දැමීමට හේතු විය හැකි බව සිවිල් සංවිධාන විසින් තහවුරු කරන ලදි.
13.2 සන්ධිස්ථානය :මධ්‍ය කාලසීමාව අවසන් වනවිට හවුල් හිමිකාරිත්වය පිළිබඳ බහුපාර්ශවකරුවන් සමඟ සිදුකරන රැස්වීම් සම්පූර්ණ කරනු ලැබුවත් කාලය අවසන්වනවිට තවදුරටත් කිසිදු හෝ සුළු ප්‍රගතියක් පෙන්නුම් කළේ නැත. අභ්‍යන්තර සංසදය තුළ හවුල් හිමිකාරිත්වය පිළිබඳ ගැටළුව අඛණ්ඩව සාකච්ඡා කළ නමුත් මාතෘකාව දැඩි ලෙස වාද විවාද වලට ලක් වූ බව ජාතික කාන්තා කමිටුව තහවුරු කළේය. - මෙම සංසදය රාජ්‍ය සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන්ගෙන් සමන්විත වන අතර ඔවුන් මාසිකව මුණගැසේ - ඉඩම් සංවර්ධන ආඥා පනතේ සංශෝධන සහ හවුල් හිමිකාරත්වයේ ප්‍රගතිය නියාමනය සම්බන්ධයෙන් වන චෝදනා මෙම සංසදය වෙත එල්ල නොවේ (13.3 සන්ධිස්ථාන).
රාජ්‍ය ඉඩම්වල හවුල් හිමිකාරිත්වයේ විධිමත් පිළිගැනීමක් සහතිකවීම සඳහා සිවිල් සංවිධාන වැඩකරන අතර එවැනි පිළිගැනීමක් කඩිනමින් සිදු කිරීමට ඔවුන් විවිධ මාර්ග ගවේෂණය කරමින් සිටින බව සමානාත්මතාව සහ සාධාරණත්වය සඳහා වූ කේන්ද්‍රය විසින් පවසන ලදි. නිදසුනක් ලෙස විදේශීය අරමුදල් සපයන සංවර්ධන ආයතනයක නිර්ණායකයක් සඳහා හෝ උපාංගයක් ලෙස හවුල් හිමිකාරිත්වය හඳුන්වාදීම මෙයට ඇතුළත් විය හැකි බව ඔවුන් පෙන්වා දේ.
13.3 සන්ධිස්ථානය :ජාතික කාන්තා කමිටුව විසින් සංවිධානය කරන සමාන්‍යය මාසික රැස්වීම් හැරුණ කොට ඉඩම් සංවර්ධන පනතේ සංශෝධනයන් අධීක්ෂණය සහ/ හෝ නියාමනය කිරීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ විධිමත් කමිටුවක් නොවීය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**පුරවැසි සහභාගිත්වය : සුළු**
ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේ දි ඉඩම් සංවර්ධන පනතට කාන්තාවන් දැඩි ලෙස වෙනස් කොට සලකනු ලබන විධිවිධාන ඇතුලත්ව තිබුණි.

විශේෂයෙන්ම ඉඩම් ආඥාපනතේ 3 වන උපවගන්තියේ නිශ්චිතවම දක්වා ඇත්තේ ඉඩම් බලපත්‍රලාභීන් තම ඉඩම සම්බන්ධයෙන් අනුප්‍රාප්තිකයකු නම් කර නැති අවස්ථාවක ඉඩම් බලපත්‍රලාභියාගේ දියණියන්ට හෝ මිණිපිරියන්ට එකී ඉඩමේ හිමිකම් ඉබේ අයිති නොවේ.එලෙසම ඉඩම් සංවර්ධන ආඥාපනත රාජ්‍ය ඉඩම් සම්බන්ධයෙන් හවුල් හිමිකාරත්වය පිළිගෙන නැත. එවැනි විධිවිධාන ඇතුලත් කිරීම කාන්තාවන්ගේ ඉඩම් අයිතිය සහතික කිරීමට, පවුල් ආරවුල් වැළැක්වීමට සහ කාන්තාවන්ට වඩාත් හොඳ ආර්ථික සුරක්ෂිතතාවක් ඇති කිරීමට උපකාරවනු ඇත.
මෙම වගකීම ඉඩම් සංවර්ධන ආඥපනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහ වගවීම හඳුන්වාදීමට අරමුණු කරයි. පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළ හොත් සංශෝධන ඇතුලත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡා කිරීමට විවිධ පාර්ශවකරුවන් එක් රැස් කිරීම තුලින් තීරණ ගැනීම සම්බන්ධයෙන් පුරවැසි සහභාගිත්වය නාමිකව වර්ධනයවනු ඇත.

ජාතික කාන්තා කමිටුව මෙම කාරණාව සම්බන්ධයෙන් බහුපාර්වකරුවන්ගේ රැස්වීම් පවත්වන ලද අතර වගකීම සුළු වශයෙන් විවෘත පාලනයට දායක වූ බව සිවිල් සංවිධාන පිළිගත්හ. අදාළ ප්‍රගතිය සාකච්ඡා කිරීමට ජාතික කාන්තා කමිටුව විසින් නිතර නිතර බහුපාර්ශවීය කමිටුව රැස්කළා නම් මෙය තවත් වැඩිදියුණු වන්නට ඉඩ තිබුණි.

කෙසේ වෙතත්, IRM මාධ්‍යකාලීන වාර්තාවේ සඳහන්ව ඇති පරිදි වගකීම විවෘත පාලනයේ අගයන්ගෙන් සහ විෂය පථයට වඩා ඔබ්බට ගොස් ඇති බවක් පෙනෙන්ට ඇත.

**ඉදිරියට රැගෙන යායුතු ද?**
මෙම වාර්තාව පිළියෙල කරන අතර තුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි.

වගකීම තුළ විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති සීමිත අදාලත්වය නොතකා ඉඩම් සංවර්ධන ආඥාපනතේ සංශෝධන කඩිනම් කිරීම සහ වගකීම විවෘත පාලනයට වඩාත් උචිතවන ආකාරයට සකස් කිරීම සඳහා IRM පර්යේෂක 2016 - 2017 මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ ක්‍රියාමාර්ග යෝජනාකර ඇත.
ඉඩම් සංවර්ධන ආඥාපනතේ වඩාත් අභියෝගාත්මක සංශෝධනයන්ගෙන් 3 වන උපලේඛනය මෑත්කර තැබීම, රාජ්‍ය ඉඩම් සම්බන්ධයෙන් පැහැදිලි අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමේ වැදගත්කම පිළිබඳ මහජන දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මැදිහත්වීම් සැලසුම් කිරීම, රාජ්‍ය ඉඩම් බෙදා හැරීම සම්බන්ධයෙන් වන යාවත්කාලීන කරන ලද තොරතුරු ප්‍රකාශයට පත් කිරීම මෙයට ඇතුලත්ය.

## 14. රැකියාව තුළ සෑම දෙනාටම එක හා සමාන ලෙස සැලකීම

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**

**ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ තෝරාගත් අවසන් නිරීක්ෂණයන් ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වාර්ෂික සැලැස්මට විනිවිදභාවයකින් සහ වගවීම සහිත ක්‍රියාවලි ඇතුළත් කිරීම ( C ) විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍ර තුළ සියලු වෘත්තිකයන්ට එක හා සමාන අයුරින් සැලකීම.**

ශ්‍රී ලංකාව 1981 වසරේ දි ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය අනුමත කරන ලදි.සෑම වසර 4 කට වරක්ම එයට වාර්තා කිරීමට ශ්‍රී ලංකාව බැඳී ඇත. මෙම සම්මුතිය හරහා එහි සාමාජික රටවල් කලින් කලට ඇගයීමට ලක් කරන අතර ශ්‍රී ලංකාව අවසන්වරට ඇගයීමකට ලක්කර ඇත්තේ 2011 වසරේ දීය. එහිදි සම්මුතිය විසින් ශ්‍රී ලංකා රජය වෙත අවසන් නිරීක්ෂණ ගණනාවක් ඉදිරිපත් කොට ඇත. රාජ්‍ය පාර්ශවයක් ලෙස ශ්‍රී ලංකා රජය අවසන් නිරීක්ෂණ පසුවිපරම් කිරීමට බැඳී සිටී.

වගකීමේ රාමුව තුළ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් තොරාගත් ක්ෂේත්‍ර කිහිපයක විශේෂිත අවසන් නිරීක්ෂණ පසුවිපරම් කරනු ඇත : පුද්ගලික නීති ප්‍රතිසංස්කරණය, රාජ්‍ය ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව, විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍රය තුළ සියලුම වෘත්තිකයන්ට එක හා සමාන අයුරින් සැලකීම මෙයට ඇතුලත්ය. මහජනතාව සමඟ කරන අදහස් විමසීම් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මහජනතාවට ඇති වගවීම වැඩිදියුණු කරන අතර මහජන සේවා සහ මහජන විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා කාන්තා ජාලවලට සෘජුවම සහභාගිවීමට අවස්ථාව සලසා දේ.

එහි ප්‍රතිඵලයක් ලෙස අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලි සහ මහජන සහභාගිත්වය ඇතුලත් වගවීමෙන් යුතු ස්ථිර ක්‍රියාමාර්ග රජය ගනු ඇත .එවැනි ක්‍රියාත්මකවීම් තුළින් ලැබෙන ප්‍රගතිය ඊළඟ රාජ්‍ය ඇගයීමේ දි අපේ රජය විසින් ලබා ගත් ප්‍රගතියක් ලෙස වාර්තා කළහැක.

**ප්‍රධාන අරමුණු :**
ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය තුළ විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍රයේ සියලුම වෘත්තිකයන්ට සම අයිතීන් තහවුරු කිරීම පිළිබඳ වූ අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම.

**සන්ධිස්ථාන :**

- 14 .1 රැකියාව සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ රැකියා පිළිබඳ අවසන් නිරීක්ෂණවලින් තේමාත්මක අංශ ප්‍රමුඛතාගත කිරීම.
- 14.2 විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍ර තුළ වඩාත් විනිවිදභාවයක් ඇති කිරීම සඳහා සහ විවෘත දත්ත ආකෘතිය තුළ දත්ත වාර්තා කිරීම සඳහා තෝරාගත් තේමාත්මක අංශ තුළ ස්ත්‍රි පුරුෂ සමාජභාවය හේතුකොට ගෙන වෙනස් කොට සැලකීම් පිළිබඳ තොරතුරු ඇතළත් කිරීම.

- 14.3 විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍රයන්හි වැඩ කරන කාන්තාව ආරක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ගොඩනැගීම සඳහා සිවිල් සංවිධාන සමඟ මහජන අදහස්විමසීම් පැවැත්වීම.
- 14.4 #3 (14.3) පිළිබඳ ප්‍රගතිය නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශ සහ සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ කමිටුවේ කාර්තුමය රැස්වීම් පැවැත්වීම.
- 14.5 සිවිල් සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ අවසන් නිරීක්ෂණ සම්බන්ධයෙන් විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ ප්‍රගතිය හුවමාරු කරගැනීම.

**වගකිව යුතු ආයතනය :** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ

**උපකාරක ආයතන** : ජාතික කාන්තා කමිටුව: සමානාත්මතාව සහ සාධාරණත්වය සඳහා වූ කේන්ද්‍රය ( මීට පෙර එය හැඳින්වූයේ FOKUS වුමන් ලෙසය )

**ආරම්භක දිනය** : 2016 ඔක්තොබර්
**අවසන් දිනය** : 2018 ඔක්තොබර්

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාවව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | හළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 14. රැකියාව තුළ සියලු දෙනාටම එක හා සමාන ලෙස සැලකීම | | ✔ | | | ✔ | ✔ | | | | ✔ | | | | ✔<br>✔ | | | | | ✔ | | |

**වගකීමේ අරමුණ:** විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවන ක්‍රියාකාරකම් හරහා ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ අවසන් නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීම මෙම වගකීමේ අරමුණයි. මෙම වගකීම විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍රයන්හි කාන්තාවට එරෙහිව සිදුකරන වෙනස්කොට සැලකීම් පිළිබඳ නිරීක්ෂණ සම්බන්ධයෙන් විශේෂයෙන් සහයෝගය දක්වයි.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමා සහිත**

මෙම වගකීම මධ්‍ය කාලසිමාව වනවිට සාක්ෂාත් කරගෙන තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. ජාතික කාන්තා කමිටුව කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමත්‍යාංශය යටතේ ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ රැකියා හා අදාළ නිරීක්ෂණවල තේමාත්මක ක්ෂේත්‍ර ප්‍රමුඛතාගත කිරීම සඳහා කිසිදු ක්‍රියාවක් සිදුකර ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති බව IRM පර්යේෂක සඳහන් කරයි (14.1 සන්ධිස්ථානය). ඒ වෙනුවට ශ්‍රමය හා අදාළ නීති සංශෝධනය කිරීමට උත්සාහ ගැනීම සහ ලිංගික හිංසන ක්‍රියා ව්‍යාප්තවීම පිලිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පෝස්ටර් බෙදා හැරීම වැනි අවිධිමත් ක්‍රියාකාරකම් ගණනාවක් ජාතික කාන්තා කමිටුව විසින් සිදුකර ඇත.
ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතු කොට ගෙන රැකියාව තුල සිදුවන වෙනස් කොට සැලකීම් පිළිබඳ කිසිදු තොරතුරක් ප්‍රකාශයට පත් කර හෝ මෙම කාරණාව හා අදාළ දත්ත කිසිවක් එක්රැස් කර නැත (14.2 සන්ධිස්ථානය). එමෙන්ම රැකියාවල නිරත කාන්තාවන් ආරක්ෂා කිරීම සඳහා මාර්ගෝපදේශ ගොඩනැගීමට හෝ ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට ජාතික කාන්තා කමිටුවේ සභාපති කිසිදු මහජන අදහස්විමසීමක් සිදුකර නැත (14.3 සන්ධිස්ථානය). එබැවින් අමාත්‍යාංශය විසින් එවැනි මාර්ගෝපදේශ ගොඩනැගීම නියාමන කිරීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් පිහිටවා හෝ කැඳවා නැත (14.4 සන්ධිස්ථානය). ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ නිරීක්ෂණ ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රගතිය සාමාන්‍ය වශයෙන් හුවමාරු කරගැනීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ එක් අදහස්විමසීමක් සිදුකළ බව ජාතික කාන්තා කමිටුව තහවුරු කළේය(14.5 සන්ධිස්ථානය). සමානාත්මතාව සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ සිවිල් සංවිධාන නියෝජිතයෙකු විසින් මෙම අදහස්විමසීම සනාථ කරන ලදි.

**කාල සිමාව අවසන් වූ පසු : සීමාසහිත**
කාල සීමාව අවසන්වනවිට මෙම වගකීම විසින් නිමා කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි.

14.1 සන්ධිස්ථානය: විධිමත් සහ අවිධිමත් රැකියා සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ නිරීක්ෂණ කඩිනමින් ප්‍රමුඛතාගත නොකළ බව ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් තහවුරු කරන ලදි. රැකියාවල නිරත කාන්තාවන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියාකාරකම් ගණනාවක් සම්පූර්ණ කළ බව ජාතික කාන්තා කමිටුව සඳහන් කළේය. එයට අවිධිමත් අංශයේ රැකියා වැටුප් පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම, ළමයින් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම, දිවා සුරකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රතිපත්තියක් ගොඩනැගීම, වැඩ කිරීම සඳහා පුද්ගලික අංශය සඳහා නම්‍යශීලි කාලයක් හඳුන්වාදීම මෙයට ඇතුලත් ය. සමානාත්මතාව සහ සාරණත්වය සඳහා වූ කේන්ද්‍රය විසින් මෙම ප්‍රගතිය සනාථ කරන ලදි.
කෙසේ නමුත් ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කාර්යන් සඳහා මඟපෙන්වන ක්‍රියාකාරී සැලසුම් බොහෝවිට ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියේ නිරීක්ෂණ සහ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම් මත පදනම් වූ බව ජාතික කාන්තා කමිටුව පැහැදලි කළාය. රැකියාවල නිරත කාන්තාවන් මුහුණදෙන වෙනස් කොට සැලකීම් සම්බන්ධයෙන් විධිවිධාන ක්‍රියාකාරී සැලසුම් දෙකටම ඇතුළත් කොට තිබුණි. ජාතික කාන්තා කමිටුව/ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සැලසුම් සිවිල් සමාජ සංවිධානවල

අදහස්විමසීමෙන් පිළියෙල කර ඇති අතර ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ප්‍රධාන පාර්ශවකරුවන් අඛණ්ඩව එහි වර්ධනයන් සහ වත්මන් ප්‍රගතිය අනිකුත් පාර්ශවයන් හා බෙදා ගෙන ඇත.
14.2 සන්ධිස්ථානය: කාන්තා සහභාගිත්වය සහ රැකියා ස්ථාන තුළ කාන්තාවන් වෙනස් කොට සැලකීම හා සම්බන්ධ දත්ත එකතු කිරීමට සමීක්ෂණ ඇතුළු විවිධ පියවර ගත් බව ජාතික කාන්තා කමිටුව සඳහන් කළාය. අමාත්‍යාංශයේ කාර්තුමය සඟරාව හරහා මෙම තොරතුරු ප්‍රකාශයට පත්කර ඇති අතර ශ්‍රී ලංකාව පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා සංවර්ධන නිලධාරීන් අතර මෙය බෙදා හැර ඇත. අභ්‍යන්තර සඟරාවක් පවත්වා ගෙනගිය බව සිවිල් සංවිධාන තහවුරු කළ නමුත් එවැනි තොරතුරු එහි ඇතුළත් කරාද යන්න ඔවුන්ට තහවුරු කළ නොහැකි විය. මෙම තොරතුරු බෙදා හැරීමේ මූලික අරමුණ වූයේ විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍ර තුළ කාන්තාවන් මුහුණදෙන වෙනස් කොට සැලකීම් පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම සහතික කිරීමයි. ජාතික කින්තතා කමිටුව මෙම තොරතුරු අන්තර්ජාලයේ හෝ විවෘත දත්ත ආකෘතියක් ඔස්සේ ප්‍රකාශයට පත්කර නැත.
14.3 14.5 සන්ධිස්ථාන: මධ්‍ය කාලසීමාවේ සිට මෙම සන්ධිස්ථාන සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නැති බව ජාතික කාන්තා කමිටුව සඳහන් කරන ලදි. අමාත්‍යාංශය විසින් රැකියාවල නියුතු කාන්තාවන් ආරක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ යෝජනා කිරීමට මහජන අදහස් විමසීම් පවත්වා හෝ එවැනි ක්‍රියාවලි නියාමනය කිරීමට බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් ස්ථාපිත කර හෝ නැත. ස්ත්‍රීන්ට එරෙහිව සියලුම ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හුවමාරු කර ගැනීම සඳහා තවදුරටත් බහුපාර්ශවකරුවන්ගේ අදහස්විමසීම් කැඳවූ බවට සාක්ෂි කිසිවක් ජාතික කාන්තා කමිටුව විසින් ලබා දුන්නේ නැත.

**එය විවෘත රාජ්‍යයක්ද ?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : වෙනසක් වී නැත**
**පුරවැසි සහභාගිත්වය : සුළු**

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේ දි ශ්‍රී ලංකාවේ විධිමත් මෙන්ම අවිධිමත් රැකියා ක්ෂේත්‍රයන්හි නිරත කාන්තාවන් විශාල ගැටළු සංඛ්‍යාවකට මුහුණදී ඇත. ස්ත්‍රීන්ට එරෙහිව සියලුම ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ නිරීක්ෂණ මෙම ගැටළු අවධාරණය කරන ලද අතර විශේෂ අවධානය යොමු කළ යුතු අංශ හඳුනාගෙන ඇත. කාන්තා විරැකියාව ඉහළ මට්ටමක පැවතිම: පුහුණු රැකියාවන්හි නිරත කාන්තාවන් සංඛ්‍යාව අඩු අගයක් ගැනීම: ලිංගික හිංසා සම්බන්ධයෙන් නීති සම්පාදනය අඩුවීම: පිරිමින් සහ කාන්තාවන් අතර අසමාන වැටුප් මෙයට ඇතුළත් විය.
සැලැස්මේ සඳහන් ඇති ආකාරයට ක්‍රියාත්මක කළා නම් රැකියා සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතු කොටගෙන සිදුකරන වෙනස්කොට සැලකීම් පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම තුළින් තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීමට වගකීමට හැකි වනු ඇත. කෙසේ නමුත් මෙම ක්‍රියාකාරකම සම්පූර්ණ කර නැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාවේ ද වෙනසක් වී නැත. අනෙක් අතට මහජන අදහස්විමසීම් සහ කාර්තුමය බහුපාර්ශවකරුවන්ගේ රැස්වීම් (14.4 සහ14.3 සන්ධිස්ථානය)යෝජනා කොට ඇති ආකාරයට සිදු වි නැති අතර බහුපාර්ශවකරුවන්ගේ සංසදය විසින් ස්ත්‍රීන්ට එරෙහිව සියලුම ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ නිරීක්ෂණ පිළිබඳ ප්‍රගතිය හුවමාරු කරගැනීම පුරවැසි සහභාගිත්වයේ සුළු වර්ධනයක් ඇති කිරීමට දායක වි ඇත.

**ඉදිරියට රැගෙන යායුතු ද?**
මෙම වාර්තාව පිළියෙල කරන අතර තුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කොට නොතිබුණ. විධිමත් සහ අවිධිමත් රැකියා ක්ෂේත්‍රයන්හි නිරත ස්ත්‍රීන් මුහුණදෙන වෙනස් කොට සැලකීම් ඉවත් කිරීමේ අපේක්ෂාවෙන් පුළුල් ක්‍රියාකාරකම් රැසක් වගකීම තුළ ඇතුළත් කර තිබූ නමුත් සීමාසහිත විශේෂත්වය සහ ඇතිවිය හැකි සුළු බලපෑම සලකා බැලීමේ දි මෙම ක්‍රියාකාරකම් ඊළඟ ක්‍රියාකාරී සැලැස්මට රැගෙන නොයා යුතු බව 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක සඳහන් කරයි.

# 7 වන තේමාව: දේශපාලනය තුළ කාන්තාව

## 15. ප්‍රාදේශීය මට්ටමින් කාන්තා දේශපාලන සහභාගිත්වය

**වගකීමේ ආදර්ශ පාඨය :**

**ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තා සහභාගිත්වය ශක්තිමත් කිරීම**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ සෑම දෙනාටම එක හා සමාන අයුරින් සැලකීම සඳහා කැපවී ඇති අතර වර්ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා සාධනීය ක්‍රියාකාරකම් රැසක් හඳුනාගෙන ඇත. ව්‍යවස්ථාමය මෙන්ම ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය සඳහා වූ ජාත්‍යන්තර වගකීම පිළිඹබු කරන ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥාප්තියෙන් (1993) සහ කාන්තාවන් සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මෙන් (1996) මෙම වගකීම් සුරක්ෂිත කොට ඇත.ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාව සම්බන්ධයෙන් මේ ආකාරයට වගකීමෙන් බැඳුණත් ජාතික හා පළාත් පාලන මට්ටමින් දේශපලනය තුළ කාන්තා සහභාගිත්වය 6% ක පමණ සුළු අගයක් ගෙන ඇත.

[...] කාන්තාව හා සම්බන්ධ අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි අනෙකුත් දර්ශක හොඳින් ක්‍රියාත්මක වන රටක දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය අඩුවීම සැබවින්ම ප්‍රහෙලිකාවක් වී ඇත.

කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් අනිවාර්ය කිරීම ඇතුලත් කරමින් පළාත් පාලනයට අදාළ නීති 2016 වසරේ දි සංශෝධනය කරන ලදි.

**මූලික අරමණු :**

සුදුසුකම්ලාභි කාන්තාවන් පළාත් පාලන ආයතන තුළ නම් කිරීම සහ පත් කිරීම සහතික කිරීම සහ ඒ තුළින් දේශපාලන තීරණ ගැනීම සම්බන්ධයෙන් කාන්තා සහභාගිත්වය ශක්තිමත් කිරීම.

සන්ධිස්ථාන :

- 15.1 පුහුණුවලත් කාන්තාවන් පළාත් පාලන මැතිවරණ සඳහා නාමයෝජනා ලබා ගැනීම සහ තරඟ කිරීම වෙනුවෙන් පෙනී සිටීමට සැලසුම් කිරීම .
- 15.2 2017 පළාත් පාලන මැතිවරණය සඳහා දේශපාලන පක්ෂ විසින් පුහුණු ,සුදුසුකම් ලත් කාන්තාවන් පත් කිරීම.
- 15.3 දේශපාලන පක්ෂ විසින් පක්ෂ නාමයන් යටතේ දේශපාලන ප්‍රචාරක කටයුතු කරගෙන යාම සඳහා නාමයෝජන ලබා දුන් කාන්තාවන් සඳහා මුදල් සහ අනෙකුත් උපකාර ලබා දීම.
- 15.4 2017 පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් වූ කාන්තාවන් මැතිවරණය සඳහා නාම යෝජනා භාරදීමේ සිට මැතිවරණයට තරඟ කිරීම දක්වා වූ ක්‍රියාවලිය පසුවිපරම් කිරීම සඳහා ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම
- 15.5 මැතිවරණයට පෙර අපේක්ෂකයන්ගේ නම් සහ විස්තර (කාන්තාවන් ඇතුළු) මහජනතාවට දැකබලා ගැනීමට ප්‍රකාශයට පත් කිරීම.

**වගකිව යුතු ආයතනය** : මැතිවරණ කොමසාරිස් කාර්යාලය

**උපකාරක ආයතන** : පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය : කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

**ආරම්භක දිනය** : 2016 ජූනි
**අවසන් දිනය** : 2017 මාර්තු

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

| වගකීම පිළිබඳ දළවිශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරීත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | විය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | තළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විවෘතභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 15. ප්‍රාදේශීය දේශපාලනය තුළ කාන්තාව | | ✔ | | | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | | | | | ✔ | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**වගකීමේ අරමුණ** : පළාත් පාලන ආයතන තුළ සුදුසුකම්ලත් හෝ පුහුණු කාන්තා දේශපාලන සහභාගිත්වය ශක්තිමත් කිරීම මෙම වගකීමෙන් අරමුණු කෙරේ. විශේෂයෙන්ම ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන තීරණ තුළ කාන්තා හඬ සහ නියෝජනය ශක්තිමත් කිරීමට මෙම වගකීම තුලින් රාජ්‍ය සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් අපේක්ෂා කෙරේ.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමා සහිත**

මධ්‍යකාලය වනවිට මෙම වගකීම අවසන් කරගෙන තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නියෝජිතයෙකුට අනුව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් කාන්තා අපේක්ෂිකාවන් තෝරාගැනීමේ නිර්ණායකයක් තහවුරු කිරීමට පියවර ගෙන ඇත (15 .1 සන්ධිස්ථානය)
අධ්‍යාපනය, සමාජ සේවා කටයුතු සහ දේශපාලන පසුබිම පිළිබඳ මාර්ගෝපදේශ මෙම නිර්ණායකය තුළට ඇතුලත් කර ඇත. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මෙම නිර්ණායකය පාර්ලිමේන්තුව, මැතිවරණ කොමසාරිස්, දේශපාලන පක්ෂ ලේකම් කාර්යාල සහ සිවිල් සමාජ සංවිධාන වෙත ඉදිරිපත් කොට ඒ පිළිබඳ ඔවුන් සමඟ සාකච්ඡා පවත්වා ඇත.
එයට සමගාමීව වගකීමේ විෂය පථයෙන් බැහැරව, ජාතික කාන්තා කමිටුව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ රටපුරා සිටින අනාගත කාන්තා නායකයින් 1000 කට වැඩි ප්‍රමාණයකට දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් පවත්වා ඇත. එමෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අනාගත කාන්තා දේශපාලන අපේක්ෂිකාවන් පුහුණු කිරීමට උපකාර කිරීමට ස්වාධිනව ක්‍රියාකාරකම් කිහිපයක් සිදුකර ඇති අතර මෙයට අනාගත කාන්තා නායකයින් 2500 කට වැඩි ප්‍රමාණයක් සඳහා අන්තර් ක්‍රියාකාරී සංවාද සහ සාකච්ඡා සැසි,දෘශ්‍ය දැනුවත්කිරීමේ වැඩසටහන්, තොරතුරු පත්‍රිකා බෙදා හැරීම,ප්‍රාදේශීය දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය පිළිබඳ ත්‍රෛභාෂීය වාර්තාවක් පළ කිරීම ඇතුලත් වේ.
කෙසේ නමුත් පළාත් පාලන මැතිවරණය ඒ අවස්ථාවේ පැවැත්වීමට කටයුතු කරමින් සිටි බැවින් කාන්තාවන් නම් කිරීම හා අදාළ සියලුම ක්‍රියාකාරකම් එනම් මූල්‍යමය සහ අනෙකුත් උපකාර, නිරීක්ෂණය කිරීමේ ක්‍රියාකාරකම් , සහ අපේක්ෂකයන්ගේ නම් සහ විස්තර ප්‍රකාශයට පත් කිරීම යන ක්‍රියාකාරකම් ආරම්භ කර නොතිබුණි (15. 2 - 15. 5 සන්ධිස්ථානය).

**කාල සිමාව අවසන් වූ පසු : සීමාසහිත**
**අදාළ රාජ්‍ය පාර්ශවකරුවන් ප්‍රධාන සන්ධිස්ථාන වලට අයත් කාර්යන් අවසන් කර නොතිබුණ බැවින් කාලසීමාව අවසන්වනවිට මෙම වගකීම අසම්පූර්ණව පැවතින.**

15.1 - 15.2 සන්ධිස්ථානය : පළාත් පාලන මැතිවරණය 2018 පැවැත්වුන අතර දේශපාලන පක්ෂ විසින් දේශපාලන තනතුරු සඳහා කාන්තාවන් 17500 කට අධික ප්‍රමාණයක් නාමයෝජන ලබා ගැනීම සඳහා තරඟ වැදුණි.නාම යෝජනා ඉදිරිපත් කරන ලද කාන්තාවන්ගෙන් 1919 දෙනෙකු තේරිපත්වුන අතර එයින් 535 ක් ඡන්ද දායකයින් විසින් කොට්ඨාශ පදනම මත තෝරා ගන්නා ලදි. දේශපාලන පක්ෂ සංවිධායකයින් විසින් කාන්තාවන් 1384 දෙනෙක් තෝරාගෙන සමානුපාතික නියෝජන ක්‍රමය මත පත් කරන ලදි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සිවිල් සමාජ නියෝජිතයෙකුට අනුව කොට්ඨාශ පදනම මත තෝරාගෙන ඇති කාන්තාවන්ගෙන් වැඩි ප්‍රතිශතයකට දේශපාලන තනතුරක් දැරීමේ හැකියාව සහ ප්‍රමාණවත් පුහුණුව ඇත. මේ පුහුණුව සිවිල් සමාජ සංවිධාන විසින් ලබා දී ඇති අතර මෙයට විශාල පරාශයකින් යුත් නායකත්ව සහ තාක්ෂණික කුසලතාවන් ඇතුලත් විය. පුහුණු කාන්තාවන් නම් කිරීම සඳහා දේශපාලන පක්ෂ උනන්දු කරවීම මෙම වගකීමේ අරමුණ වුවත් පුහුණු ලබා දීමද මෙම වගකීමේ විෂය පථයෙන් ඔබ්බට වූ දෙයකි.මෙම වගකීමේ කොටසක් ලෙස රජය විසින් ආරම්භ කරන ලද පුහුණු පිළිබඳ කිසිදු සාක්ෂියක් නොමැත.

15.3 සන්ධිස්ථානය : මැතිවරණයට පෙර සිවිල් සංවිධාන විසින් විශාල වශයෙන් ප්‍රචාරණ උපකාර ලබා දුන් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තහවුරු කළේය. ඉහත සඳහන් පරිදි මෙම සහයෝගය අනාගත කාන්තා අපේක්ෂිකාවන්ට දේශපාලන නායකත්ව පුහුණුව ලබාදීමේ සහ ඡන්ද දායකයින්

අතර දැනුවත්භාවය වර්ධනය කිරීමේ ස්වරූපයක් ගත්හ. පූර්ව ප්‍රචාරක කටයුතු සඳහා සහයෝගය ලබාදීම ඡන්දදායකයින්ගේ කැමැත්ත පිළිබඳ ගැටුම් ඇති කිරීමට අනුබලයක් විය හැකි බැවින් රජය ප්‍රචාරක කටයුතු සඳහා සහයෝගය ලබා දීමේ දි අවම භූමිකාවක් ඉටු කර ඇත. සුවිශේෂී සිදුවීම වූයේ කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය සහ පාර්ලිමේන්තු කාන්තා දේශපාලන බලමණ්ඩලය දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා සියලුම කාන්තා අපේක්ෂිකාවන් මහජන පාගමනකට සම්බන්ධ කර ගැනීමයි.

15.4 සන්ධිස්ථානය : නාමයෝජනා ලබා ගැනීමේ සිට මැතිවරණය දක්වා පසුවිපරම් කිරීමේ මෙහෙයුම සිදුනොවුන බව සිවිල් සංවිධාන විසින් සඳහන් කරන ලදි. ඡන්දදායකයන් දැනුවත්කිරීම, නව සම්මිශ්‍ර සාමාජිකත්ව මැතිවරණ ක්‍රමය, පළාත් පාලනය තුළ කාන්තාවන් සඳහා 25% ක කෝටාව වැනි මාතෘකා ආවරණය කරමින් මැතිවරණ කොමසාරිස් වෙනත් ආකාරයේ මැතිවරණ ප්‍රචාරක මෙහෙයුම් කටයුතු වල නිරත විය. ප්‍රතිපත්ති ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම සඳහා කාන්තාවන්ට සහයෝගය ලබා දීම සහ ධෛර්මත් කිරීම ඇතුළු තමන්ගේම ප්‍රචාරක කටයුතුවල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිරත වී ඇත. නාමයෝජනා භාරදීමේ සිට මැතිවරණයතෙක් කාන්තාව පසුවිපරම් කිරීමේ ක්‍රියාමලාව සිදුනොවුන බව සිවිල් සංවිධාන පවසන ලදි.

15.5 සන්ධිස්ථාය : තවද පළාත් පාලන මැතිවරණයට පෙර සියලුම අපේක්ෂකයන්ගේ නම් සහ ඔවුන් පිළිබඳ විස්තර අවශ්‍ය ආකාරයට ප්‍රකාශයට හෝ ප්‍රචාරය නොකළ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සනාථ කරන ලදි. ඒ වෙනුවට ඉල්ලීමක් කළහොත් පමණක් අපේක්ෂකයන්ගේ නම් ලැයිස්තුව ලබා ගත හැකිව තිබුණි. අන්තර් ජාලයේ හෝ වෙනත් කිසිදු පොදු මාධ්‍යයක් හරහා ලැයිස්තුව ප්‍රකාශයට පත නොකරන ලදි.
කාලසීමාව අවසානයේ වගකීම සම්පූර්ණ වශයෙන් අවසන් කර තිබේ යන්න දැන ගැනීමට පළාත් පාලන අමාත්‍යාංශය සහ / හෝ මැතිවරණ කොමිසම සම්බන්ධ කරගැනීමට නොහැකි විය.

**එය විවෘත රාජ්‍යක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : වෙනසක් වි නැත**
**පුරවැසි සහභාගිත්වය : සුළු**

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේ දි පළාත් පාලනය තුළ කාන්තා දේශපාලන නියෝජනය මුළු මංත්‍රීවරුන්ගෙන් සියයට 1.8 ක් විය. දේශපාලන තීරණ ගැනීම සම්බන්ධයෙන් කාන්තා නියෝජනය අඩුවීමට බොහෝ හේතු විය. දේශපාලන නායකත්වය තුළින් ශක්තිමත් වූ පීතෘ මූලික චාරිත්‍ර, නොකැමත්ත, හෝ දේශපාලන සහභාගිත්වය සඳහා ඇති අවස්ථාවන් පිළිබඳ ඇති සීමිත දැනුවත්භාවය මෙයට ඇතුළත් ය.

කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් අනිවාර්ය කරමින් පාර්ලිමේන්තුව 2016 පෙබරවාරි පළාත් පාලන මැතිවරණ පනත සංශෝධනය කළ නමුත් පුහුණු කාන්තාවන් නම්කිරීම හෝ පත්කිරීමට හෝ අර්ථසම්පන්න දේශපලන නියෝජනයක් සිදුකිරීමට කාන්තාවට හැකි ද යන්න සහතික කිරීමට කෝටාව පමණක් ප්‍රමාණවත් නොවන බව බෙහෝ දෙනෙක් පිළිගත්හ.

තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය කරන බවට සහ පුහුණු සහ සුදුසුකම්ලත් කාන්තාවන් පළාත් පාලන මැතිවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් කරන බවට සහ තේරී පත්වන බවට සහතික කිරීම මෙම වගකීමෙන් උත්සාහ ගෙන ඇත. කෙසේ නමුත් මැතිවරණයට පෙර මැතිවරණ කොමිසම විසින් සියලුම කාන්තා අපේක්ෂිකාවන්ගේ නම් සහ විස්තර ප්‍රකාශයට පත් කර නැති අතර මෙම වගකීම තුළින් අපේක්ෂා කළ තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාවෙහිද කිසිදු වෙනසක් ඇති වී නැත.

එමෙන්ම පුරවැසි සහභාගිත්වය විශාල වශයෙන් වර්ධනය කිරීමට මෙම වගකීමෙන් උත්සාහ ගෙන ඇත. පළාත් පාලනය තුළ පුහුණු කාන්තාවන් තේරීපත්වීම ස්වාභාවයෙන්ම තීරණ ගැනීම සම්බන්ධයෙන් පොදුවේ විශාල පිරිසකට දැනුම් දීමට අවස්ථා වර්ධනය කරනු ඇත. මෙම පසුබිම තුළ මහජන පා ගමන වැනි කාන්තා අපේක්ෂිකාවන් සඳහා රජය විසින් ලබා දුන් සීමිත සහයෝග සිවිල් සමාජය තුළ කාන්තා සහභාගිත්වය පෑථුල කිරීමට දායක වී ඇත.මෙය පෙරලා පුරවැසි සහභාගිත්වයේ සුළු වර්ධනයක් ස්ථාපිත කොට ඇත.

**ඉදිරියට රැගෙන යායුතු ද ?**

**මෙම වාර්තාව සකස් කරන අතර තුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත්කර නොතිබුණි.**

පළාත් පාලන ආයතන සඳහා පුහුණුලාභී කාන්තාවන් නම් කිරීම, පත්කිරීම සහ සහභාගිකරවීම සඳහා පහසුකම් සැලසීම සඳහා ඊට වඩා වැඩි යමක් කළ හැකිව තිබුණ බව 2016 - 2017 දක්වා වූ IRM මධ්‍යකාලීන වාර්තාවේ IRM පර්යේෂක හඳුනාගෙන තිබුණි. විශේෂයෙන්ම පළාත් පාලන දේශපාලන තීරණ ගැනීමේ දි අර්ථසම්පන්නව සහභාගිවීමට කාන්තාව බලගන්වා ඇති බවට සහතික කිරීමට නාමයෝජනා ලබා ගැනීම සහ කාන්තාවන් සඳහා වූ අනිවාර්ය කෝටාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් පෙනී සිටීමට වඩා වැඩි උත්සාහයන් IRM පර්යේෂක නිර්දේශ කර ඇත.
පළාත් පාලන මැතිවරණය සඳහා නාමයෝජනා ලැබීම සහ තේරීපත්වීම සම්බන්ධයෙන් ජයග්‍රහණයන් අත්පත් කරගත් කාන්තාවන්ගේ ආදර්ශ සිද්ධි අධ්‍යයන වෙන් වෙන් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම, අනාගත කාන්තා නායකයින් ඉලක්ක කොටගත් මහජන දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙම නිර්දේශයට ඇතුළත් වේ. වැඩි දුර විස්තර සඳහා 2016 - 2017 IRM මධ්‍යකාලින වාර්තාව බලන්න.

පළාත් මට්ටමේ පළාත් පාලන කොමසාරිස්වරුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවන්ට අනුව තේරී පත්ව ඇති පිරිමි සහ කාන්තා සභිකයන් අතර බොහෝ වෙනස්කම් සහ/හෝ ගැටළු ඇති බව හෙළිදරව් වූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නියෝජිතයන් පවසන ලදි. මෙම ගැටළු පැන නැගී ඇත්තේ දේශපාලන නායකත්වය සඳහා කාන්තා සභිකයන් නිසි අයුරින් මෙහෙයවා නැතිවීම හේතු කොට ගෙනය.
සිවිල් සංවිධාන ඒ සඳහා මූලාරම්භයන් ගනිමින් සිටී. උදාහරණ - තමන්ගේ කාර්යන් සඳහා වඩාත් හොඳින් ක්‍රියාත්මකවීමට කාන්තා මංත්‍රීවරියන්ගේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් අනුගමනය කළ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වාර්තා කරන ලදි. රජය එවැනි වැඩසටහන් ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම තුළින් ඉදිරියට රැගෙන යායුතු බව IRM පර්යේෂක නිර්දේශ කරයි.

# 8 වන තේමාව දූෂණ

## 16. දූෂණයට එරෙහි  වැඩපිළිවෙල තුළ මහජන සහභාගිත්වය

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය :**

**ක්‍රියාකාරී මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම ( 1 වන කොටස)**

[...]

**ප්‍රධාන අරමුණ :**

**සන්ධිස්ථාන :**

- 16.1 දූෂණයට එරෙහි  ජාතික සමුළුව පැවැත්වීමට රජය කටයුතු කිරීම
- 16.2

a) අල්ලස් හෝ දූෂණ චෝදනා  විමර්ශන කොමිෂන් සභාව  විසින් දූෂණ වැළැක්වීම සහ තුරන් කිරීම සඳහා වසර තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන  වැඩසටහන්   පිළිබඳ අයවැය  මහජන යුක්ති යුක්ත කිරීම  සමඟ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම:

b) විෂමතා තත්ත්වයකදි මහජන යුක්ති යුක්ත කිරීම සමඟ වාර්ෂික ජාතික අයවැය ඇස්තමේන්තුව තුළින්  ඉල්ලා ඇති මුදල් ප්‍රතිපාදන රජය විසින් වෙන් කිරීම :

c) ල්ලස් හෝ දූෂණ චෝදනා  විමර්ශන කොමිෂන් සභාව විසින් කරගෙන යන  විමර්ශනවලට අගතියක් සිදුනොවන අයුරින් 2017 වසර සඳහා වාර්ෂික වියදම් ප්‍රතිපාදන සහ සිදුකරන ලද වියදම්   ප්‍රසිද්ධියේ වාර්තා කිරීම.

16.3 ශ්‍රී ලංකාවේ සමස්ථ දූෂණ වැළැක්වීමේ කටයුතු මෙහෙයවීම සඳහා  අල්ලස් හෝ දූෂණ චෝදනා  විමර්ශන කොමිෂන් සභාව විසින් පෞද්ගලික අංශය සහ සිවිල් සංවිධාන සමඟ අදහස්විමසීමෙන් අන්තර් ආයතනික දූෂණ නිවාරණ කවුන්සලය පිහිටුවීම. වසර දෙකක දූෂණ නිවාරණ ක්‍රියාකාරී සැලැස්ම ගොඩනැගීම සඳහා රාජ්‍ය, පුද්ගලික අංශය සහ සිවිල් සමාජ සංවිධානවල දායකත්වය ලබා ගැනීමට කවුන්සලය පහසුකම් සලසනු ඇත.පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා රජය, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජ සංවිධානවල දායකත්වය ලබා ගැනීම සඳහා මෙම සැලැස්ම විසින් ක්‍රියාත්මක  කිරීමේ ඉලක්ක ඔවුන් වෙත පවරනු ලැබේ:

a) දූෂණ වැලැක්වීම සියලුම ආයතනවල මුඛ්‍යධාරාගත කිරීම
b) පැහැදිලි අධීක්ෂණ භූමිකා මෙන්ම නියාමනය සහ ඇගයීම සහතික කිරීම.
c) දූෂණ වැළැක්වීම සඳහා ප්‍රමාණවත් සම්පත් ලබා දීම
d) දූෂණයට එරෙහි වැඩපිළිවෙලෙහි  පරිපූර්ණ සහ ශක්තිමත් ඇගයීමක් මත නිවාරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම( උදාහරණ :ජාතික වැඩපිළිවෙලේ සෑබෑ තක්සේරුවක්)
e) ක්‍රියාකාරී සැලැස්ම සැලසුම් කිරීමේ දි  රාජ්‍ය නොවන ක්‍රියාකරුවන්ට, විශේෂයෙන්ම සිවිල් සංවිධාන නියෝජිතයන්ට අර්ථාවිත දායකත්වයක් ලබා දීමට අවස්ථාව සලසා දීම.

16.4 දූෂණ සඳහා කිසිදු සමාවක් නැති බව පෙන්වා දෙන ප්‍රකාශයක් හෝ දිවුරුමක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්ෂණික පැමිණිලි සඳහා වූ ඇමතුම් විස්තර සමඟ රාජ්‍ය කාර්යාලවලට ඇතුල්වන ස්ථානයේ සියල්ලන්ටම පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීමට රජය කටයුතු කිරීම.

**වගකිව යුතු ආයතනය :**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**උපකාරක ආයතනය :**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය** :2016 අගෝස්තු
**අවසන් දිනය** : 2018 ජූනි

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම (මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු) | | | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දරුණු | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 16. දූෂණයට එරෙහි වැඩපිළිවෙල තුළ මහජන සහභාගිත්වය | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | | ✔ | | | | | ✔ | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** දූෂණයට එරෙහි ක්‍රියාකාරම් සහ ක්‍රියාවලීන් තුළ ක්‍රියාකාරී මහජන සහභාගිත්වය ඉහළ නැංවීම තුළින් දූෂණයට එරෙහි වැඩපිලිවෙල ශක්තිමත් කිරීම මෙම වගකීමේ අරමුණයි. දූෂණයට එරෙහි තීරණ, අධීක්ෂණ කටයුතු සහ වගවීම් යාන්ත්‍රණ වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මකවීමට මහජනතාවට හැකිවනු ඇතැයි රජය සහ සිවිල් සංවිධාන නියෝජිතයන් අපේක්ෂා කෙරේ.

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමව : සීමිත**

මධ්‍යම කාලසීමාව අවසන්වනවිට වගකීමට සාක්ෂාත් කරගත හැකිව තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. ජාතික දූෂණ විරෝධී දිනය සැමරීම සඳහා 2016 දෙසැම්බර් 9 වන දින රජය විසින් දූෂණයට එරෙහි ජාතික සමුළුව පැවත්වූ බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තහවුරු කරන ලදි. මෙම වගකීමේ බොහෝ අනෙකුත් උපාංග සම්පූර්ණ කොට හෝ ආරම්භ කොට නොතිබුණි.
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඇස්තමේන්තු කරන ලද වියදම් සඳහා ප්‍රතිපාදන 2016 සහ 2017 ජාතික අයවැය යටතේ ඉදිරිපත් කොට ලබා ගන්නා ලදි ( 16.2 සන්ධිස්ථානය). රජය විසින් 2018 මූල්‍ය වර්ෂය සඳහා ප්‍රකාශයට පත්කරන ලද සම්පූර්ණ අයවැය ඇස්තමේන්තුවල අදාල තොරතුරු ඇතුලත් කර ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව එයට අදාල වියදම් පිළිබඳ මූලික තොරතුරු ඇතුළත් වාර්ෂික වාර්තාව 2016 වසරේ භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත් කර ඇත. කෙසේ නමුත් අයවැය පිළිබඳ මහජන යුක්ති යුක්තය සඳහා පවතින සාක්ෂි සීමිතබව ට්‍රාන්ස්පේරන්සි ආයතනයේ නියෝජිතයෙකු පැවසුවේ ය.
දූෂණ වැළක්වීමේ මෙහෙයුම දියත් කිරීම සහ දූෂණ වැළැක්වීමේ ක්‍රියාකාරී සැලැස්මේ සංවර්ධනය අධීක්ෂණය කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අන්තර් ආයතනික දූෂණ වැළැක්වීමේ කවුන්සලය පිහිටුවා නැත (163 සන්ධිස්ථානය). ඉදිරියේ දි ඇති විය හැකි දූෂණ වැළැක්වීම සඳහා යාන්ත්‍රණයක් සාකච්ඡා කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පාර්ශවකරුවන්ගේ විවිධ කණ්ඩායම් කැඳවුවත් මෙම සාකච්ඡා තුළින් සුළු හෝ කිසිදු නිශ්චිත සංවර්ධනයක් සිදුවී නැති බව ට්‍රාන්පේරන්සි ආයතනය පැවසුවේ ය. මධ්‍ය කාලසීමාවේදි දූෂණ ක්‍රියා සඳහා සමාවක් නැති බව සඳහන් කරමින් ප්‍රකාශනයක් හෝ දිවුරුමක් හඳුන්වාදීමට විධිමත් සාකච්ඡා නොපැවත්වූ බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය තහවුරු කරන ලදි.

**කාල සීමාව අවසන් වූ පසු : සීමාසහිත**
කාල සීමාව අවසන්වන විට වගකීම සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නංවා නොතිබුණි.

16.1 සන්ධිස්ථානය : සම්පූර්ණ කර ඇත
16.2 සන්ධිස්ථානය : ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නියෝජිතයෙකුට අනුව මධ්‍ය කාලයේ වාර්තා වූ ජාතික අයවැය ඇස්තමේන්තු වලට අදාළ සම්මත අනාවරණයන් හැරුණු කොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව එහි අයවැය පිළිබඳ වැඩිදුර තොරතුරු නිකුත් කර නොතිබුණි .
16.3 සන්ධිස්ථානය : 2017 දෙසැම්බර් දූෂණයට එරෙහි ජාතික ක්‍රියාකාරි සැලැස්ම ගොඩනැගීමේ අරමුණු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව විසින් ප්‍රසිද්ධයේ ප්‍රකාශයට පත් කර ඇත. තැපැල , විද්‍යුත් තැපෑල, ෆැක්ස් හෝ එහි වෙබ් අඩවියේ ඇති ෆෝරමය ඔස්සේ ඒ පිළිබඳ යෝජනා සහ අදහස් ඉදිරිපත් කරන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව පුරවැසියන්ට ආරාධනා කර ඇත. යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය තුළ පුරවැසි සහභාගිත්වය ඉතා සීමිත බව සිවිල් සංවිධාන විසින් පවසන ලදි.
කාලසීමාව අවසන් වන විට දූෂණයට එරෙහි ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය වෙමින් පැවති බව සහ එහි අන්තර්ගතය තවමත් තහවුරු කර නැති බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් තහවුරු කරන ලදි. කෙසේ නමුත් සංවර්ධනය පිළිබඳ සාකච්ඡා ඉතා පුළුල් ඒවා වූ අතර එයට සිවිල් සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද අදහස් ද ඇතුළත් විය. දූෂණ වැළැක්වීමේ සමස්ථ ගමන්මග මෙහෙයවීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව විසින් අන්තර් ආයතනික නිවාරණ කවුන්සලය පිහිටුවා නොතිබුණත් ක්‍රියාත්මක කිරීමේ දි අන්තර්

ආයතනික සහයෝගය අවශ්‍ය වන බව අනාගත සැලැස්මට අවධාරණය කළහැකි බව ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය පැවසුවේය.
16.4 සන්ධිස්ථානය : ට්‍රාන්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අනුව සැලැස්ම සංවර්ධනය කිරීමේ ආරම්භක සාකච්ඡාවන්හි දූෂණ සඳහා සමාවක් නැත යන්න හඟවන ප්‍රකාශයක් හෝ දිවුරුමක් අනුබද්ධිත ප්‍රමුඛතාවක් ලෙස ඇතුලත් කළ හැකි බව අඟවා ඇත.
අදහසක් ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව සම්බන්ධ කරගත නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරුතුරු ලබාගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : සුළු**
**පුරවැසි සහභාගිත්වය : සුළු**

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදි දූෂණයට එරෙහි වැඩපිළිවෙල තුළ සීමිත පුරවැසි සහභාගිත්වයක් විය. දූෂිත භාවිතයන් සම්බන්ධයෙන් ඉහළ නැඹුරුවක් පෙන්නුම් කරන පොලීසිය සහ රේගුව වැනි මහජනතාව හා සම්බන්ධ ඇතැම් ආයතන ඇතුළු රාජ්‍ය අංශය තුළ ඉහළ මට්ටමින් දූෂණ ක්‍රියා සිදුවන බව පුරවැසියන් අවබෝධ කරගෙන ඇත. මේ මතය තහවුරු කරමින් 2015 වසරට වඩා ස්ථාන 12 කින් පහතට වැටෙමින් දූෂණ විමර්ශන දර්ශකය අනුව රටවල් 176 කින් 95 වන ස්ථානයට 2016 වසරේ ශ්‍රී ලංකාව ස්ථානගත කර ඇත.

2017 වසරේ දර්ශක තුල ශ්‍රී ලාංකාව ලකුණු 2 ක් ලබා ගෙන ඇති අතර රටවල් 180 කින් 91 වෙනි ස්ථානය ලබා ගනිමින් ස්ථාන 4 කින් ඉහළට ගොස් ඇත. සලකා බලනු ලබන රටවල්වල් වල සංඛ්‍යාව වාර්ෂිකව වෙනස්වීම හේතු කොට ගෙන මෙම ශ්‍රේණිගත කිරීම අසම්පූර්ණ සැසඳුමක් ලෙස පෙනුනත් ශ්‍රී ලංකාවේ සිදුවන දූෂණ ක්‍රියා පිළිබඳ පුරවැසි අවබෝධයෙහි අවම වර්ධනයක් සිදුව ඇතැයි ඒ තුළින් පෙන්නුම් කෙරේ. කෙසේ නමුත් අවසන් කර ඇති සීමිත වැඩ කොටස සලකා බැලීමේ දි මෙම වර්ධනය මෙම වගකීමට අරෝපනය කළ හැකි ද යන්න සැක සහිතය.
දූෂණයට එරෙහි වැඩපිළිවෙල තුල මහජන සහභාගිත්වය හඳුන්වාදීමට සහ ඒ තුළින් සෘජුවම විවෘත පාලනයට දායකවීමට මෙම වගකීම උත්සාහ ගෙන ඇත. මෙම වගකීම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළා නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාවේ අයවැය මහජන පරීක්ෂාවට විවෘත කිරීම තුළින් මූල්‍යමය විනිවිදභාවය සහ තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීමට හැකිවනු ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව විසින් මෙම ක්‍රියාකාරකම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකළ බව සිවිල් සංවිධාන සඳහන් කළත් අයවැය ඇස්තමේන්තු සහ අදාළ වියදම් ප්‍රකාශයට පත් කිරීම තුළින් අදහස් වන්නේ මෙම වගකීම තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව සුළු වශයෙන් වර්ධනය කිරීමට දායක වි ඇති බවයි.

එලෙසම අන්තර් ආයතනික දූෂණ නිවාරණ කවුසලය ස්ථාපිත කිරීම තුලින් දූෂණයට එරෙහි අදාල තීරණ ගැනීම සම්බන්ධයෙන් සිවිල් සංවිධානවලට සහභාගිවීමට අපූරු අවස්ථාවක් උදා කර දෙනු ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව මෙම කවුන්සලය ස්ථාපිත කළේ නැතිමුත් දූෂණ වැළැක්වීමේ ක්‍රියාකාරී සැලැස්ම ගොඩනැගීමේ සාකච්ඡාවලට යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට සහ අදාල සිවිල් සංවිධාන නියෝජිතයන්ට ආරාධනා කර ඇත. මෙය පුරවැසි සහභාගිත්වයේ සුළු වර්ධනයක් නියෝජනය කරන බව සිවිල් සමාජ සංවිධාන පිළිගනී.

**ඉදිරියට රැගෙන යායුතු ද?**

**මෙම වර්තාව පිළියෙල කරන අතරතුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරි සැලැස්ම නිකුත් කර නොතිබුණි.**
2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ **මෙම වගකීම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ යුතු බව IRM පර්යේෂක නිර්දේශ කොට ඇත. කෙසේ නමුත් පර්යේෂක මෙම වගකීම වැඩිදියුණු කිරීම සඳහා සහ අනාගතයේ දි ඇති කළ හැකි බලපෑම තවදුරටත් වර්ධනය කිරීමට අතිරේක ක්‍රියාකාරකම් ගණනාවක් යෝජනා කරයි.**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අයවැය ක්‍රියාවලිය තුළ මහජන සහභාගිත්වය සඳහා විධිවිධාන සහ නිල ක්‍රියාපටිපාටි හඳුන්වාදීම, මෙම ක්‍රියාවලියට අදාළ පැමිණිලි ලියාපදිංචි කිරීම සඳහා මහජනතාවට සම්බන්ධවිය හැකි යාන්ත්‍රණයක් ලබාදීම, දූෂණයට එරෙහිව පුළුල් වැඩකොටසක් ආවරණය වන පරිදි දූෂණ වැළැක්වීමේ ක්‍රියාකාරී සැලැස්මේ විෂය පථය පුළුල් කිරීම, නිවාරණ ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීම නියාමනය සහ ඇගයීම සඳහා ස්වාධීන බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් පත් කිරීම මෙම ක්‍රියාකාරකම්වලට ඇතුලත්ය.

## 17. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ වගකීම් සහ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

**වගකීමේ ආදර්ශ පාඨය :**
**ක්‍රියාකාරී මහජන සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම ( 2 වන කොටස)**

[...]

**ප්‍රධාන අරමුණ :**

**සන්ධිස්ථාන :**

- 17.1 දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අනිවාර්ය සහ අනිවාර්ය නොවන නිර්දේශ (1- 15) ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා රජය විසින් රාජ්‍ය නිලධාරීන්, සිවිල් සංවිධාන නියෝජිතයන් සහ පුද්ගලික අංශයේ නියෝජිතයන් ගෙන් සමන්විත බහුපාර්ශවකරුවන්ගේ නියාමන කවුන්සලය පත් කිරීම.

- 17.2 ප්‍රතිපත්ති සම්පාදනයේ දි රජයට මඟපෙන්වන අංගයක් ලෙස රාජ්‍ය ප්‍රතිපත්තියේ මූලධර්ම තුළ දූෂණයෙන් නිදහස් බව පිළිගැනීමට විධිවිධාන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීමට රජය කටයුතු කිරීම.

,

**වගකිව යුතු ආයතනය :** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**උපකාරක ආයතනය:** ට්‍රාන්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය** : 2016 අගෝස්තු
**අවසන් දිනය** : 2018 ජූනි :

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ වගකීම් ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීමෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දූෂණයෙන් නිදහස්වීම පිළිගැනීම තුළින් දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම මෙම වගකීමේ අරමුණයි.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු | | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | හළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාත්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්ථනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුරවල | වෙනස්වී නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙනන |
| 17. දූෂණයට එරෙහි එක්සත් ජාතීන් ගේ සම්මුතියේ වගකීම් ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවස්ථා සංශෝධනය | | | ✔ | | | ✔ | | | | ✔ | | | ✔<br>✔ | | | | | ✔ | | | |

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : ආරම්භවී නැත**

මධ්‍ය කාලසිමාව වනවිට මෙම වගකීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට නොතිබුණි. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ වගකීම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ මණ්ඩලය පත්කර නැති බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ට්‍රාන්සපේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය තහවුරු කරන ලදි ( 17.1 සන්ධිස්ථානය).
ලෙසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දූෂණවලින් නිදහස්වීම පිළිගැනීම සඳහා විධිවිධානයක් ඇතුලත් කිරීම අපැහැදිලි ලෙස වගකීමේ සඳහන් වුවත් මෙම කාර්ය ඉදිරියට ගෙන යාම සඳහා කිසිදු සංවර්ධනාත්මක ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව රජය සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් පිළිගත්හ. කෙසේ නමුත් මෙම විධිවිධානය හඳුන්වාදීමේ වගකීම මූලික වශයෙන් පැවරෙන්නේ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ නියෝජිතයන් සහ ආයතන මත බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් සඳහන් කරන ලදි ( උදා : මැතිවරණ කොමිසම).

**කාලසීමාව අවසන් වූ පසු : ආරම්භවී නැත**
කාලසීමාව අවසන්වන විට මෙම වගකීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් දක්නට නොතිබුණි.

17 .1 සන්ධිස්ථානය : ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අනුව දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ වගකීම් ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා කවුන්සලයක් පත් කිරීම තහවුරු කළේ හෝ ඒ සම්බන්ධයෙන් කිසිවක් පැවසුවේ නැත.

17.2 සන්ධිස්ථානය : දූෂණයෙන් නිදහස්වීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් කිරීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට කිසිදු වැදගත් සාකච්ඡාවක් නොපැවත් වූ බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය තහවුරු කළේ ය.කෙසේ නමුත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දූෂණයට එරෙහිවීම සම්බන්ධයෙන් අදාල වැඩිදියුණු කළ හැකි නිර්දේශයන් සහ ඇගවීම් ස්වාධිනව ඇගයීමට ලක්කර ඇති අතර එවැනි අවස්ථා පිළිබඳ ඔවුන්ගේ වෙබ් අඩවිය ඔස්සේ අවධාරණය කර ඇත.

අදහසක් ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කරගත නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද ?**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් සිදුවි නැත**

ක්‍රියාකාරි සැලැස්ම ආරම්භයේදීම දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහජන සහභාගිත්වය සීමාසහිත හෝ කිසිදු සහභාගිත්වයක් නොවීය. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ බලතල ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 156 A වගන්තියෙන් ප්‍රකාශයට පත්කර ඇත.
මෙම වගකීම මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සඳහා බහුපාර්ශවකරුවන්ගේ මණ්ඩලයක් හඳුන්වා දී ඇති අතර ඒ තුළින් රට තුළ පුරවැසි සහභාගිත්වය වර්ධනය වනු ඇතැයි ඔවුන් අපේක්ෂා කර ඇත. කෙසේ නමුත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මෙම මණ්ඩලය පත්කොට නැති බැවින් මෙම වගකීම පුරවැසි සහභාගිත්වය වර්ධනය කිරීම හරහා විවෘත පාලනය වැඩි දියුණු කිරීමට දායක වි නැත.

**ඉදිරියට රැගෙන යා යුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාව සඳහා ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ වැදගත්කම සහ දූෂණයෙන් නිදහස් වීම පිළිබඳ ව්‍යවස්ථාමය ආරක්ෂණයක් හඳුන්වාදීමේ වැදගත්කම IRM පර්යේෂක විසින් 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ සඳහන් ඇත. කෙසේ නමුත් වඩාත් ශක්තිමත් බලාත්මක කිරීමේ යාන්ත්‍රණයකට මෙම වගකීමේ බලපෑම ඉහළ නැංවිය හැකිව තිබුණ බව පර්යේෂක යෝජනා කරයි. යෝජනා කරන ලද නියාමන මණ්ඩලය ශක්තිමත් කිරීම හෝ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ රාජ්‍ය පාර්ශවකරුවන්ගේ ප්‍රතිචාර සහ ප්‍රගතිවාර්තා අනාවරණය කිරීම හෝ දූෂණ නිවාරණ සැලැස්ම යටතේ පවතින පුළුල් වැඩසටහන් බලාත්මක කිරීම මෙහිදී විශේෂයෙන්ම පර්යේෂක නිර්දේශ කර ඇත (16 වෙනි වගකීම බලන්න) .

# 18. දූෂණයට එරෙහි ආයතන අතර සම්බන්ධීකරණය

**වගකීමේ ආදර්ශ පාඨය :**

**මූලික අරමුණ :දූෂණ විරෝධී ආයතනන අතර සම්බන්ධීකරණය සහ තොරතුරු හුවවමාරු කරගැනීම ශක්තිමත් කිරීම සඳහා දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම (3 වන කොටස).**

**සන්ධිස්ථාන :**

- 18.1 එකම ආකාරයේ වැඩසටහන් නැවත නැවත ක්‍රියාත්මකවීම වැළැක්වීම, තොරතුරු හුවමාරු කරගැනීම වැඩිදියුණු කිරීම ( උදා :අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා 17 වන සංශෝධනය), දූෂණ චෝදනා පිළිබඳ ස්වාධීන සහ විශේෂඥ විමර්ශන සිදුවනබව සහතික කිරීම සඳහා රජය විසින් සිවිල් සංවිධාන සහ පුද්ගලික ආයතන හා එක්ව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ අදහස් විමසීමෙන් ඒ සඳහාම වෙන්වූ බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් පත් කිරීම.
- 18.2 දූෂණ විමර්ශන ආයතනය විසින් සොයාගත් තොරතුරු තම මහජන බලප්‍රදේශය තුළ ප්‍රකාශයට පත්කිරීම අනිවාර්ය කිරීම සඳහා ඒ පිළිබඳ බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් පත් කිරීම.
- 18.3 දූෂණ විමර්ශන ආයතනයේ නියෝග පිළිබඳ බහුපාර්ශකරුවන්ගේ නිර්දේශ රජය සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම සහ සෑම ආයතනයක්ම එකම ක්‍රියාකාරකම නැවත ක්‍රියාත්මක කරන අවස්ථා වාර්ෂිකව ප්‍රසිද්ධියේ වාර්තා කිරීම.
- 18.4 එවැනි කමිටු විසින් සොයාගත් තොරතුරු ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සිවිල් සංවිධාන විසින් ප්‍රසිද්ධියේ නියාමනය කිරීම.

**වගකිව යුතු ආයතනය : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

උපකාරක ආයතනය : ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය : 2016 අගෝස්තු**
**අවසන් දිනය : 20018 ජූනි**
සංස්කාරක සටහන : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** දූෂණයට එරෙහිව කටයුතු කරන ප්‍රධාන ආයතන අතර සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කරගැනීම වැඩිදියුණු කරමින් දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම **මෙම වගකීමේ අරමුණයි.**

මෙම ආයතන අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් ඇති කිරීම සහ තොරතුරු හුවමාරු කරගැනීම දූෂණ පිළිබඳ විමර්ශන ඉතා උසස් ලෙස සිදුකිරීමට සහ ඒ පිළිබඳ චෝදනා ඉදිරිපත් කිරීමට වඩාත් අවස්ථා ලබා දීමට හේතුවනු ඇතැයි රජය සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් අපේක්ෂා කෙරේ.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | | | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගකීම | තිරසාරභාවය සහ වගකීම සඳහා තාක්ෂණය | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනස්වී නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 18. දූෂණයට එරෙහි ආයතන අතර සම්බන්ධීකරණය | | | ✔ | | ✔ | ✔ | | | | | ✔ | | මධ්‍ය කාලසීමාව | ✔ | | | | | ✔ | | | |
| | | | | | | | | | | | | | කාලය අවසන් වූ පසු | ✔ | | | | | | | | |

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව :ආරම්භවී නැත**

මධ්‍ය කාලසීමාව වනවිට මෙම වගකීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. දූෂණයට එරෙහිව කටයුතු කරන විවිධ ආයතනවල නියෝග ඇගයීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් පිහිටුවා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම වගකීම යටතේ වූ තොරතුරු ප්‍රකාශ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කමිටුවේ නිර්දේශ නියාමනය කිරීම වැනි අනෙකුත් එකඳු සන්ධිස්ථානයක් වත් ආරම්භ කිරීමට නොහැකි විය (18.1 - 18.4 සන්ධිස්ථාන).

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අනුව දූෂණ මර්දනය කිරීම සඳහා වූ සාමූහික ප්‍රයත්නයන් තුළ විවිධ ආයතනවලට විවිධ අංශයන් පිළිබඳ විධිමත් කාර්යන් පවරා ඇත. විධිවිධාන යාවත්කාලීන කිරීම සඳහා විවිධ ආයතන පාලනය කරනු ලබන නීති සංශෝධන කිරීම සඳහා ගන්නා උත්සාහයන් ඉදිරියට රැගෙන යායුතු බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල යෝජනා කරයි.
මෙම වගකීමේ ප්‍රගතියක් නොමැති බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නියෝජිතයෙකු තහවුරු කරන ලද නමුත් සොරාගත් වත්කම් නැවත අයකර ගැනීමේ ජනාධිපති කාර්යසාධක බලකාය රජය විසින් ස්ථාපිත කර ඇති බව පැවසුවේය. වත්කම් අයකරවා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම කාර්යසාධක බලකා පිහිටවා ඇති අතර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මූල්‍ය අපරාධ විමර්ශන අංශය සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය ඇතුළු දූෂණයන්ට එරෙහිව කටයුතු කරන ප්‍රධාන පාර්ශවකරුවන්ගෙන් මෙම බලකාය සමන්විත වේ. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අනුව මෙම කාර්ය සාධන බලකායේ ක්‍රියාකාරිත්වය හරහා විවිධ ආයතනවල එක මත එක වැටෙන විධිනියෝග ඇති බව එහි ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනාගෙන ඇත. කෙසේ නමුත් මේ පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කර නැත.

**කාලසීමාව අවසන් වූ පසු : ආරම්භකර නැත**
කාල සීමාව අවසන් වන විටත් මෙම වගකීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නොතිබුණි. අදහසක් ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කරගත නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබාගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : වෙනසක් වී නැත**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් නැත**

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේදී පොදු අරමුණු හා පොදු විධිවිධාන හැරුණකොට ශ්‍රී ලංකාවේ දූෂණයට එරෙහි සාමාන්‍ය වැඩපිළිවෙල තුළ දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතන සඳහා ලබා දී තිබුණේ සීමිත ඉඩකඩක් පමණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආයතන එකම ආකාරයේ ක්‍රියාකාරකම් නැවත නැවත සිදුකිරීම සහ දූෂණයට එරෙහිව ක්‍රියාත්මක කරන වැඩසටහන් එකිනෙකට සම්බන්ධතාවයක් නොමැති වීම පෙනෙන්ට විය.
දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතනවල විධිනියෝග ඇගයීම සඳහා පහත සඳහන් අරමුණු මුල්කරගෙන බහුපාර්ශවකරුවන්ගේ කමිටුවක් ස්ථාපනය කිරීමෙන් මෙම වගකීම මෙකී ගැටළුවට පිළියම් සෙවීමට උත්සාහ ගෙන ඇත.

a) එකම කාර්ය දෙවරක් සිදුකරන අවස්ථා වාර්තා කිරීම
b) ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීම වර්ධනය කිරීම
c) දූෂණ චෝදනා සඳහා විශේෂඥ සහ ස්වාධීන විමර්ශනය ප්‍රවර්ධනය කිරීම

මෙම කමිටුව විසින් සොයාගත් තොරතුරු ප්‍රකාශයට පත්කිරීම තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කරනු ඇත. එමෙන්ම කමිටුවේ බහුපාර්ශවකරුවන්ගේ සංයුතිය තීරණ ගැනීමේ විධිමත් ක්‍රියාවලිය තුළ රාජ්‍ය නොවන ක්‍රියාකරුවන්ගේ සහභාගිත්වය ඉහළ නංවනු ඇත.
කෙසේ වෙතත් කමිටුව පිහිටවා නැති අතර සොයාගත් තොරතුරු ප්‍රකාශයට පත් කරද නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම වගකීම විවෘත පාලනයට දායකවී නැත.
මෙම ප්‍රගතිය සිදුනොවූ බව ට්‍රාන්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් තහවුරු කරන අතර ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා වූ බහුපාර්ශවකරුවන්ගේ සාකච්ඡා තුළ යෝජිත දූෂණ වැළැක්වීමේ ක්‍රියාකාරී සැලැස්ම තුළ රහස්‍යභාවය හා අදාළ විධිවිධාන සංශෝධනය කිරීම පිළිබඳ සලකා බැලුව බව සඳහන් කරන ලදි.

**ඉදිරියට රැගෙන යායුතු ද**

**මෙම වාර්තාව පිළියෙල කරන අතරතුර ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත්කර නොතිබුණි.**
ශ්‍රී ලංකාවේ දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතන අතර සම්බන්ධීකරණය ප්‍රතිසංවිධානය කිරීමට සහ තොරතුරු හුවමාරු කරගැනීම වැඩි දියුණු කිරීම සඳහා මෙම වගකීම සම්පූර්ණ වශයෙන් ඉටුකිරීම වැදගත්වන බව මෙන්ම අත්‍යාවශ්‍ය පූර්වාදර්ශයක් බව IRM පර්යේෂක 2016 - 2017 IRM මධ්‍යකාලීන වාර්තාවේ සඳහන් කරයි. එබැවින් රජය විසින් මෙම වගකීම අතිරේකයන් හෝ සංශෝධන සමඟ ඊළඟ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළයුතු බව IRM පර්යේෂක නිර්දේශ කරයි. දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතන අතර රහස්‍යභාවය අනිවාර්ය කරන විධිවිධාන ඉවත්කිරීම සඳහා එයට බාධාකරන නීති සංශෝධනය කිරීම සහ යෝජිත බහුපාර්ශවකරුවන්ගේ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ රජයේ වගවීම මහජනතාව විසින් රඳවා ගත හැකි යාන්ත්‍රයක් ගොඩනැගීම මෙයට ඇතුලත්ය .

## 19. දූෂණ සහ මුදල් විශුද්ධිකරණය

**වගකීමේ ආදර්ශ පාඨය :**
**ක්‍රියාකාරී මහජන සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම (4 වන කොටස)**
[...]

මූලික අරමුණ :

සන්ධිස්ථාන :

- 19.1 තහවුරු කරන ලද චෝදනා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාවේ බලතල යටතට වැටෙන අවස්ථාවල මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනා ඇතුලත් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථය පුළුල් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ව්‍යවස්ථා සංශෝධන ආරම්භ කිරීම (එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 14 වෙනි වගන්තියට අනුව)
- 19.2 රජය විසින් 1 වන සන්ධිස්ථානයේ සඳහන්කර ඇති නීති සම්පාදන ලැයිස්තුගත කිරීම සහ නීතිගත කිරීම ( සැලකිය යුතු 19.1)
- 19.3 සිදුකරගෙන යන පරීක්ෂණවවලට අගතියක් සිදුනොවන ආකාරයට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මුදල් විශුද්ධිකරණ සිද්ධීන් පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත ප්‍රකාශයට පත් කිරීම ( සිද්ධීන් සංඛ්‍යාව, විමර්ශනය කරන ලද සිද්ධීන් හි ප්‍රතිඵල යනාදිය)

**වගකිව යුතු ආයතනය :** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**උපකාරක ආයතන :** මූල්‍ය අපරාධ විමර්ශන අංශය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය : 2016 අගෝස්තු**
**අවසන් දිනය** : 2018 ජුනි

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම් පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවියේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මුදල් විශුද්ධිකරණය සහ දූෂණ විමර්ශනය සම්බන්ධයෙන් ඇති බලතල අතර ඇති සම්බන්ධතාවය මනා ලෙස පවත්වාගෙනයාමට කටයුතු කිරීමෙන් දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම මෙම වගකීමේ අරමුණයි .

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම (මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු) | | | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විවෘතභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දරුණු | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 19. දූෂණ සහ මුදල් විශුද්ධිකරණය | | | ✔ | | ✔ | | | | | | ✔ | | | ✔ | | | | ✔ | | | |
| | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**

මධ්‍ය කාලසීමාව අවසන් වනවිට මෙම වගකීමට නිමා කරගත හැකිවූයේ සීමිත වැඩකොටසක් පමණි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්ට අනුව මුදල් විශුද්ධිකරණ සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථය පුළුල් කිරීමට කොමිසම විසින් රජයට අවිධිමත් දැනුම්දීමක් සිදුකර ඇත ( 19.1 සන්ධිස්ථානය). මෙය ව්‍යවස්ථා සංශෝධනය සඳහා ප්‍රවේශයක් වූවායයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය හඳුනාගෙන ඇත.
කෙසේ නමුත් අදාළ සාකච්ඡා අඛණ්ඩව පවත්වා ගෙන ගිය බැවින් අපේක්ෂිත සංශෝධන( 19.2 සන්ධිස්ථානය) යෝජනා කිරීමට හෝ නිතීගත කිරීමට හෝ මුදල් විශුද්ධිකරණය සිද්ධි පිළිබඳ දත්ත ප්‍රකාශයට පත්කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නොහැකි වී ඇත (19.3 සන්ධිස්ථානය). මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීම සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන අංශය මූලික බලතල පවත්වා ගෙන යයි.

**කාල සිමාව අවසන් වූ පසු : සීමාසහිත**

කාලසීමාව අවසන්වනවිට වගකීම විසින් ක්‍රියාත්මක කර ඇත්තේ සීමිත වැඩකොටසක් පමණි.

19.1 -19.3 සන්ධිස්ථානය : ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සිවිල් සංවිධාන නියෝජිතයෙකුට අනුව දූෂණ වැළැක්වීමේ ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් ලෙස මුදල් විශුද්ධිකරණ සිද්ධීන් හි විෂය පථය විශාල කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ව්‍යවස්ථාමය සංශෝධන අඛණ්ඩව කරගෙන යාමට යෝජනා කර අත. මෙය මධ්‍ය කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන ලද අවිධිමත් සැලසුම්වලට අමතරව සිදු වූවකි.

කෙසේ නමුත්, දූෂණ වැළැක්වීමේ සැලැස්ම තහවුරු කර හෝ ප්‍රකාශයට පත්කර නොතිබූ බැවින් මෙම යෝජනාව සම්බන්ධයෙන් ස්ථිර සාක්ෂි නොවීය. දැනට කරමින් පවතින සාකච්ඡා සමඟ මෙම වගකීම යටතේ වැඩිදුර සංවර්ධනයක් ඇති වී නැත. අදහසක් ලබා ගැනීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කරගත නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවම :වෙනසක් වී නැත**

ක්‍රියාකාරී සැලැස්මේ ආරම්භයේ, මුදල් විශුද්ධිකරණයට සම්බන්ධ තහවුරු කරන ලද චෝදනා පාලනය කරන නීති තුළ මුදල් විශුද්ධිකරණය පිළිබඳ විමර්ශන සඳහා ඉඩ කඩ සලසා නැත. උදාහරණ ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලතල මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ සිද්ධි දක්වා පුළුල් කර නැත. එහි ප්‍රතිඵලයක් ලෙස තනි පුද්ගලයන්ට එරෙහිව අල්ලස් ගැනීමකට හෝ දූෂණයකට සම්බන්ධ බරපතල චෝදනාවක් වුවත් මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනාවක් විමර්ශනය කිරීමට හෝ පැමිණිලි කිරීමට නොහැක. දූෂණ විරෝධී ආයතන අතර දුර්වල සම්බන්ධීකරය සහ තොරතුරු හුවමාරු කරගැනීම් මෙම ව්‍යවස්ථාමය සීමාවන් බොහෝ විට විමර්ශන ක්‍රියාවලි නතර කර ඇත.

මෙම වගකීම මුදල් විශුද්ධිකරණ සහ දූෂණ විමර්ශන අතර ඇති බාධාකාරී දුරස්ථභාවයට පිළියම් සෙවීමට උත්සාහ ගෙන ඇත. එසේ කිරීම සඳහා බරපතල චෝදනාව අල්ලස් ගැනීමක් හෝ දූෂණයක් වූ මුදල් විශුද්ධිකරණ සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථය පුළුල් කිරීම සඳහා ව්‍යවස්ථාමය සංශෝධනයන්ට මුලපිරීම, යෝජනා කිරීම සහ නීතිගත කිරීම යන කාර්යන් සඳහා මෙම වගකීම උත්සාහ දරා ඇත. මේ හරහා මුදල් විශුද්ධිකරණය පිළිබඳ දත්ත එකතු කිරීමට ඒවා ප්‍රකාශයට පත් කිරීමට සහ ඒ තුළින් තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට ඇති හැකියාව වර්ධනය කිරීමට මෙම වගකීම යෝජනා කර ඇත.
කෙසේ නමුත් , අදාළ සංශෝධන සඳහා මුලපිරීමෙන් ඔබ්බට යාමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නොහැකි විය. දත්ත ප්‍රකාශයට පත් කිරීමට ඔවුන්ට නොහැකි වූ අතර ඒ හේතු කොට ගෙන තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව හෝ විවෘත පාලනයෙහි වැඩිදියුණුවක් ඇති වී නැත.

**ඉදිරියට රැගෙන යායුතු ද?**

මෙම වගකීම - සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථය පුළුල් කිරීම සඳහා වූ නීති සංශෝධනය විවෘත පාලනයේ අගයන්ට පූර්ණ ලෙස අදාළ නොවන බව 2016 - 2017 වසරේ මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක සඳහන් කරයි. එමනිසා මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන නොයායුතු බව ඔහු නිර්දේශ කරයි.
කෙසේ නමුත් මෙම වගකීමේ විශේෂිතභාවය සහ අදාලත්වය වැඩිදියුණු කිරීම සඳහා සුළු ක්‍රියාමාර්ග කිහිපයක් භාවිතා කිරීමට අදාළ පාර්ශවකරුවන් ධෛර්මත් කර ඇත.
මුදල් විශුද්ධිකරණය පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත ප්‍රකාශයට පත් කිරීමට විශේෂිත මාර්ග සහ යාන්ත්‍රණ සැලසුම් කිරීම :විමර්ශන නිලධාරීන් සඳහා පුහුණු විෂය මලාවක් ගොඩනැගීම සඳහා මුදල් විශුද්ධිකරණ විමර්ශන හා සම්බන්ධ සිවිල් සංවිධාන විශේෂඥයින් කටයුතු කිරීම මෙයට ඇතුළත් ය.

## 20. දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහා මුදල් යෙදවීම හා අදාළ රෙගුලාසි

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය**

**ක්‍රියාකාරී මහජන සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීමකාටස (5 වන කොටස) .**

[...]

**ප්‍රධාන අරමුණ :**

**සන්ධිස්ථාන :**

- 20.1 ප්‍රචාරණ කටයුතු සඳහා අවශ්‍ය සම්පත් සහ ප්‍රමාණය පිළිබඳ හෙළිදරව්වක්(ප්‍රකාශන ලේඛනය)ඇතුළත් කිරීම සඳහා මැතිවරණ නීති සංශෝධනය කිරීම.

**වගකිව යුතු ආයතනය :** මැතිවරණ කොමිසම : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**උපකාරක ආයතන :** ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය** - 2017 ජනවාරි
**අවසන් දිනය** - 2018 දෙසැම්බර්

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** මැතිවරණ නීති සංශෝධනය කිරීමෙන් සහ දේශපාලන ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම හා අදාළ තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම තුළින් දූෂණ විරෝධී වැඩපිළිවෙල ශක්තිමත් කිරීම මෙම වගකීමේ අරමුණයි. මේ සඳහා මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදවන මුදල් ප්‍රමාණය සහ මූලාශ්‍ර පිළිබඳ හෙළිදරව්වක් (ප්‍රකාශන ලේඛනය) මැතිවරණ නීති තුලට ඇතුලත් කිරීම සඳහා නීති සංශෝධනයක් සිදුකිරීමට වගකීම විසින් ආරම්භ කර ඇත. කෙසේ නමුත් විවෘත පාලනයේ අගයන්ට අදාළ වේද යන්න මත මෙම වගකීම තවමත් අපැහැදිලිව ඇත. ප්‍රචාරක කටයුතු සඳහා යෙද වූ මුදල්වල ප්‍රමාණය සහ මූලාශ්‍ර පිළිබඳ හෙළිදරව්වක් ප්‍රසිද්ධ කිරීම තුළ අනාවරණය නොකරන ලද රජය සතු පූර්ව තොරතුරු ලබා ගැනීමේ හැකියාව සහතික කරනු ඇත. කෙසේ වෙතත් වගකීම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ලේඛනය ප්‍රසිද්ධ කරනවාද එසේ නම් එය සිදුකරන්නේ කෙසේ ද යන්න වගකීම විසින් නිශ්චය කර නැත.

වැඩිදුර තොරතුරු සඳහා 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගීත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය හා නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 20. මැතිවරණ කටයුතු සඳහා මුදල් යෙදවීම නියාමනය කිරම | | | ✔ | | පැහැදිලි නැත | | | | | | ✔ | | මධ්‍ය කාලසීමාව: | ✔ | | | | ✔ | | | |
| | | | | | | | | | | | | | කාලය අවසන් වූ පසු: | ✔ | | | | | | | |

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**

මධ්‍ය කාලසීමාව අවසන්වනවිට වගකීමට නිමාකළ හැකිවූයේ සීමිත වැඩකොටසක් පමණි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂල් ශ්‍රී ලංකා ආයතනයේ නියෝජිතයෙකුට අනුව ප්‍රචාරක කටයුතු සඳහා මුදල් යෙදවීම හා අදාළ වියහැකි නීති පිළිබඳ මැතිවරණ කොමිසම ශක්තිමත් කෙටුම්පතක් සකස් කර ඇති නමුත් තවමත් එය ප්‍රකාශයට පත් කර නැත ( 20.1 සන්ධිස්ථානය).
මැතිවණ වියදම් කළමනාකරය කිරීම සඳහා වූ නීති කෙටුම්පත සඳහා රජයට කැබිනට් අනුමැතිය ලැබුණ බව මාධ්‍ය තුලින් ද තහවුරු කර ඇත. මැතිවරණ කටයුතු සඳහා යොදවන මුදල් පිළිබඳ ප්‍රමාණය සහ මූලාශ්‍ර පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රකාශන ලේඛනයක් හඳුන්වාදීම සහ එය ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ විධිවිධානයක් මෙම කෙටුම්පතේ ඇතුළත්ව තිබේ ද නැද්ද යන්න තවමත් අපැහැදිලිය.

**කාල සීමාව අවසන් වූ පසු : සීමාසහිත**

කාල සිමාව අවසන් වනවිට වගකීම විසින් සම්පූර්ණ කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. 20.1 සන්ධිස්ථානය : මැතිවරණ නීති සංශෝධන පිළිබඳ සාකච්ඡා තවමත් කරගෙන යන බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂල් ශ්‍රී ලංකා ආයතනයේ නියෝජිතයකු තහවුරු කරන ලදි. ඒ පිළිබඳ කිසිදු සංවර්ධනාත්මක කිසිවක් මැතිවරණ කොමිසම ප්‍රසිද්ධියේ හෙළිදරව් නොකර බව එම ආයතනය සඳහන් කළේය. අදහසක් ලබා ගැනීම සඳහා මැතිවරණ කොමිසම හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කරගත නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : වෙනසක් වි නැත**
**පුරවැසි සහභාගිත්වය : වෙනසක් වි නැත**
**මහජන වගවීම : වෙනසක් වි නැත**

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන් කෙරෙහි මෙම වගකීම වූයේ අපැහැදිලි අදාලත්වයක් වන අතර එබැවින් එය පාලනය විවෘත කිරීමට දායක වී නැත.

ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භයේ දි ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු, පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා මුදල් යෙදවීම පිළිබඳ අධිකරණ බලයක් සහිත කිසිදු නීතියක් නොවීය. එවැනි නීති නොමැති වීම නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට ඇති හැකියාව වළක්වාලිය කළ හැක. මැතිවරණයට තරඟ කරන්නේ කවුද,කොතරම් හොඳට සහ පුළුල් ලෙස ඔවුන්ට ඔවුන්ගේ පණිවිඩය මහජනතාව අතර ප්‍රචලිත කර හැකිද සහ එම හැකියාව මත තේරී පත්වන දේශපාලන නායකයින් කවුද යන්න ප්‍රචාරක කටයුතු සඳහා යොදවන අරමුදල් තුළින් තීරණය කළ හැක. ඡන්ද නම්මා ගැනීම සඳහා අපේක්ෂකයන් විසින් අධික ලෙස මුදල් වැය කිරීම ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචාරක කටයුතුවල ලක්ෂණයකි. මීට පෙර පැවැත්වූ මැතිවරණවලදි ජානාධිපති අපේක්ෂකයින් මහජන ප්‍රචාරක කටයුතු සඳහා දැවැන්ත මුදලක් වැය කර ඇත.

එබැවින් දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහා යොදවන මුදල් පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම සඳහා මේ වගකීම මැතිවරණ නීති සංශෝධනය කිරීමට ඉලක්ක කෙරේ.කෙසේ නමුත් කාල සීමාව අවසන් වනවිට මැතිවරණ නීති සංශෝධනය කිරීමට හෝ මැතිවරණ කටයුතු සඳහා වැය කළ මුදල් පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමට මැතිවරණ කොමිසමට නොහැකි විය. ඊට අමතරව වගකීමේ සඳහන් පරිදි රජය සතු තොරතුරු හෙළිකරන යෝජිත ප්‍රකාශ ලේඛනය මහජනතාවට හෙළි කරනවා නැද්ද සහ එය කරන්නේ කෙසේ ද යන්න නිශ්චය කර නැත. රාජ්‍ය භාවිතයන්හිද කිසිදු වෙනසක් සිදුවි නැත.

**ඉදිරියට රැගෙන යනවා ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාව සඳහා වූ දෙවෙනි ක්‍රියාකාර සැලැස්ම නිකුත් කර නොතිබුණි.
මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන යායුතු බව 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක නිර්දේශ කරයි. කෙසේ වෙතත් විශේෂිභාවය වර්ධනය කිරීමට සහ මෙම වගකීමේ බලපෑම් ඉහළ නැංවීමට පර්යේෂක ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කර ඇත.
අනාවරණය කරගත් තොරතුරු මහජනතාවට ලබා ගත හැකි ආකාරයේ යාන්ත්‍රණයක් ගොඩනැගීම, දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහා යොදවන මුදල් පිළිබඳ හෙළිදරව් කරන තොරතුරු පිළිබඳ වගවීම අපේක්ෂකයා වෙත පවරන ශක්තිමත් වගවීමක් හෝ දුක්ගැනිවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම මෙයට ඇතුලත් ය.

# 21. වත්කම් ප්‍රකාශ බෙදාහැරීම

**වගවීමේ ආදර්ශ පාඨය :**

**ක්‍රියාකාරී පුරවැසි සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම ( VI කොටස )**

[...]
ප්‍රධාන අරමුණ :
සන්ධිස්ථාන :

- 21.1 ඉල්ලීමක් ඉදිරිපත් කිරීම තුළින් ලබාගත් එවැනි වත්කම් සහ බැරකම් ප්‍රකාශන බෙදාහැරීමට සහ ප්‍රකාශයට පත්කිරීමට වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ 7(4) , 7 (5) සහ 8 වගන්ති අහෝසි කිරීම සඳහා වූ ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ජනාධිපති කාර්යාලය සමඟ සාකච්ඡා ආරම්භ කිරීම.

- 21.2 රජය විසින් සන්ධිස්ථාන 1 ට අදාළ නීති ලැයිස්තුගත කිරීම සහ නීතිගත කිරීම (සැලකිය යුතු :21.1)

**වගකිව යුතු ආයතනය** :අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව

**උපකාරක ආයතනය :** ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය** : 2016 සැප්තැම්බර්
**අවසන් දිනය** : 2017 ජූනි

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** වත්කම් ප්‍රකාශ මහජනතාව අතර බෙදා හැරීමට පහසුකම් සලසමින් දූෂණයට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කිරීම මෙම වගකීමේ අරමුණයි. මෙම වගකීම ඉටු කිරීම සඳහා වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සඳහා ව්‍යවස්ථා වලදිරිපත් කිරීම සහ නීතිගත කිරීම යන කාර්යන් මේ වන විට වගකීම විසින් ආරම්භ කර ඇත.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම (මධ්‍ය කාලසීමාව / කාලය අවසන් වූ පසු) | | | | එය විවෘත රාජ්‍යයයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 21. වත්කම් ප්‍රකාශන බෙදා හැරීම | | | | ✔ | ✔ | | | | | | ✔ | | | ✔ | | | | | ✔ | | |
| (කාලය අවසන් වූ පසු) | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව : සීමාසහිත**

මධ්‍ය කාලසීමාව අවසන් වනවිට වගකීම විසින් නිමා කර තිබුණේ සීමිත වැඩකොටසක් පමණි. වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සඳහා යෝජනා ඉදිරිපත් කරමින් කොමිසම කැබිනට් පත්‍රිකාවක් පිළියෙල කොට ඇගයීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් සඳහන් කරන ලදි (21. 1 සන්ධිස්ථාන). නීතයේ අදාළ අංශ ඉවත්කළ බව සඳහන් කරන කැබිනට් සංදේශයක් උපුටා දක්වමින් ට්‍රාන්ජේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සිවිල් සංවිධාන නියෝජිතයෙකු මේ බව තහවුරු කරන ලදි.

කෙසේ නමුත් ස්ථිර නීති සංශෝධනයන් තවමත් සාකච්ඡා කරමින් පවතින බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහන් කරන ලදි (21.1 සන්ධිස්ථාන). වත්කම් හෙළිදරව් කිරීමේ 'සංවේදී සහ තරඟකාරී' ස්වභාවය උපුටා දක්වමින් නීති සංශෝධන සඳහා ගන්නා උත්සාහයන් අනුක්‍රමිකව පියවරෙන් පියවර ඉදිරියට යායුතු බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පවසන ලදි.

**කාලය අවසන් වූ පසු : සීමාසහිත**

කාලය අවසන්වනවිට වගකීම ක්‍රියාවට නංවා තිබුණේ සීමිත වැඩකොටසක් පමණි.

21.1 -21 2 සන්ධිස්ථාන :වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සඳහා වූ සංශෝධන සාකච්ඡා කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව බහුපාර්ශවකරුවන්ගේ වැඩමුළු කිහිපයක් පැවැත් වූ බව ට්‍රාන්සපේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය සඳහන් කරන ලදි. මෙම සාකච්ඡාවන්ට සහභාගිවීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටරනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වැනි සිවිල් සංවිධානවලට ආරාධන කොට ඇති අතර පරිපූර්ණ ක්‍රියාවලියක් අනුගමනය කළ බව සහතික කරන ලදි. කෙසේ නමුත් මෙම සාකච්ඡාවලින් ඔබ්බට නීති සංශෝධනය පිළිබඳ සුළු හෝ කිසිදු ප්‍රගතියක් පෙන්වා නැත.

නීති සංශෝධනය පිළිබඳ වත්මන් තත්ත්වය තහවුරු කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටරනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට නොහැකි වූ අතර අදහසක් ලබා ගැනීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කර ගැනීමට නොහැකි විය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගනීමෙ සඳහා පහහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව: වෙනසක් වී නැත**
**පුරවැසි සහභාගිත්වය : සුළු**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා අදාළ සංශෝධන තහවුරු නොකළ බැවින් මෙම වගකීම තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමෙ හැකියාව වැඩිදියුණු කිරීමට දායකව නැත. කෙසේ නමුත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටරනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අනුව සංශෝධන සලකා බැලීමේ ක්‍රියාවලියට සිවිල් සංවිධාන ඇතුළු පාර්ශකරුවන් විශාල පිරිසක් සහභාගි වී ඇත. අනපේක්ෂිත ලෙසින් සිදු වූවද මෙය සිවිල් පුරවැසියන්ගේ සහභාගිත්වය සුළු වශයෙන් වර්ධනය කිරීමට දායක වී ඇත .

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේ දි වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ විශේෂිත වගන්ති විසින් ඒකාබද්ධ ඉල්ලීම් හරහා ලබා ගත් තොරතුරු ප්‍රසිද්ධියට පත්කිරීම සහ බෙදා හැරීම සීමා කරනලදි. විශේෂයෙන්ම 7(4) සහ 7 (5) වගන්ති මගින් එවැනි තොරතුරු හෙළිදරව් කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් බව තහවුරු කරන අතර 8 වෙනි වගන්තියෙන් වත්කම් සහ බැරකම් හා අදාළ රහස්‍යභාවය රකින ලෙස නියෝග කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස නීති විරෝධී ලෙස එක් රැස්කළ ධනය හෙළිදරව් කිරීමට සහ වැරදි සිදුකරන ලද රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට මහජනතාවට අවස්ථාව ලබා නොදීම පිළිබඳව සිවිල් සංවිධාන පාර්ශවකරුවන් තර්ක කර ඇත.
මෙම වගකීම මෙම වගන්තිය අහෝසි කිරීමට සහ ඒ තුළින් වත්කම සහ බැරකම් ප්‍රකාශන ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු හෙළිදරව් කිරීමට අවසර ලබා ගැනීමට උත්සාහ ගන්නා ලදි. සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළා නම් වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් රජය සතු තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට ඇති හැකියාව වැඩි දියුණු කරනු ඇත.

**ඉදිරියට රැගෙන යායුතු ද ?**

**මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාව සඳහා වූ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි.**

මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන යායුතු බව 2016 – 2017 IRM ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක නිර්දේශ කර ඇත. කෙසේ වෙතත් යෝජිත සංශෝධන සැබෑවක් බවට පරිවර්තනය කිරීමට සහ මෙම වගකීමේ බලපෑම ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ද පර්යේෂක නිර්දේශ කරයි.
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් සම්බන්ධීකරණය කරන ලද පැහැදිලි අභියාචනා ක්‍රියාවලියක් හඳුන්වාදීම, ජ්‍යේෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් සහ වගකීම් පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු පහහසුවෙන් ලබාගත හැකි ආකාරයට, අන්තර්ක්‍රියාකාරීත්වයෙන් සහ භාෂා තුනෙන්ම අන්තර්ජාලයේ වෙබ් අඩවියක් ඔස්සේ අනාවරණය කිරීම මෙයට ඇතුලත් ය. යෝජනා කරන ලද නෛතික විධිවිධානයක් මගින් ප්‍රසිද්ධයට පත් කළ තොරතුරු පිළිබඳ රාජ්‍ය නිලධාරීන් ගෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමට හෝ එයට එරෙහිව පැමිණිල්ලක් සිදුකිරීමට මෙම අභියාචනා ක්‍රියාවලිය තුළින් මහජනතාවට ඉඩකඩ සලසා දේ.

# 9 වන තේමාව : තොරතුරු දැනගැනීමේ අයිතිය

## 22. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම

**වගකීම පිළිබඳ ආදර්ශ පාඨය**

**තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම**
රාජ්‍ය පාලනය තුළ විනිවිදභාවයකින් සහ වගවීමකින් යුත් සංස්කෘතියක් ඇති කිරීමට සහ ඒ තුළ පුරුවැසි සහභාගිත්වය දිරිමත් කිරීම සඳහා තොරතුරු දනගැනීමේ පුරවැසි අයිතිය නීතිමය වශයෙන් පිළිගැනීම සහ තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවිය හැකි සහ ඒ සඳහා පුරවැසියන් බලගන්වන ඵලදායී යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ.
එමෙන්ම එය ක්‍රමානුකූලව දූෂණ මර්දනය කරන මෙවලමක් ලෙස ද කටයුතු කරයි. එය රාජ්‍ය ආයතනවල සංකේන්ද්‍රිත බලයට එරෙහිව පුරවැසි බලය සමබර කරයි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සක්‍රිය වැඩපිළිවෙලක් හඳුන්වාදීම තුලින් ප්‍රජාතන්ත්‍රවාදයේ අංගයන් වන නියෝජනය,වගවීම, සහ සහාගිත්ව තීරණ සඳහා පහසුකම් සලසනු ඇත.

**ප්‍රධාන අරමුණ :**
තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති සම්මත කිරීමෙන් සහ ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමෙන් තොරතුරු ලබා ගැනීම සඳහා මහජනතාව ප්‍රවේශ වීම වර්ධනය කිරීම.

**සන්ධිස්ථාන :**

- 22.1 කතානායකවරයා විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කිරීමෙන් අනතුරුව මාස 6 ක් තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම් ආරම්භ කළ හැකි බව ජනමාධ්‍ය භාරව සිටින අමාත්‍යාංශය විසින් සහතික වීම
- 22.2 තොරතුරු කොමසාරිස්වරු සහ ඔවුන්ගේ කාර්යමණ්ඩලය සහ තොරතුරු නිලධාරීන් ඇතුළු තොරතුරු දැනගැනීමේ අයිතිය හා අදාළ ප්‍රධාන ක්‍රියාකරුවන් පත් කිරීම සහ පුහුණු කිරීම :

(a) ව්‍යවස්ථාදායක සභාව විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම පත් කිරීම

(b) ජනමාධ්‍ය භාරව සිටින අමාත්‍යාංශය සහ/ හෝ කොමිසම තොරතුරු නිලධාරියා සහ පත්කරන ලද නිලධාරීන් සඳහා ආරම්භක කොන්දේසි යොමුව පිළියෙල කිරීම.

(c) ජනමාධ්‍ය අමාතාංශය විසින් අමාත්‍යාංශ මට්ටමේ තොරතුරු නිලධාරීන් සහ පත්කරන ලද අනෙකුත් නිලධාරීන් සඳහා පනත යටතේ වූ ඔවුන්ගේ කාර්යන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් තේමාවන් පිළිබඳ පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වීම.

- තොරතුරු දැන ගැනීමේ අයිතියේ අගයන් සහ එහි භූමිකාවන්
- ඉල්ලීම් ලබා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම
- තොරතුරු ඉල්ලා සිටීමට පෙර අනාවරණය
- වාර්තා කිරීම කළමනාකරණය

(d) ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමසාරිස්වරුන් සහ කොමිසමේ කාර්යමණ්ඩලය සන්සන්දනීය අධිකරණයන් තුළ ඇති

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම්හි සම්පත්දායකයින් ලවා පුහුණු කරවීමට පහසුකම් සැලසීම.

(e) රහස්‍යභාවය පිළිබඳ ආකල්ප පුරවැසි සහභාගිත්වය, වගවීම සහ පුරවැසියන්ට සහායවීම වෙත වෙනස් කරවීමට ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතන දැනුවත් කිරීම සහ පුහුණු කිරීම.

- 22.3 සම්පත් ප්‍රතිපාදන, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලීන්:
  - (a) ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකාරක නිලධාරියෙක් පත් කිරීම
  - (b) තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකාරක නිලධාරියා විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
  - (c) අයකිරීමක් නොමැතිව ලබා දෙන තොරතුරුවල විස්තර ද ඇතුළු පනතේ විධිවිධානවලට අනුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම විසින් ඒ හා අදාළ රීති ගැසට්පත්‍රයේ පළකිරීම

  (d) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම විසින් රජයේ ආයතන සඳහා වාර්තා පවත්වාගෙන යාම පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම

  (e). ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් පනතට අදාළ විධිවිධානවලට අනුව රෙගුලාසි ගැසට් කිරීම.

  (f) තොරතුරු දැනගැනීමේ අයිතිය හා අදාල සම්පත් ප්‍රතිපාදන පළාත් සහ වාර්ෂික අයවැයට ඇතුළත් කිරීමට ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම.

  (g)ජනාධිපති ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ උපකාරක ඇමතුම් මධ්‍යස්ථානය, ලැබෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අදාළ ආයතනය වෙත ලිඛිතව සන්නිවේදනය කරන ත්‍රෛභාෂිකව සිදුකරන තොරතුරු සඳහා අයිතිය හා සම්බන්ධ ප්‍රධාන මධ්‍යම සංචිතයක් ලෙස ගොඩනැගීම

  (h) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම් හි විශ්ලේෂ නිරීක්ෂණය, නියාමනය සහ වාර්තා කිරීමේ ක්‍රමවේදයක් ගොඩනැගීමට ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් පහසුකම් සැලසීම

  (i) පාර්ලිමේන්තුව විසින් 1955 අංක 32 දරණ රාජ්‍ය රහස් පිළිබඳ පනත සහ තොරතුරු දැනගැනීමේ අයිතියේ අනුකූලත්වය සඳහා වූ ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම - පරස්පර රහස්‍යතාවයන් නිශ්චය කිරීම හෝ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වැඩපිළිවෙලට අනුකූලව එක හා සමාන විධිවිධාන සංශෝධනය කිරීම

- 22.4 මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම :

  (a) ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය අනෙකුත් අදාළ රාජ්‍ය ක්‍රියාකරුවන් සමඟ සහයෝගිත්වයෙන් කාණ්ඩ 3 ක් ඉලක්ක කරගනිමින් අවම වශයෙන් මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් 3 ක් පැවැත්වීම - සමාන්‍ය ප්‍රජාව, සමාජ සුභසාධනලාභීන් සහ කාන්තාවන්.

  (b) ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය අනෙකුත් අදාළ රාජ්‍ය ක්‍රියාකරුවන් සමඟ සහයෝගිත්වයෙන් සිවිල් සමාජය විසින් විවිධ ක්ෂේත්‍ර තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතය පිළිබඳ ඉලක්කගත මහජන දැනුවත්කිරීම් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(c) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වැඩසටහන් සඳහා රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය තුළ සතියකට පැයක් වෙන් කිරීම - තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ප්‍රධාන සිද්ධීන්, ක්‍රියාකරුවන්, ලැබූ ජයග්‍රහණ , සංවාද යනාදිය අලලා.

(d) සතියකට දෙවතාවක් තොරතුරු දැනගැනීමේ අයිතිය හා අදාළ තොරතුරු ඇතුලත් ලිපි රාජ්‍ය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි පුවත්පත්වල පළවන බවට රජය සහතික වීම

**වගකිවයුතු ආයතනය :** ජනමාධ්‍ය හා මුදල් අමාත්‍යාංශය
**උපකාරක ආයතන** : තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය

**ආරම්භක දිනය : 2016 අගෝස්තු**
**අවසන් දිනය** : 2018 ජූනි

සංස්කාරක සටහන්: සඳහන් කර ඇති ආකාරයට එය විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට සෘජුවම අදාළ, පරිවර්තනීය බලපෑමක් ඇති කළහැකි සහ සැලකිය යුතු මට්ටමකින් හෝ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ තරු ලකුණු ලබාගත් වගකීමක් ලෙස හැඳින්විය හැක.
ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ** : තොරතුරු දැනගැනිමේ අයිතිය පිළිබඳ නීති පැනවීම සහ ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මෙම වගකීමේ අරමුණයි. මීට පෙර ලබා නොහැකි වූ රජයේ තොරතුරු සහ දැනට රජය විසින් පවත්වාගෙන යන තොරතුරු ඇතුළු පුළුල් පරාසයක් තුළ විහිදී ඇති තොරතුරු සඳහා ක්ෂණිකව මහජනතාවට ප්‍රවේශවීමේ හැකියාව සහතික කිරීම මෙම වගකීම හරහා රජය සහ සිවිල් සමාජය පාර්ශවකරුවන් අපේක්ෂා කෙරේ.

| වගකීම පිළිබඳ දළ විශ්ලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාවව / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිසිවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය | කිසිවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 22. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කිරීම සහහ ක්‍රියාත්මක කිරීම | | | | ✔ | ✔ | | | ✔ | | | | ✔ | | | ✔ (මධ්‍ය කාලසීමාව) ✔ (කාලය අවසන් වූ පසු) | | | | | ✔ | |

**තත්ත්වය**
**මධ්‍ය කාලසීමාව : සැලකිය යුතු**

තොරතුරු දැනගැනීමේ පනත සම්මත කිරීමෙන් සහ තොරතුරු දැනගැනීමේ කොමිසම පත් කිරීමෙන් සමස්ථයක් ලෙස මධ්‍ය කාලය වනවිට සැලකිය යුතු ප්‍රමාණයකට මෙම වගකීමේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ගත හැකි වි ඇත. කෙසේ නමුත් සම්පත් වෙන්කිරීම සහ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම යන ක්ෂේත්‍රවලට අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණ කරගැනීමට නොහැකි වී ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මඟපෙන්වීම තුල තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ සහයෝගිත්වයෙන් මධ්‍ය කාලය වනවිට සැලකිය යුතු ජයග්‍රහන කිහිපයක් අත්පත් කරගැනීමට මෙම වගකීමට හැකි විය.
එයට පහත සඳහන් ජයග්‍රහන අයත් වේ .:

- 2016 අගෝස්තු 4 පාර්ලිමේන්තු කතානායකවරයා විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතිය සහතික කිරීම නීතිගත කිරීම ( 22.1 සන්ධිස්ථානය)
- 2017 පෙබරවාරි 3 නීතිය නීතිගත කළ දිනය ලෙස සහතික කරමින් ගැසට් පත්‍රයක් නිකුත් කිරීම( 22.1 සන්ධිස්ථානය) .
- 2016 දෙසැම්බර් මාසයේ දි සම්පූර්ණ කොමිසම සහ නියෝජිතයෙකු පත් කිරීම( 22.2 සන්ධිස්ථානය)
- නීතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකරුවන් සඳහා රෙගුලාසියක් ලෙස මූලික කොන්දේසි යොමුව ගොඩනැගීම සහ ප්‍රකාශයට පත් කිරීම (22.2 සන්ධිස්ථානය) .
- අයකිරීමක් නොමැතිව ලබා දෙන තොරතුරු පිළිබඳ විස්තර පෙන්නුම් කරමින් 2017 පෙබරවාරි නීති මාලාවක් ප්‍රකාශයට පත් කිරීම( 22.3 සන්ධිස්ථානය) .
- තොරතුරු දැනගැනීමේ පනතේ සඳහන් කාර්යන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සහතික කිරීම( 22.3 සන්ධිස්ථානය).
- තොරතුරු දැනගැනීමේ පනතේ විවිධ ස්වරූප පිළිබඳ ලිපි රජයේ විවිධ පුවත්පත්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන් ගෙන් ප්‍රකාශයට පත් කිරීම(22.4 සන්ධිස්ථානය) .

මෙම ජයග්‍රහණ හරුණ කොට මධ්‍ය කාලසීමාව අවසන්වනවිට ප්‍රධාන සන්ධිස්ථාන කිහිපයකම කටයුතු අසම්පූර්ණව හෝ ආරම්භ කර නොතිබුණි. තොරතුරු නිලධාරීන් සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමසාරිස්වරුන් පුහුණු කිරීම(22.2 සන්ධිස්ථානය)፡ රජයේ ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්(22.2සන්ධිස්ථානය)፡ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා අමාත්‍යාංයේ නිලධාරියෙකු පත් කිරීම(22.3 සන්ධිස්ථානය)፡වාර්තා කිරීම මනාව පවත්වාගෙන යාම සඳහා මාර්ගෝපදේශ ගොඩනැගීම (22.3 සන්ධිස්ථානය)፡ තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලුම් පත්‍රයක් සහ විශ්ලේෂණ ක්‍රමවේදයක් හඳුන්වාදීම (22.3 සන්ධිස්ථානය)፡ මෙම සියලු කාර්යන් අසම්පූර්ණ හෝ ආරම්භකර නැත.

විශේෂයෙන්ම මධ්‍ය කාලසිමාවේ දි තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් සීමිත ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි(22.4 සන්ධිස්ථානය). අමාත්‍යාංශය විසින් ඉලක්ක කරන ලද මාධ්‍ය හෝ සිවිල් සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා හෝ ප්‍රධාන සිද්ධීන් සහ ජයග්‍රහන පිළිබඳ සාකච්ඡා කිරීමට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වැඩසටහන් සතිපතා විකාශය කර නොතිබුණි.

වැඩිදුර විස්තර සඳහා 2016 - 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න.

**කාල සීමාව අවසන් වූ පසු : සැලකිය යුතු**

කාලසීමාව අවසන් වන විට මෙම වගකීමේ කාර්යන් සැලකිව යුතු ප්‍රමාණයකින් අවසන් කර තිබුණි. මධ්‍ය කාලසීමාවේ සිට සම්පූර්ණ කිරීම සම්බන්යෙන් සීමිත ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණ බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් තහවුරු කරන ලදි.
විශේයෙන්ම ඇති වූ සංවර්ධනයන් පහත දැක්වේ :

- 22.2 වෙනි සන්ධිස්ථානය : තොරතුරු දැනීමේ අයිතිය සඳහා කරන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ පුහුණුව ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ සියලුම තොරතුරු නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ලබා ගෙන ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම විසින් තහවුරු කරන ලදි. මේ සම්බන්ධයෙන් කොමිසම විසින් ස්ථිර සාක්ෂි ලබා නොදෙන ලදි. කෙසේ වෙතත් පුහුණුව ලැබූ තොරතුරු නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් මේවනවිට විවිධ රාජ්‍ය ආයතනවලට මාරුකර යවා ඇති බැවින් පත්ව ඇති නව කාර්යමණ්ඩලයට පුහුණු ලබා දිය යුතු බව කොමිසම සඳහන් කරන ලදි.
- 22.2/22.4 සන්ධිස්ථාන : අමාත්‍යාංශය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම සමඟ සහයෝගිත්වයෙන් සංවේදිකරණ වැඩසටහන් සහ මහජන දැනුවත්කිරීමේ ක්‍රියාමාලාවන් කිහිපයක් පවත්වන ලදි.
- 22.4 සන්ධිස්ථානය : අමාත්‍යාංශය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම සමඟ සහයෝගිත්වයෙන් රජයේ ආයතන හරහා බෙදා හැරීමට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පත්‍රිකා 50000 කට අධික ප්‍රමාණයක් මුද්‍රණය කර ඇත.

කෙසේ නමුත් මෙම වගකීම යටතේ වූ අනෙකුත් සන්ධිස්ථාන කිහිපයක් තවමත් අසම්පූර්ණව ඇත.
22.3 සන්ධිස්ථානය :
(a) කෙසේ නමුත් අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සම්බන්ධිකරණ නිලධාරියා නිළ වශයෙන් තවමත් පත්කර නැතිබව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම තහවුරු කරන ලදි.

(b) හොඳ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම - යෝජිත සම්බන්ධීකරණ නිලධාරියාට කාර්යන් පැවරීම බාහිර පුහුණු වැඩසටහනක් හරහා සිදුවී ඇත.

(d)ප්‍රධාන පාර්ශවකරුවන් විසින් වාර්තාකරණය සහ ලේඛනගත කිරීම මනා ලෙස පවත්වාගෙන යාම පිළිබඳ මාර්ගෝපදේශ තහවුරු කර නැති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම සහ සිවිල් සංවිධාන සඳහන් කරන ලදි. කෙසේ නමුත් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම වැනි ප්‍රධාන පාර්ශවකරුවන් අතර අදාළ සාකච්ඡා පැවැත්වෙමින් ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම තහවුරු කරන ලදි. වෙනත් රටවල්වල එවැනි මාර්ගෝපදේශ ගොඩනැගීම සම්බන්ධයෙන් නිදසුන් නැති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල් සනාථ කරන ලදි. රාජ්‍ය සේවය තුළ වාර්තා පවත්වා ගෙන යන්නේ කෙසේ ද යන්න පිළිබඳ පොදු රීති මලා 4 ක් පවතින නමුත් මේවා තොරතුරු දැනගැනීමේ අයිතිය හා අදාළ නොවේ.

(g) තවද රජය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වූ ඉල්ලුම් පත්‍රය තවමත් ගොඩනගා නැති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම සඳහන් කරන ලදි. එමෙන්ම මෙය අමාත්‍යාංශ සහ රාජ්‍ය සංස්ථා ඇතුළු සියලුම රාජ්‍ය ආයතනවල තොරතුරු එකතු කිරීමේ සහ ඒවා ඒකරාශී කිරීමේ අරමුණින් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය හරහා සිදුවිය යුත්තක් බව ද හඟවන ලදි.

(h) අමාත්‍යාංශ (මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය) විසින් විශ්ලේෂණ පද්ධතියක් ගොඩනගා නැති අතර තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම පැවසුවේ එය අමාත්‍යාංශ සැලැස්මේ ඇතුළත්ව ඇති බව සහ එය ඊළඟ වසර තුළ අවසන් කළ යුතු බවයි.

(i) ගැටුම්කාරී නීති සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඒවා තවදුර ඇගයීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ආයතන සංග්‍රහය ඉදිරිපත් කර ඇති අතර කැබිනට් අමාත්‍ය මණ්ඩල විසින් සංශෝධන සඳහා අනුමැතිය ලබාදුන් බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම අවධාරණය කරන ලදි. කෙසේ නමුත් රාජ්‍ය රහස් පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් සීමිත, සුළු ප්‍රගතියක් ලබා ගෙන ඇත.
22.4 සන්ධිස්ථානය : සිවිල් සංවිධානවලට අනුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් දක්නට ඇත. උදාහරණයක් ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සාර්ථකත්වයට පත් වූ කතාන්දර සහ හොඳ භාවිතයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් වාර්තාමය වීඩියෝපට නිර්මාණය කිරීමට පටන් ගෙන ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා නිර්මාණය කරන ලද රාජ්‍ය වෙබ් අඩවිය ඔස්සේ මෙම වීඩියෝපට වලට පිවිසිය හැක.
රජයට අයත් සිංහල සහ දෙමළ පුවත්පත් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සාර්ථකත්වයට පත් වූ කතාන්දර සහ සක්‍රිය සංවාදවල වැදගත්කම අවධාරණය කිරීම සඳහා මාසික අතිරේකයක් ප්‍රකාශයට පත් කර ඇති බව ට්‍රාන්පේරන්සි ඉන්ටර්නැෂනල් ජාත්‍යන්තර ආයතනයේ නියෝජිතයෙකු ද සඳහන් කළේ ය.

**එය විවෘත රාජ්‍යයක් ද?**
**තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : විශාල**

තොරතුරු ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව සහ විවෘත පාලනය තුළ විශාල වර්ධනයක් ඇති කිරීමට මෙම වගකීම දායක වී ඇත. විශේෂයෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති සම්පාදනය,තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීම කෙරෙහි රාජ්‍ය විවෘතභාවයෙහි සැලකිය යුතු ධනාත්මක ඉදිරි පියවරක් ලෙස සැලකිය හැක.

නීතිය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ කේන්ද්‍රය විසින් ප්‍රමිතිය ඇගයීම සඳහා කරන ලද තක්සේරුවේ දී තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ශ්‍රී ලංකාවේ වැඩපිළිවෙල කලාපයේ හොඳම සහ ලෝකයේ තුන්වන හොඳම වැඩපිළිවෙල බව හඳුනාගෙන ඇත. කෙසේවෙතත් නීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ප්‍රමාණවත් නොවූ අවධානය මෙම වගකීම සීමාකර ඇති අතර එය රටේ සියලුම දෑ සාමාන්‍යය පරිදි සිදුවන ආකාරයේ පරිවර්තනීය වෙනසක් සිදුකරනවාය යන්න නොසලකා හැර ඇත.

ක්‍රියාකාරී සැලැස්ම ආරම්භයේ දි මහජනතාවට තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව සහතික කරන නීති නොමැති කලාපයේ පිහිටා ඇති රටවල් අතර ශ්‍රී ලංකාව ද විය. තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීමට විවිධ ක්‍රියාකරුවන් විසින් ආරම්භ කරන ලද ව්‍යවස්ථා සහ නීති ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලවල් හරුණ කොට පිළිවෙලින් පැවත ආ රජයන් අප සතු ඇති සාධනීය ශක්තීන් සැලකිය යුතු ප්‍රතිඵලයකට පරිවර්තනය කිරීමට අපොහොසත් වී ඇත.

එමනිසා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති සම්පාදනය ශ්‍රී ලංකාව තුළ තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමට විශාල දායකත්වයක් ලබා දෙන අතරම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලබා ඇති සීමිත ප්‍රගතිය වේගය දුර්වල කිරීමට හේතු වී ඇත. ක්‍රියාත්මක කිරීම සඳහා රජය සාධනීය ලෙස සහභාගිත්ව ප්‍රවේශය යොදාගනු ලැබුවත් වැඩි අවධානය යොමුව ඇත්තේ පුහුණු මත බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නියෝජිතයෙකු සඳහන් කරන ලදි.

මෙම නියෝජිතයාට අනුව පුහුණුවෙන් පසු ක්‍රියාත්මක වීමට රජය සිතා සිටින බවක් පෙනෙන්නට තිබුණ නමුත් එය සිදුවූවාද යන්න සහතික වීමට පසුවිපරමක් සිදුවී නැත. තොරතුරු සඳහා ඇති අයිතියට ව්‍යවස්ථා අතිරේක ඇතුළත් කිරීමට බාධාවන පසුගාමී සංශෝධන පිළිබඳ සාකච්ඡා පවත්වන ආකාරයේ ස්වරූපය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු කරුණු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් අවධාරණය කරන ලදි.

මේ සියලු දේ තිබියදීත් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ක්‍රියාවලිය තුළ සැලකිය යුතු පුරවැසි සහභාගිත්වයක් ඇතිව ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම ඇතුළු සිවිල් සංවිධාන පාර්ශවකරුවන් තහවුරු කරන ලදි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමට අනුව 2018 අගෝස්තු මාසයේ දි පුරවැසියන් විසින් අභියාචනා 850 ක් කොමිසම වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් 650 ක් සඳහා අවසන් සහ අතුරු නියෝග ලැබී ඇත. මෙම නීත්‍යානුකූල සාධාරණ නියෝගයන්ට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවේශ විය හැක. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඇතැම් වෙබ් අඩවි අවහිර කිරීමට හේතු, ප්‍රසම්පාදන ක්‍රියාවලි,රාජ්‍ය ආයතනවල ඉහළ විධායක නිලධාරීන්ගේ වැටුප් , සංක්‍රමණික සේවකයන් හා සම්බන්ධ ද්වීපාර්ශවික ගිවිසුම් පිළිබඳ තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතා කරමින් නිකුත් කර ඇති තොරතුරුවල ඇතුළත්ව ඇත.

එබැවින් මෙම වගකීම සැලකිය යුතු මට්ටමකින් පාලනය විවෘත කර ඇති බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය තහවුරු කරන ලදි. තොරතුරු සඳහා ඇති අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා මීට පෙර ගත් උත්සාහයන් දේශපාලන ප්‍රසාදය නොමැතිවීම තුළ වළක්වා ඇති නමුත් රජය මේ සම්බන්ධයෙන් විශාල සහයෝගයක් ලබා දීමට කටයුතු කර ඇති බව එම ආයතනය සඳහන් කළේ ය.

**ඉදිරියට රැගෙන යා යුතු ද ?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කොට නොතිබුණි. කෙසේ නමුත් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වගකීම පුළුල් තීරණාත්මක ක්‍රියාකාරකම් රැසක් නියෝජනය කරන බැවින් මෙම වගකීම ඊළඟ ක්‍රියාකාරී සැලැස්ම වෙත රැගෙන යායුතු බව IRM පර්යේෂක නිර්දේශ කරයි.

මෙම වගකීම ශක්තිමත් කිරීමට සහ ක්‍රියාත්මක කිරීම තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා 2016 – 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක විසින් අතිරේක ක්‍රියාකාරකම් කිහිපයක් නිර්දේශ කරන අතර එයට ඇතුලත් තෝරාගත් නිර්දේශ කිහිපයක් පහත දැක්වේ :

- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය යාන්ත්‍රණයෙන් පිටස්තර ශූරයෙක් :ජ්පවසදබ* හඳුනාගැනීම සහ නම් කිරීම - සාමාන්‍ය පොදු ජනයා වෙනුවෙන් රාජ්‍ය විනිවිදභාවය ඇති කිරීම සඳහා සාමූහික අයිතියක් ලෙස නීතිය භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.
- තොරතුරු සඳහා අයිතිය පිළිබඳ ඇති සමාන්‍ය නිපුණත්වය, ගැටළු විසඳීම ඇගයීම සහ සම්මත නිල ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට උසස් පුහුණු සැසි පැවැත්වීම.
- රාජ්‍ය සහ රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන තීරණගන්නන් ඉලක්ක කරගනිමින් නව්‍යකරණය කරන ලද විශේෂ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සැලසුම් කිරීම සහ පැවැත්වීම.

වැඩිදුර විස්තර සහ සම්පූර්ණ නිර්දේශ ලැයිස්තුව සඳහා 2016ඞ 2017 IRM මධ්‍යකාලීන ප්‍රගති වාර්තාව බලන්න.

## 23. ඉල්ලා සිටීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම

වගකීමේ ආදර්ශ පාඨය

**ඉල්ලා සිටීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම**

[...]

**මූලික අරමුණ :**
තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ සංක්ෂිප්ත සහ යාවත්කාලීන කරන ලද තොරතුරු ඉල්ලා සිටීමට පෙර නිකුත් කර ඇති බව සහතික කිරීමට සහ ඒ තුළින් මහජනතාවට තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

**සන්ධිස්ථාන:**

- 23.1 මහජනතාවට ලබාගත හැකි ආකාරයට සෑම අමාත්‍යාංශයක්ම සහ මහජන ආයතනයක්ම ඉල්ලා සිටීමට පෙර තෙරතුරු නිකුත් කිරීම,වාර්ෂික ලියකියවිලි ලැයිස්තුව සෑම දෙනාටම දැකබලා ගත හැකි ආකාරයට ප්‍රසිද්ධ කිරීම සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතනේ 8(2) වගන්ති සහ 10 වන වගන්තිය යටතේ අවශ්‍ය තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමට වාර්තා කිරීම.
- 23.2 සෑම අමාත්‍යාංශයක්ම සහ රාජ්‍ය ආයතනයක්ම ඔවුන්ගේ අදාළ වෙබ් අඩවියේ දක්වා ඇති ආකාරයට එම තොරතුරු මහජනතාවට ලබාගත හැකි සේ ප්‍රසිද්ධ කිරීම සහ යාවත්කාලීන කිරීම.

**වගකිව යුතු ආයතනය** : මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

**උපකාරක ආයතනය** :තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය
ආරම්භක දිනය : 2017 පෙබරවාරි
අවසන් දිනය 2018 ජූනි

**සංස්කාරක සටහන** : ආකෘතිකරණය පහසුකිරීම සඳහා වගකීම පිළිබඳ ආදර්ශ පාඨය සංක්ෂිප්ත කර ඇත. වගකීම පිළිබඳ සම්පූර්ණ ආදර්ශ පාඨය සඳහා http://bit.ly/2wv3jXR යන වෙබ් අඩවිය ඔස්සේ 2016 - 2018 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙත පිවිසෙන්න.

**වගකීමේ අරමුණ :** තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ සංක්ෂිප්ත කළ විශේෂිත රාජ්‍ය තොරතුරු එම තොරතුරු ඉල්ලා සිටීමට පෙර රාජ්‍ය ආයතන විසින් හෙළිකරණ බවට සහ ප්‍රකාශයට පත් කරන බවට සහතික කිරීම. එවැනි දත්ත සහ ප්‍රතිපත්ති ලේඛන කාලෝචිතව මනා ලෙ හෙළිදරව් කිරීම ප්‍රතිපත්ති සහ තීරණ ගැනීමේ දී අර්ථවත් ලෙස සහභාගිවීමට අවශ්‍ය ප්‍රධාන තොරතුරු මහජනතාව ලබාගෙන ඇති බව සහතික කරනු ඇත.එවැනි තොරතුරු ඉල්ලා සිටීමට පෙර හෙළිදරව් කිරීම පුරවැසියන්ට එවැනි තොරතුරු සඳහා ඉල්ලීමේ අවශ්‍යතාව වළක්වනු ඇත.

| වගකීම පිළිබඳ දළ විශලේෂණය | විශේෂත්වය | | | | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වයේ අගයන්ට ඇති අදාලත්වය: ලියා ඇති ආකාරයට) | | | | ඇති විය හැකි බලපෑම | | | | සම්පූර්ණ කිරීම | | මධ්‍ය කාලසීමාවට / කාලය අවසන් වූ පසු | | එය විවෘත රාජ්‍යයක් ද? | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ක්‍රියාවක් නැත | අඩු | මධ්‍යම | ඉහළ | තොරතුරු සඳහා | පුරවැසි සහභාගිත්වය | රාජ්‍ය වගවීම | විනිවිදභාවය සහ වගවීම සඳහා තාක්ෂණය සහ | ක්‍රියාවක් නැත | සුළු | තරමක් | පරිවර්තනීය | ආරම්භකර නැත | සීමා සහිත | සැලකිය යුතු | සම්පූර්ණ කර ඇත | වඩාත් දුර්වල | වෙනසක් නැත | සුළු | ඉතා විශාල | කැපී පෙනෙන |
| 23ශ ඉල්ලා සිටීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම (මධ්‍ය කාලසීමාව) | | | | ✔ | ✔ | | | | | | ✔ | | | ✔ | | | | ✔ | | | |
| (කාලය අවසන් වූ පසු) | | | | | | | | | | | | | | ✔ | | | | | | | |

**තත්ත්වය**

**මධ්‍ය කාලසීමාව: සීමාසහිත**

ඉල්ලා සිටීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම සහ වාර්ෂික ලේඛන ලැයිස්තුව යාවත්කාලින කිරීම මධ්‍ය කාලසීමාව අවසන් වනවිට වගකීමට සම්පූර්ණ ලෙස අවසන් කර ගැනීමට නොහැකිවී ඇත ( 23.1 සන්ධිස්ථානය).

ඉල්ලා සිටීමට පෙර හෙලිදරව් කළ යුතු තොරතුරු ලේඛනයේ විස්තර ඇතුලත් ගැසට් නිවේදනයක් රජය නිකුත් කළ බව මුදල් හා ජනමාධ්‍ය අමාතාංශය සඳහන් කරන ලදි. අමාතාංශය විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයක මෙම ලැයිස්තුව නිර්දේශ කර ඇති අතර ඉල්ලා සිටීමට පෙර හෙළිදරව් කරන තොරතුරුවලට අදාළව තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ පනතේ ඇතුලත් විධිවිධාන පිළිපදින ලෙස සියලුම රාජ්‍ය ආයතනවලින් ඉල්ලා ඇත. සෑම රාජ්‍ය ආයතනයකම වාර්ෂික වාර්තාවල මෙම තොරතුරු වලින් බොහෝමයක් ඇතුලත් කරනු ඇතැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය පවසා ඇත.

තවද රාජ්‍ය ආයතන සුළු ප්‍රමාණයක් පමණක් ඉල්ලා සිටීමට පෙර ප්‍රධාන තොරතුරු තමන්ගේ වෙබ් අඩවි ඔස්සේ හෙළිදරව් කර ඇති බව මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු පැවසුවේය ( 23.2 සන්ධිස්ථානය). තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් මෙය තහවුරු කරන ලදි.

**කාලය අවසන් වූ පසු :සීමාසහිත**

කාල සිමාව අවසන්වනවිට මෙම වගකීමේ ක්‍රියාකාරකම් නිමා කිරීම අසම්පූර්ණව පැවතුණි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමට අනුව මෙම වගකීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් දක්නට තිබී නැත.

සන්ධිස්ථාන 23 .1 - 23 . 2 : 8, 9 සහ 10 වගන්ති යටතේ වූ නීති ප්‍රකාශයට පත් කර ඇති අතර ඉල්ලීමට පෙර හෙළිදරව් කළයුත්තේ කුමන තොරතුරු ද යන්න පිළිබඳ සියලුම රාජ්‍ය ආයතනවලට වෙන් වෙන් වශයෙන් මාර්ගෝපදේශ ලබා දීමට සිදුවූබව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම විසින් සඳහන් කරන ලදි. අමාත්‍යාංය විසින් චක්‍ර ලේඛයක් නිකුත් කිරීමෙන් එවැනි මාර්ගෝපදේශ ලබා දී ඇති නමුත් රාජ්‍ය ආයතන සුළු සංඛ්‍යාවක් එවැනි තොරතුරු ඉල්ලා සිටීමට පෙර හෙළිදරව් කර ඇත.
තවද මෙම සන්දර්භය තුළ ඇතැම් රාජ්‍ය ආයතන තමන්ගේ වෙබ් අඩවිවල ඇතුලත් කරමින් හිටි අඩියේ තොරතුරු ලබා දුන්නත් මෙය විධිමත්ම සහ ක්‍රමවත් අකාරයට සිදුවි නැති බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සඳහන් කරන ලදි.

**එය විවෘත රාජ්‍යයක් ද?**

**තොරතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව : වෙනසක් වී නැත**

**තො**රතුරු සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාවේ කැපී පෙනෙන වර්ධනයක් ඇති කරගැනීමට වගකීම දායක වී නැති බැවින් එය විවෘත පාලනයේ වෙනසක් ඇති කිරීමට මූලිකත්වයගෙන නැත.

**ඉදිරියට රැගෙන යායුතු ද?**

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ දෙවෙනි ක්‍රියාකාරී සැලැස්ම නිකුත් කර නොතිබුණි .
තොරතුරු දැනගැනීමේ පනතේ ඇති අනිවාර්ය ස්වභාවය ස්වභාවයෙන්ම මෙම වගකීම සම්පූර්ණ කිරීමට හේතු වි ඇති බව 2016- 2017 මධ්‍යකාලීන ප්‍රගති වාර්තාවේ IRM පර්යේෂක විසින් පිළිගනී. ඊට අමතරව අනෙකුත් ක්‍රමවේද භාවිතා කරමින් ඉල්ලීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීම සාක්ෂාත් කරගත හැකිව තිබුණ බව පර්යේෂක සඳහන් කරයි. මෙයට ප්‍රකාශන, සහ නිල ගැසට්, ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු,සහ ගුවන්විදුලි සහ රූපවාහිණී නිවේදන ඇතුළත්ය.
22 වන වගකීම යටතේ ලැයිස්තුගත කරන ලද ක්‍රියාකාරකම් අවසන් කිරීම ඉල්ලීමට පෙර තොරතුරු හෙළිදරව් කිරීමේ සාර්ථකත්වයට සැලකිවයුතු සහ උපනපූරක කාර්යාරයක් ඉටුකරන බව IRM පර්යේෂක පිළිගනී.

## ක්‍රමවේදය පිළිබඳ සටහන

අවසන් වාර්තාව පදනම් වී ඇත්තේ ලිපි ලේඛන ආශ්‍රිතව සිදුකරන ලද පර්යේෂණ සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා පදනම් කරගෙනය. රාජ්‍ය ස්වයං ඇගයීම් වාර්තා, සිවිල් සමාජ සංවිධාන, පුද්ගලික අංශය හෝ ජාත්‍යන්තර සංවිධාන විසින් නිකුත් කර ඇති ප්‍රගතිය පිළිබඳ ඇගයීම් සහ මීට පෙර IRM ප්‍රගති වාර්තාවේ තොරතුරු මත IRM වාර්තාව ගොඩනගා ඇත.

ශ්‍රී ලංකාවේ IRM පර්යේෂක විසින් මෙම වාර්තාව පිළිබඳ දැනුම් දීමට රාජ්‍ය සහ සිවිල් සංවිධාන නියෝජිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා 15 ක් පමණ පවත්වා ඇත. බොහෝ සම්මුඛ සාකච්ඡා සැලසුම් කරන ලද්දේ විද්‍යුත් තැපෑල හෝ දුරකතනය හරහා ය. තෝරා ගත් ඇතැම් රාජ්‍ය ආයතන සමඟ සම්මුඛ සාකච්ඡා ලබාගැනීමේ දි ජනාධිපති කාර්යාලය ද සහයෝගය ලබා දෙන ලදි. පුද්ගලිකව හමුවී හෝ දුරකථනයෙන් හෝ ස්කයිප් හරහා IRM පර්යේෂක මෙම සම්මුඛ සාකච්ඡා පවත්වා ඇත.

වගකීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූලික වශයෙන් කටයුතු කරන සෑම රාජ්‍ය ආයතනයකම අවම වශයෙන් එක් නියෝජිතයෙකු සමඟ හෝ සාකච්ඡා පැවැත්වීමට IRM පර්යේෂක උත්සාහ ගෙන ඇත. බැහැර කරන ලද ආයතන අතරට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය , මැතිවරණ කොමසාරිස්,අධ්‍යාපන අමාත්‍යාංශ්‍ය සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව ඇතුළත් වේ.මෙලෙස බැහැර කිරීමට සිදුවූයේ මෙම ආයතනවල අදාළ නියෝජිතයන් සමඟ සම්බන්ධවීමට IRM පර්යේෂක මෙන්ම ජනාධිපති කාර්යාලය ගත් බොහෝ උත්සාහයන් අසාර්ථක වීම හේතු කොට ගෙනය. සෑම වගකීමක් සඳහාම IRM පර්යේෂක එක හා සමාන සිවිල් සංවිධානවලින් අවම වශයෙන් එක් ප්‍රධාන ක්‍රියාකරුවකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ඇත.

අනොක් ද සොයිසා ආණ්ඩුකරණය, නීතිය සහ අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ වසර 8 කට වැඩි වෘත්තීය සහ අන්තර්ජාතික අත්දැකීම් සහිත ස්වාධින පර්යේෂකයෙකි. ඔහු සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ ආර්ථික විශ්ලේෂණය පිළිබඳ විශේෂ, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙකි. වොර්වික් විශ්වවද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධි අපේක්ෂකයෙකි. එමෙන්ම ඔහුට අන්තර් ජාතික සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධියක් ඇත. ස්වාධින වාර්තාකරණ යාන්ත්‍රණයේ ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂක ලෙස කටයුතු කිරීමට අමතරව ඔහු දැනට කාර්ගිල්ස් (සිලෝන්) ආයතනයේ පර්යේෂණ සහ හවුල්කාරිත්ව පිළිබඳ කළමනාකරු ලෙස කටයුතු කරයි.

විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම, පුරවැසියන් බලගැන්වීම,දූෂණයට එරෙහිව කටයුතු කිරීම, පාලනය ශක්තිමත් කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීම යන කාරණා සම්බන්ධයෙන් පුරවැසියන් කෙරේ රජයේ වගකීම සහතික කරන ජාත්‍යන්තර ස්වේච්ඡ වැඩපිළිවෙලක් ලෙස විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය හැඳින්විය හැක

Open Government Partnership